
# 2013

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report

SPMC

**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**
**அரச மருந்தாக்கற் பொருட்கள் உற்பத்திக் கூட்டுத்தாபனம்**
**State Pharmaceuticals Manufacturing Corporation of Sri Lanka**







## සමරු ඵලකයේ සටහන

අත්‍යවශ්‍ය ඖෂධ නිපදවීම සඳහා වූ මෙම ඖෂධ සංයෝග මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා - ජපාන මිත්‍රත්වයේ සංකේතයක් ලෙසින්
ජපන් රජය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත කරන ලද
පරිත්‍යාගයකි.
1987

## நுழைவாயிலில் இருக்கும் பதக்கப் பலகை

இம் முக்கியமான மருந்துகள் தயாரிக்கும் மருந்தாக்கல் கலவைகள் நிலையம் யப்பான்
நாட்டிற்கும் இலங்கை சனநாயக சோசலிசக் குடியரசிற்கும்
இடையே இருக்கும் நட்புறவு மற்றும் ஒருமைப்பாட்டின் அடையாளமாக
யப்பான் நாட்டினால்
இலங்கை சனநாயக சோசலிசக் குடியரசிற்கு வழங்கப்பட்ட நன்கொடையாகும்.
1987

## Plaque at the entrance

This Pharmaceuticals Formulation Centre for the essential drugs is an outright gift by the
Government of Japan to the Democratic Socialist Republic of Sri Lanka as a
token of friendship and co-operation between Japan & the
Democratic Socialist Republic of Sri Lanka.
1987

# වාර්ෂික වාර්තාව - 2013

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

# අපගේ සමාජ වගකීම

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව
සිය සමාජ වගකීම වටහාගනිමින් එය සාර්ථකව ඉටුකරනු ලබයි.

අති නවීන ජපන්, ජර්මානු හා කොරියානු යන්ත්‍රවලින් සමන්විත අති පිරිසිදු වාතාවරණයක් සහිත අපගේ ඖෂධ නිෂ්පාදනාගාරය.





## පාසල් ගොඩනැගිල්ලක් පරිත්‍යාග කිරීම

'අධ්‍යාපනය කවර තැනැත්තකුගේ වුවද සාර්ථකත්වයේ ප්‍රභවය වේය' යන සිය ආදර්ශ පාඨය පසක් කරමින්, සමාජයේ අඩු වරප්‍රසාද සහිත පාසල් දරුවන් පිළිබඳව අවධානය යොමු කොට සිය සාමාජීය වගකීම ඉටු කිරීමේ මෙහෙයට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව අවතීර්ණ විය. ඒ අනුව, අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධනයේ කොටසක් බවට පත් වෙමින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව 2013 වර්ෂයේ කළුතර හිරිගල්ගොඩැල්ල ප්‍රාථමික විද්‍යාලය සඳහා ආපන ශාලාවක්ද සහිත පාසල් ගොඩනැගිල්ලක් ඉදිකොට පරිත්‍යාග කළේය.

## පාසල් දරුවන්ට පාවහන් හා පාසල් පොත් පරිත්‍යාග කිරීම

අධ්‍යාපනය යමකු මෙහෙයවීමට පහසු එහෙත් හැසිරවීමට අපහසු, පාලනය කිරීමට පහසු එහෙත් වහල් බවට පත් කිරීමට අපහසු බවට පත් කරයි.''

- පීටර් බ්‍රෝහැම් -

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ආයතනික සාමාජීය වගකීම් කටයුතු ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා නාගරික ප්‍රදේශයන්ට ව්‍යාප්ත කරනු පිණිස අපගේ ක්‍රියාකාරකම් විශේෂයෙන් දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි පාසල් සමග බද්ධ කෙරේ. මැදවච්චියේ මැදවච්චිය මහා විද්‍යාලය, පොළොන්නරුවේ අත්තනකඩවෙල මහා විද්‍යාලය හා රත්මලානේ කඳවල විද්‍යාලය යන පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පාසල් අභ්‍යාස පොත්, පාසල් පුස්තකාල පොත් හා පාවහන් ලබා දීමට අපට හැකි විය.






### සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන - දෙහිඅත්තකණ්ඩිය

දෙහිඅත්තකණ්ඩිය රජයේ රෝහලෙහි රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදන සඳහා ප්‍රදර්ශන කුටියක් සංවිධානය කිරීම මගින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. මෙම ප්‍රදර්ශනය දින පහක් පුරා පැවති අතර, එහිදී ප්‍රධාන වශයෙන් පොදු සෞඛ්‍ය අධ්‍යාපන දැනුම නංවාලීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

### අපගේ තත්ත්ව පරීක්ෂාව

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ඖෂධ නිෂ්පාදනයට පෙර ආනයනික අමුද්‍රව්‍ය පරීක්ෂාව සහ නිෂ්පාදනයෙන් පසු නිමි ද්‍රව්‍ය පරීක්ෂාව නවීනතම උපාංග සහිත අපගේම පරීක්ෂණාගාරය මගින් පරීක්ෂා කරනු ලබයි.





### නිෂ්පාදිත ඖෂධ ඇසුරුම් කිරීම.

රාජ්‍ය ඖෂධ නිෂ්පදන සංස්ථාව නිෂ්පාදනය කල ඖෂධ නවීනතම ඇසුරුම් යන්ත්‍ර මගින් ආරක්ෂිතව අසුරා වෙළඳපලට නිකුත් කරනු ලබයි.

# පටුන


| | | |
|---|---|---|
| අපගේ දර්ශනය සහ මෙහෙවර | - | 06 |
| ආයතනික තොරතුරු | - | 07 |
| රා. ඖ . නි. සං පිහිටුවීම සහ මූලික අරමුණු | - | 08 |
| සභාපතිවරයාගේ සමාලෝචනය | - | 09 |
| අධ්‍යක්ෂවරු | - | 11 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | - | 14 |
| විගණන කමිටු වාර්තාව | - | 16 |
| ආයතනික පාලන වාර්තාව | - | 17 |
| අපගේ නිපැයුම් වර්ග | - | 18 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වාර්තාව | - | 19 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | - | 20 |
| ආදායම් ප්‍රකාශය | - | 21 |
| ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | - | 22 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | - | 23 |
| ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති | - | 25 |
| ගිණුම් පිළිබඳ සටහන් | - | 33 |
| විගණකාධිපති වාර්තාව | - | 47 |
| විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස් | - | 57 |
| ප්‍රස්ථාරාත්මක සමාලෝචනය | - | 60 |
| පසුගිය වසර 10 ක වැදගත් මූල්‍ය විස්තර | - | 63 |



# අපගේ දර්ශනය

ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති ඖෂධ නිමැවුම් නිෂ්පාදනය හා අලෙවිකරණය කරන දකුණු ආසියාවේ ඇති ආදර්ශමත් ආයතනයක් බවට පත්වීම

# අපගේ මෙහෙවර

දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල සඳහා වඩා ආරක්ෂිත ප්‍රත්‍යක්ෂ හා පහසු මිළකට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ඖෂධ නිෂ්පාදනය කිරීම

# ආයතනික තොරතුරු

**ආයතනයේ නාමය**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

**නෛතික තත්වය**

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1987 වසරේ දී පිහිටුවන ලදී.

**සංස්ථාපිත කළ දිනය**

1987 ජූනි මස 04

**ලියාපදිංචි කාර්යාලය**

අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත,
කඳවල වත්ත, රත්මලාන, ශ්‍රී ලංකාව.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

| | | |
|---|---|---|
| මහාචාර්ය එස්.ඩී. ජයරත්න | - | සභාපති |
| මහාචාර්ය රංජනී ගමගේ (2013.05.16 දක්වා) | - | අධ්‍යක්ෂ |
| වෛද්‍ය පී.ජී. මහීපාල | - | අධ්‍යක්ෂ |
| රොහාන් ධර්මතිලක (2013.05.16 දක්වා) | - | අධ්‍යක්ෂ |
| මර්වින් ගුණසේන (2013.05.16 දක්වා) | - | අධ්‍යක්ෂ |
| ලලිත් සේනානායක | - | අධ්‍යක්ෂ |
| එම්.ආර්.ආර්. අබේවික්‍රම | - | අධ්‍යක්ෂ |
| සිසිර ජිනේන්ද්‍ර පරණගම (2013.05.17 සිට) | - | අධ්‍යක්ෂ |
| නවරත්න බණ්ඩාර අලහකෝන් (2013.05.17 සිට) | - | අධ්‍යක්ෂ |
| මියුරු භාෂිත ලියනගේ (2013.05.17 සිට) | - | අධ්‍යක්ෂ |

**විගණකවරු**

විගණකාධිපති, ටොරින්ටන් චතුරස්‍රය, කොළඹ 07.

**බැංකු**

ලංකා බැංකුව

මහජන බැංකුව

ජාතික ඉතිරි කිරීමේ බැංකුව

**කළමනාකරණ කමිටුව**

| | | |
|---|---|---|
| එස්.ඩබ්. ජයසුන්දර | - | සාමාන්‍යාධිකාරිණී |
| කේ.ඩී.ඒ. කුරුප්පු | - | කළමනාකාර (තත්ව පාලන) |
| එම්.ඩී.ඒ.ආර්. ගුණරත්න | - | කළමනාකාර (ඉංජිනේරු) |
| එච්.කේ.එච්.එච්. පෙරේරා | - | කළමනාකාරිණී (මූල්‍ය) |
| එච්.එම්.එල්.එස්. දර්ශන | - | කළමනාකාර (සැලසුම් සහ ප්‍රසම්පාදන) |
| එස්.පී.ජයවීර | - | කළමනාකාර (නිෂ්පාදන) |
| එච්.එම්. රත්නායක | - | කළමනාකාරිණී (වට්ටෝරු සහ පර්යේෂණ හා සංවර්ධන) |
| එස්. ජයතිලක | - | සහකාර කළමනාකාර (ඉංජිනේරු) |
| ඒ. ජී. ද. එස්. අතුරුලිය | - | සහකාර කළමනාකාරිණී (මූල්‍ය) |
| වී. පී. මුතුකුඩ | - | සහකාර කළමනාකාර (නිෂ්පාදන) |
| වී. ජේ. බණ්ඩාරවත්ත | - | අභ්‍යන්තර විගණක |
| ආර්. ගුණරත්න | - | සහකාර කළමනාකාරිණී (මානව සම්පත්) |
| ඒ. සී. පී. ආනන්ද කුමාර | - | සහකාර කළමනාකාරිණී (සැලසුම් සහ ප්‍රසම්පාදන) |
| එච්. කේ. පී. ඒ. සේනාධීර | - | සහකාර කළමනාකාර (තත්ව පාලන) |
| අමිල නුවන් හේවාගම | - | සහකාර කළමනාකාර (නිෂ්පාදන) |
| එම්. ටී. පී. ඒ. කුලසේකර | - | සහකාර කළමනාකාරිණී (අලෙවි ප්‍රවර්ධණ) |
| ඩී. එච්. ජේ. ගුණවර්ධන | - | සහකාර කළමනාකාර (ඉංජිනේරු) |

**විගණන කමිටුව**

| | | |
|---|---|---|
| එම්. ආර්. ආර්. අබේවික්‍රම | - | සභාපති |
| ලලිත් සේනානායක | - | සාමාජික |
| මර්වින් ගුණසේන | - | සාමාජික (2013.07.11 දක්වා) |
| මියුරු භාෂිත ලියනගේ | - | සාමාජික (2013.07.12 සිට) |
| සිසිර ජිනේන්ද්‍ර පරණගම | - | සාමාජික (2013.07.12 සිට) |

## රා .ඖ.නි.සං පිහිටුවීම සහ මූලික අරමුණු

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 1957 අංක 49 දරණ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාපනය කර ඇත.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 2013 වර්ෂයේදී ශ්‍රී ලාංකාවේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය ඖෂධ වාණිජමය වශයෙන් නිෂ්පාදනය කිරීමෙහි 26 වසරක් සම්පූර්ණ කර ඇත. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා නිෂ්පාදන මාලාව පෙති සහ කරල් නිෂ්පාදන 63 කින් සමන්විත වේ. මෙයින් නිෂ්පාදන 40 ක් ක්‍රියාකාරී ලෙසම සංයෝජනය කරන ලද්දේ සමාලෝචිත වර්ෂය තුළදීය. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ශ්‍රී ලංකාවේ ඖෂධ නිෂ්පාදනයෙහි නියැලී සිටින එකම රාජ්‍ය සංස්ථාවයි.

**ප්‍රධාන ක්‍රියාකාරීත්වයන්**

(1) ඖෂධ නිෂ්පාදනය, සැකසීම, ගබඩා කිරීම, ඇසිරීම සහ නැවත ඇසිරීම

(2) ඖෂධ නිෂ්පාදනයට සහ සැකසීමට අවශ්‍ය තාක්ෂණික සහය සැපයීම

(3) ඖෂධ විද්‍යා සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ සහ ඖෂධ ප්‍රමිතිකරණය සහ

(4) නිෂ්පාදිත ඖෂධ අලෙවි කිරීම

වෙළඳපලට මුදා හරිනු ලබන සියලුම නිෂ්පාදන බ්‍රිතාන්‍ය ෆාමකෝපියා (BP) සහ එක්සත් ජනපද ෆාමකෝපියා (UPS) නියමයන්ට අමතරව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ (SPMC) අභ්‍යන්තර පිරිවිතරයන්ට ද අනුකූල වේ.

වත්මන් යහපත් නිෂ්පාදන පිළිවෙත් (CGMP) නියමයන් සහ කාර්යය පටිපාටි ක්‍රියාවේ යොදවන ආකාරය පිළිබඳව අභ්‍යන්තර ගුණාත්මකතා විගණනය සහ කම්හල් පිරික්සුම හරහා නිරීක්ෂණය සිදු කරනු ලැබේ.

# සභාපති/කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය



අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා විගණකාධිපති වාර්තාව ඇතුළත් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ද මා ඉදිරිපත් කරනුයේ ඉමහත් ප්‍රීතියෙනි.

1957 අංක 49 දරණ කාර්මික සංස්ථා පනත යටතේ 1987 වර්ෂයේදී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) පිහිටුවන ලද්දේ ජනතාව වෙනුවෙන් ගුණාත්මක, ක්‍රියාකාරී හා ආරක්ෂාකාරී ඖෂධ දැරිය හැකි මිලකට නිෂ්පාදනය කිරීමේ අැපැකැප වීම ඇතිව ය. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ශ්‍රී ලංකාවේ විශාලතම හා ප්‍රමුඛතම රාජ්‍ය ඖෂධ නිෂ්පාදකයාය.

දැනට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ඖෂධ නිෂ්පාදන පුළුල් පරාසයක් ආවරණය කරමින් ඖෂධ වර්ග 63 ක් ඒවායේ ඖෂධීය නාමවලින්ම නිෂ්පාදනය කරයි. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් නිෂ්පාදනය කෙරෙන සියලුම නිෂ්පාදන බ්‍රිතාන්‍ය ෆාමකෝපියා (BP) සහ එක්සත් ජනපද ෆාමකෝපියා (USP) නියමයන්ට අමතරව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පිරිවිතරයන්ට අනුව අවශ්‍ය ගුණාත්මකතාවයෙන් යුක්ත ය. වත්මන් යහපත් නිෂ්පාදන පිළිවෙත් (CGMP), රෙගුලාසි හා කාර්යපටිපාටි ක්‍රියාත්මක කිරීම පිළිබඳව අභ්‍යන්තර ගුණාත්මකතා විගණනය හා කම්හල් පරීක්ෂාව හරහා නිති නිරීක්ෂණය කරනු ලැබේ.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනාගාරය නවීන ජපන්, ජර්මානු හා කොරියානු යන්ත්‍රවලින් සන්නද්ධව තිබේ. නිෂ්පාදනාගාරයෙහි අති පිරිසිදු වාතාවරණයක් තිබෙන අතර, එය ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) හා වත්මන් යහපත් නිෂ්පාදන පිළිවෙත්වල (cGMP) නියමයන් සමීපව පිළිපදී.


රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා නිපැයුම් සෞඛ්‍ය අංශය තුළ වෛද්‍යවරුන්, ඖෂධවේදීන් හා වෙනත් වෘත්තීයවේදීන් විසින් අගය කරනු ලබන අතර ඔවුහු ඒවාට වැඩි රුචිකත්වයක් දක්වති. ගුණාත්මක ඖෂධ නිපැයුම් නිෂ්පාදකයකු වශයෙන් අපගේ කීර්තිය අපගේ සාර්ථකත්වයේ පදනමයි.


### කාර්යසාධනය


රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 2013 වර්ෂයේදී ඉතා විශිෂ්ට මෙහෙයුම් ප්‍රතිඵල වාර්තා කර තිබේ.

2012 වර්ෂයේදී අත්කර ගත් රුපියල් මිලියන 85 ට සාපේක්ෂව, 2013 වර්ෂය සඳහා වූ මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 304 ක් වූ අතර එය 257 % ක වර්ධනයක් විය.

2012 වර්ෂයේ රුපියල් මිලියන 98 ට සාපේක්ෂව 2013 වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය රුපියල් මිලියන 209 දක්වා 113%කින් වර්ධනය විය.






### නිෂ්පාදන ප්‍රමාණය

2013 වර්ෂය සඳහා වූ මුළු නිෂ්පාදනය පෙති/කරල් ඒකක මිලියන 2003 ක් වූ අතර මෙය සංස්ථාව ආරම්භ කළ පසුව වාර්තාගත ඉහළම ප්‍රතිදානය (නිමැවුම) වෙයි.




### පිරිවැටුම

2013 වර්ෂයේ මුළු පිරිවැටුම රුපියල් මිලියන 1941 ක් වූ අතර මෙය සංස්ථාව ආරම්භ කළ පසුව වාර්තාගත ඉහළම නිමැවුම වෙයි. සමස්ත අලෙවියෙන් සියයට 72.75 ක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය (MSD) වෙත සපයනු ලැබූ අතර, ඉතිරිය රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට හා අපගේ බෙදාහරින්නන් හරහා සිදු කරන ලදී.




රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මහා භාණ්ඩාගාරයේ සහාය නොමැතිව ස්වකීය සම්පත් පමණක් භාවිතා කරමින් ලාභ උපයන සේ මනා ලෙස කළමනාකරණය කරන ලද බව දැනුම් දෙන්නේ සතුටිනි. සැබැවින්ම, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව රාජ්‍ය සංස්ථාවක් වශයෙන් සිය වගකීම ඉටු කරමින්, 2013 වර්ෂය තුළ මහා භාණ්ඩාගාරය වෙත දායකත්වයක් වශයෙන් රුපියල් මිලියන 20 ක් (රු. 20,000,000.00) ගෙවා ඇත.

## සංවර්ධන කටයුතු

### කම්හල් සංවර්ධනය

නිෂ්පාදන පරිමාව වැඩි කරනු පිණිස ඇසුරුම් මාර්ග යට නව පෙති සෑදීමේ යන්ත්‍රයක් එක්කර තිබේ. නවීන තාක්ෂණය සමගින් කම්හල ද නවීකරණය කරන ලද අතර, තාක්ෂණිකඥයින්ට නූතන පරිසරයක කාර්ය සිදු කළ හැකි වන සේ ප්‍රමාණවත් රැකියා පුහුණුවක් ලබා දෙනු ලැබී ය.

### පරිශ්‍ර සංවර්ධනය

මෙම වර්ෂය තුළ පරිපාලන කාර්ය සඳහා වූ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරන ලදී.

### පුළුල් කිරීමේ ව්‍යාපෘතිය

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සිය කම්හල පුළුල් කිරීම සඳහා ජයිකා අරමුදලෙන් ණය ලබා ගෙන ඇති අතර, එම කටයුතු 2017 වර්ෂයේදී සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. මෙම යෝජිත පුළුල් කිරීමත් සමගම, අපේක්ෂිත ප්‍රතිදානය වර්ෂයකට පෙති හා කරල් ඒකක මිලියන 3,500 කට වැඩි වනු ඇත.

මෙම පුළුල් කිරීමේ වැඩසටහන යටතේ නව යන්ත්‍ර මිලට ගැනීමටත්, දැනට ඇති ගොඩනැගිලි නවීකරණය කිරීමටත්, අමුද්‍රව්‍ය හා නිමි භාණ්ඩ ගබඩා කර තැබීම සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමටත් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව අපේක්ෂා කරයි.

### ගුණාත්මකතා වර්ධනය

නිෂ්පාදනය වේගවත් කිරීමට උරදෙනු පිණිස, 2013 වර්ෂය තුළ තත්ත්ව පාලන අංශය තුළ නව මෙට්‍රෝම් 915 කාල්ෆිෂර් තෙතමන මාපකයක් ස්ථාපනය කරන ලදී.

### පර්යේෂණය හා සංවර්ධනය

2013 වර්ෂය තුළ නිපැයුම් දෙකක් සඳහා සංයෝජන අනුමැතිය ලබා දෙනු ලැබූ අතර, නිපැයුම් තුනක් සඳහා නිෂ්පාදන බලපත්‍ර ලැබුණි. එයට අමතරව, මෙම වර්ෂය තුළ නව නිෂ්පාදනයක් වශයෙන් ස්පයිරෝනෝලැක්ටෝන් යූ.එස්.පී. මිලිග්‍රෑම් 25 පෙති සාර්ථකව වෙළඳපළට නිකුත් කරන ලදී.

### මානව හිමිකම් සංවර්ධනය සහ සුභසාධනය

සේවා මුර දෙකක කාර්යක්ෂම හා සුමට ක්‍රියාකාරිත්වය සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ මග පෙන්වීම යටතේ රැකියාගත පුහුණුවේ නිරත පුහුණුලාභීන් 20 දෙනකුද ඇතුළුව 2013.12.31 දිනට සිටි සේවක සංඛ්‍යාව 234 ක් විය. දේශීය ආයතනයන් විසින් පවත්වනු ලැබූ වැඩසටහන් කීපයක් හරහා සේවකයින් 105 දෙනකුට පුහුණුව ලබා දෙනු ලැබූ අතර, 11 දෙනකු විදේශයන්හිදී පුහුණු කරන ලදී.

සේවකයින් ඉල්ලා සිටි සියලුම සුභසාධක පහසුකම් ලබා දීම රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව අඛණ්ඩව සිදු කර ඇත. එමෙන්ම සේවකයින්ට වාර්ෂික විනෝද චාරිකාව/සුහද හමුව, සිංහල හා හින්දු අළුත් අවුරුදු උළෙල සහ ක්‍රීඩා උත්සවය සඳහා සහභාගී වීමට දිරිගැන්වීම සිදු කරන ලදී.

### උපාය මාර්ග හා ඉදිරි අපේක්ෂා

අපගේ ප්‍රධාන අරමුණ වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය (MSD), රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථා (SPC) ඔසුසල් හා වෛද්‍ය වෘත්තීයවේදීන් වෙත අවශ්‍ය ඖෂධ අඛණ්ඩව සැපයීමයි. මෙම ක්‍රියාවලිය සඳහා පහසුකම් සලස්වනු පිණිස අපි දැනටමත් නිෂ්පාදන අංශය, ගබඩා කිරීමේ ප්‍රදේශය හා පරිපාලන අංශය සඳහා ගොඩනැගිලි පහසුකම් පුළුල් කර ඇත්තෙමු. සියලු අංගෝපාංග සහිත පරීක්ෂණාගාර අවකාශය ව්‍යාප්ත කිරීම මගින් ශ්‍රී ලංකාවේ නැති බැරි ජනතාවට දැරිය හැකි මිලකට උසස් තත්ත්වයේ ඖෂධ සැපයීම සහතික කෙරෙනු ඇත.

එම පුළුල් කිරීම අපට නිෂ්පාදනය දියුණු කිරීමටත්, අලෙවි ආදායම වැඩි කොට, නිෂ්පාදන මාලාව පුළුල් කොට නව රැකියා අවස්ථා ඇති කිරීමටත්, තාක්ෂණික දැනුම දියුණු කිරීමටත්, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි ව්‍යාපාරික කීර්තිනාමය ආරක්ෂා කිරීමටත් උපකාරී වෙයි.

### තුති පළ කිරීම

ශ්‍රී ලංකාවේ ඖෂධ කර්මාන්තයන්හි ප්‍රගමණය කෙරෙහි සිය අඛණ්ඩ කැපවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිඳුන්ට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මාගේ අවංක ස්තුතිය පුද කර සිටිමි. එමෙන්ම, අප වෙත ලබා දුන් අගනා සහයෝගය හා මග පෙන්වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත් මාගේ ප්‍රශංසාව පළ කර සිටිමි. එමෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය නිහාල් ජයතිලක මහතා විසින් ලබා දෙන ලද මගපෙන්වීම සහ අනෙකුත් නිලධාරින්ගෙන් ලද සහයෝගය අපි ඉමහත් සේ අගය කරමු.

තවද, මහා භාණ්ඩාගාරයේ විවිධ දෙපාර්තමේන්තුවල නිලධාරීන් විසින් දෙන ලද දායකත්වය අපි අගය කර සිටිමු.

අපගේ ක්‍රියාකාරකම්වල සාර්ථකත්වය සඳහා විශාල වශයෙන් දායක වූ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC) හා වෛද්‍ය සැපයුම් අංශය (MSD), ඔසුසල් හා වෛද්‍ය වෘත්තීයවේදීන් සමග අප විශිෂ්ට සබඳතාවයක් පවත්වා ගත් බව කෘතඥතා පූර්වකව සටහන් කරන්නේ ඉමහත් සතුටකිනි.

2013 වර්ෂය තුළ සාධනීය ප්‍රතිඵල අත්කර ගැනීමෙහිලා සාමාන්‍යාධිකාරීතුමිය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරුන්, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ විධායක කාර්ය මණ්ඩලය සහ සියලු මට්ටම්වල සේවකයින් විසින් දක්වන ලද ඇපකැප වීමද ඉමහත් සේ අගය කරමු.

අවසන් වශයෙන්, සංස්ථාව සාර්ථකත්වය කරා මෙහෙයවීමේදී ලබා දුන් අගනා දායකත්වය හා මග පෙන්වීම සම්බන්ධයෙන් මම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ ස්තුතිය පළ කර සිටිමි.

**මහාචාර්ය එස්.ඩී. ජයරත්න**
**සභාපති**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**
**2013 පෙබරවාරි 14 වන දිනදී ය.**

# අධ්‍යක්ෂවරු

## මහාචාර්ය එස්.ඩී. ජයරත්න - සභාපති

මහචාර්ය එස්.ඩී. ජයරත්න ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයට අනුයුක්ත මහාචාර්යවරයෙකි. කොළඹ දකුණු ශික්ෂණ රෝහලේ ගෞරව උපදේශන වෛද්‍යවරයෙකු වන ඔහු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපතිවරයාද වේ.

ඔහු F.R.C.P. (ලන්ඩන්), M.D. (ශ්‍රී ලංකා), M.R.C.P. (ඒ.රා.), M.B.B.S. (ලංකා) උපාධිධාරියෙකු වන අතර ශ්‍රී ලංකා පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනය විසින් සාමාන්‍ය වෛද්‍ය උපාධි ආයතනය විසින් වෛද්‍ය විශේෂඥයෙකු ලෙස පිළිගෙන ඇත.

ලංකා වෛද්‍ය කවුන්සිලයේ සාමාජිකයෙකු ද වන ඒ මහතා (ලි.ප. අංක 6319), එක්සත් රාජධානියේ පොදු වෛද්‍ය කවුන්සිලයේ පූර්ණ ලියාපදිංචිය ලබා ඇති අයෙකු වන අතර, ලංකා වෛද්‍ය අභ්‍යාස විද්‍යාලයේ යාවජීව සාමාජිකයෙකු හා ශ්‍රී ලංකා ජෛව අන්ත්‍ර ද්වාරනමය හා ශරීර අභ්‍යන්තර පරික්සුම් සමාජයේ සාමාජිකත්වය ද උසුලයි.

## මහාචාර්ය රංජනී ගමගේ - අධ්‍යක්ෂ (2013.05.16 දක්වා)

කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය මාහාචාර්යවරියක හා ශ්‍රී ලංකා ජාතික රෝහලේ උපදේශක ස්නායු වෛද්‍යවරියක් ලෙස මහාචාර්ය රංජනී ගමගේ සේවය කරයි.

F.R.C.P, M.R.C.P (එ.රා.), M.D. (ශ්‍රී ලංකා) සහ M.B.B.S (ලංකා)උපාධි දරා සිටින ඇය කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ බාහිර මහාචාර්යවරියක ලෙසත් රාගම ශික්ෂණ රෝහලේ ස්නායු ශල්‍ය වෛද්‍යවරියක ලෙස ද රාජකාරි වල නිරතව සිටින්නීය.

## වෛද්‍ය පී.ජී. මහීපාල - අධ්‍යක්ෂ

වෛද්‍ය පී.ජී. මහීපාල මහතා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ. F.C.M.A, D.B.S, කළමනාකරණ ඩිප්ලෝමා D.D.M, D.E.D, M.B.A, M.D, විද්‍යාවේදී හා M.B.B.S (ලංකා) යන සුදුසුකම් වලින් හෙබි අයෙකි.

1995 දී මාතර දිස්ත්‍රික්කයේ මොරවක වෛද්‍ය අධිකාරී ලෙසද, 1992 දී මාතර මූලික රෝහලේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී ලෙසද, 1995 වසරේ දී ගාලු දිස්ත්‍රික්කයේ වෛද්‍ය අධිකාරී (මාතෘ හා ළමා සෞඛ්‍ය) 1995 - 96 තෙක් හම්බන්තොට ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයේ ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක, 1997-98 තෙක් කොළඹ උතුරු ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ, 1998 දී සෞඛ්‍ය අමාත්‍යාංශයේ භූමි ප්‍රදේශ සේවා අධ්‍යක්ෂ, 1998 සිට 2003 තෙක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සේවා වැඩ බලන අධක්‍ෂක ලෙසත්. 2004 දී සෞඛ්‍ය අමාත්‍යාංශයේ මානසික සෞඛ්‍ය කටයුතු පිළිබඳ වැඩ බලන අධ්‍යක්ෂ සහ 2006 සිට 2010 දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා) ලෙසද 2010 සිට 2012 දක්වා වෛද්‍ය සේවා අංශයේ අතිරේක ලේකම්වරයා වශයෙන් ද කටයුතු කර ඇත.

### එස්.එම්.එන්. ලලිත් සේනානායක - අධ්‍යක්ෂ

ලලිත් සේනානායක මහතා වෘත්තියෙන් වරලත් ගණකාධිකාරීවරයෙකි. ඔහු දැනට ටියුඩර් වී. පෙරේරා වරලත් ගණකාධිකාරී සමාගමේ ජ්‍යෙෂ්ඨ කොටස්කරුවෙකු ලෙසත්, සීමාසහිත ෆිනෑන්සියල් කන්සල්ටන්ට්ස් ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (පුද්.) සමාගමේ අධ්‍යක්ෂ ලෙසත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ ලෙස සහ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ අධ්‍යක්ෂ ලෙසත් කටයුතු කර ඇත.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ අධිශිෂ්‍යත්ව සාමාජිකත්වය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී (රාජ්‍ය පරිපාලන) විශේෂ උපාධි සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව ලබා ඇත්තෙකි.

රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්ෂ, සීමාසහිත ලංකා පොහොර සමාග මේ අධ්‍යක්ෂ හා වී අලෙවි මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කර ඇත.

### මර්වින් ගුණසේන - අධ්‍යක්ෂ (2013.05.16 දක්වා)

මර්වින් ගුණසේන මහතා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ගරු සෞඛ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම් ධූරය දරයි.

ඔහු එල්.එල්.බී. (නීතිවේදී උපාධිය) උපාධිධාරියෙකු, නීතිවේදියෙකු හා ශාස්ත්‍රපති (සාමජ විද්‍යා) විභාගයට පෙනී සිට ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටී.

කෘෂිකර්ම හා ගොවි ජන රක්ෂණ මණ්ඩලයේ සභාපති, මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, සමාජ ආරක්ෂණ මණ්ඩලයේ නියෝජ්‍ය කළමනාකරු (මෙහෙයුම්), මධ්‍යම ඉංජිනේරුමය උපදේශන කාර්යාංශයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ හා කොළඹ / මාතර නීති වේදියෙක් ලෙස කටයුතු කර ඇත.

### එම්.ආර්.ආර්. අබේවික්‍රම - අධ්‍යක්ෂ

එම්. ආර්. ආර්. අබේවික්‍රම මහත්මිය මේ වන විට මුදල් අමාත්‍යාංශයේ ජාතික ආදායම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ධූරය හොබවයි.

1994 වර්යේ දී ශ්‍රී ලංකා සැලසුම් සේවයට සම්බන්ධ වී ඇත. ඇය 1994 සිට 2013 දක්වා සහකාර අධ්‍යක්ෂිකා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා වශයෙන් මුදල් අමාත්‍යාංශයේ ජාතික සැලසුම් සහ පිස්කල් ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව වැනි දෙපාර්තමේන්තු වල තනතුරු හොබවා ඇත. එසේම මහා භාණ්ඩාග ාරයේ සෞඛ්‍ය මූල්‍ය හා සැලසුම් සම්බන්ධයෙන් මනා පලපුරුද්දක් ඇත.

ඇය සෞඛ්‍ය ආර්ථික සහ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් එක්සත් රාජධානියේ පශ්චාත් උපාධිය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීතිවේදී උපාධිය සහ කොළඹ විශ්ව විද්‍යාලයේ වානිජවේදී ගෞරව උපාධිය ලබා ඇත.

එසේම ඇය දැනට විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ අධ්‍යක්ෂිකා, ආයුර්වේද වෛද්‍ය කවුන්සිලයේ අධ්‍යක්ෂිකා සහ දේශීය වෛද්‍ය ආයතනයේ අධ්‍යක්ෂිකාවක් ලෙස කටයුතු කරයි.

**සිසිර ජිනේන්ද්‍ර පරණගම - අධ්‍යක්ෂ (2013.05.17 සිට)**

සිසිර ජිනේන්ද්‍ර පරණගම මහතා දැනට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධක්ෂ මණ්ඩලය නියෝජනය කරනු ලබයි.

ඔහු අලෙවිකරණය පිළිබඳ උපාධිධාරියෙක් වන අතර දැනට නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ උප සභාපති, අධ්‍යක්ෂ ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල, සාමාජික ශ්‍රි ලංකා කළමණාකරන කවුන්සිලය සහ බස්නායක නිලමේ මහ සමන් දේවාලය බලංගොඩ යන ආයතන වල තනතුරු හොබවනු ලැබේ.

**නවරත්න බණ්ඩාර අලහකෝන් - අධ්‍යක්‍ෂ (2013.05.17 සිට)**

නවරත්න බණ්ඩාර මහතා වෘත්තියෙන් විශ්‍රාමික බැංකු කළමණාකරුවෙකි. ඔහු දැනට පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ පොළොන්නරුව දිස්ත්‍රික් වීක්‍ෂණ (නිරීක්‍ෂණ) කමිටුවේ සභාපති වශයෙන් සහ සමූපාකාර සංවර්ධන අමාත්‍යාංශයේ පොළොන්නරුව දිස්ත්‍රික් ප්‍රාදේශීය සංවර්ධන බැංකු සංගමයේ අධ්‍යක්‍ෂ වශයෙන් ද කටයුතු කරයි.

ඔහු ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිය සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ව්‍යවසායකත්ව ඩිප්ලෝමාධාරියෙකි. එසේම 1973 සිට 2007 දක්වා අවුරුදු 34 ක් ලංකා බැංකුවේ විවිධ තනතුරු හොබවා ඇති අතර ඉන්දියානු බැංකුවේ අධීක්‍ෂණය යටතේ ප්‍රාදේශීය දිළිඳුකම තුරන් කිරීම සම්බන්ධයෙන් පුහුණු වැඩමුළුකටද සහභාගී වී ඇත. එමෙන්ම මහාපරිමාන ව්‍යාපාර වල ව්‍යාපාර සංවර්ධනය, විකුණුම් ප්‍රවර්ධන ණය වැඩසටහන් සම්බන්ධව ලංකා බැංකුව මගින් සංවිධානය කල දේශීය / විදේශීය විශේෂ පුහුණු වැඩසටහනකට ද සහභාගී වී ඇත.

1973 බැංකු සේවයට බැඳී ඇති ඔහු විශ්‍රාමික බැංකු කළමනාකරුවෙකු මෙන්ම, 1983 දී පොළොන්නරුව සමූපකාර සමිතියේ සභාපති, 2005-2007 කාලයේ දී සීමාසහිත රජරට බස් සංගමයේ සභාපතිවරයා ලෙසද, 2006-2007 තෙක් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති සීමාසහිත මහවැලි ඉංජිනේරු සමාගමේ අධ්‍යක්‍ෂවරයෙක් ලෙසද, 2007-2008 කාලයේ කෘෂිකර්ම හා කෘෂිකර්ම සේවා අමාත්‍යාංශය යටතේ ඇති කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්‍ෂවරයෙක් ලෙසද, 2007-2008 කාලයේ කෘෂිකර්ම සේවා අමාත්‍යාංශය යටතේ ඇති සිමාසහිත තමන්කඩුව පොහොර සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්‍ෂ ලෙසද 2008-2010 කාලයේදී එම අමාත්‍යාංශය යටතේ ම ඇති සීමාසහිත සිලොන් පොහොර සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්‍ෂ ලෙසද කටයුතු කර ඇත.

**මියුරු භාෂිත ලියනගේ - අධ්‍යක්ෂ (2013.05.17 සිට)**

මියුරු භාෂිත ලියනගේ මහතා දැනට ගරු සෞඛ්‍ය අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සම්බන්ධීකරණ ලේකම් වශයෙන් කටයුතු කරන අතර සරස සමූහ ව්‍යාපාරයේ සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ, උපදේශක ලේඛන කලාව සහ පොලිස් හා මහජන සම්බන්ධතා (භාහිර) උපදේශකවරයෙක් වශයෙන් ද කටයුතු කරයි.

ඔහු ජනසංනිවේදනය පිළිබඳ විශේෂ උපාධිධාරියෙක් වේ. එසේම බෙල්වුඩ් ආයතනයේ සෞන්දර්ය කලා ඩිප්ලෝමාව, ජාතික ව්‍යාපාර කළමණාකරණ ආයතනයේ ව්‍යාපාර කළමණාකරන ඩිප්ලෝමාව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ග්‍රන්ථ කර්තෘ හා ජනසංනිවේදනය පිළිබඳ ඩිප්ලෝමාව 2012 වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලයේ පුවත්පත් කළාවේදී ඩිප්ලෝමාව සහ විවෘත විශ්ව විද්‍යාලයේ ග්‍රන්ථ කර්තෘ හා ජනසංනිවේදනය පිළිබඳ සහතික පත්‍ර හිමි අයෙකි.එසේම දැනට කොළඹ විශ්වවිද්‍යාලයේ ලේඛන කලාව පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමා උපාධිය සහ ජන සංනිවේදන පශ්චාත් උපාධිය හදාරනු ලබයි.

එසේම ඔහු පුවත්පත් කලාවේදියෙක් හා විවිධ වැඩසටහන් ඉදිරිපත් කරන්නෙක් වශයෙන් රූපවාහිනි සහ ගුවන් විදුලියේ සේවය කර ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂවරුන් සිය වාර්තාව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණිත ගිණුම් ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. ගිණුම් වාර්තා පිටු 20-46 දක්වා ඇත.

### ප්‍රධාන කාර්යයන්

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ,

- ඖෂධ නිෂ්පාදනය, සැකසීම, ගබඩා කිරීම, ඇසිරීම සහ නැවත ඇසිරීම
- ඖෂධ නිෂ්පාදනයට සහ සැකසීමට අවශ්‍ය ශිල්පීය සහය සැලසීම
- ඖෂධ විද්‍යා සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ සහ ඖෂධ ප්‍රමිතිකරණය සහ
- නිෂ්පාදිත ඖෂධ අළෙවි කිරීම

අදාල වර්ෂය තුළදී සංස්ථාවේ මූලික කාර්යයන් සම්බන්ධයෙන් සැලකිය යුතු වෙනස් වීමක් සිදුවී නොමැත.

### ව්‍යාපාර සමාලෝචනය

2013 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ කාර්යයන් හි තත්වය පිළිබඳ තොරතුරු අඩංගු ශේෂ පත්‍රය 20 පිටුවේ දක්වා ඇත. අදාල මූල්‍ය වර්ෂයේ සංස්ථාවේ තක්සේරුව පිළිබඳව සභාපතිතුමාගේ සමාලෝචනයෙහි පිටු 9 සිට 10 දක්වා ඇත.

### පිරිවැටුම සහ ප්‍රතිඵල

2013 වර්ෂයේ පිරිවැටුම සහ ප්‍රථිඵල ඇතුලත් ආදායම් ප්‍රකාශය හා ස්කන්ධ ප්‍රාග්ධනය වෙන්ස් වීම පිළිබඳ ප්‍රකාශය පිළිවෙලින් 21 සහ 22 පිටු වල දක්වා ඇත.

### අනාගත සංවර්ධන කාර්යයන්

ව්‍යාපාරයේ අනාගත සංවර්ධනය පිළිබඳව සභාපතිතුමාගේ සමාලෝචනයෙහි පිටු අංක 9 සහ 10 හි දක්වා ඇත.

### පරිත්‍යාග

අදාල වර්ෂය තුල සංස්ථාව විසින් පරිත්‍යාග කිසිවක් ලබා දී නොමැත .

### දේපළ, පිරියත සහ උපකරණ

අදාල වර්ෂය තුළ ව්‍යාපාරයේ දේපළ , පිරියත සහ උපකරණ ඇතුලත් වාර්තා 33 පිටුවේ මූල්‍ය ප්‍රකාශයෙහි 01 වන සටහන මගින් දක්වා ඇත.

### ලාභාංශ / දායකත්වය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලාභාංශ ලෙස රු මිලියන 20 ක දායකත්වයක් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට ගෙවා ඇත.

### සංචිත

මුළු සංචිත ප්‍රමාණය හා ඒවායේ සංයෝජනය ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය මගින් 22 පිටුවෙහි දක්වා ඇත.

### ප්‍රධාන කොටස් හිමියන්

ශ්‍රී ලංකා රජය ප්‍රධාන කොටස්කරු ලෙස ක්‍රියා කරයි

### අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ. එක් අධ්‍යක්ෂවරයෙක් මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක් වන අතර අනෙක් අධ්‍යක්ෂවරයා සෞඛ්‍ය අමාත්‍යාංශය නියෝජනය කරයි.

### නව අධ්‍යක්ෂ මණ්ඩලය

නව අධ්‍යක්ෂ මණ්ඩලය 2013 වර්ෂයේ මැයි මස පත් කරන ලදි.

අදාළ කාලපරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පැවැත්වුන අතර අදාල කාලපරිච්ඡේදය සඳහා සංස්ථාවේ කටයුතු සම්බන්ධ වගකීම සභාපතිවරයා හා අධක්ෂක මණ්ඩලය විසින් දරනු ඇත.

| | | |
|---|---|---|
| මහාචාර්ය එස්.ඩී.ජයරත්න | - | සභාපති |
| වෛද්‍ය පී.ජී.මහීපාල | - | අධ්‍යක්ෂ - සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිත |
| ලලිත් සේනානායක | - | අධ්‍යක්ෂ |
| එම්.ආර්.ආර්. අබේවික්‍රම | - | අධ්‍යක්ෂ - මුදල් අමාත්‍යාංශයේ නියෝජිත |
| සිසිර පිනේන්ද්‍ර පරණගම (2013.05.17 සිට) | - | අධ්‍යක්ෂ |
| නවරත්න බණ්ඩාර අලහකෝන් (2013.05.17 සිට) | - | අධ්‍යක්ෂ |
| මියුරු භාෂිත ලියනගේ (2013.05.17 සිට) | - | අධ්‍යක්ෂ |

**පසුගිය අධ්‍යක්ෂ මණ්ඩලය**

| | | |
|---|---|---|
| මහාචාර්ය එස්.ඩී. ජයරත්න | - | සභාපති |
| මහාචාර්ය රංජනි ගමගේ (2013.05.16 දක්වා) | - | අධ්‍යක්ෂ |
| වෛද්‍ය පී. ජී. මහීපාල | - | අධ්‍යක්ෂ - සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිත |
| රොහාන් ධර්මතිලක (2013.05.16 දක්වා) | - | අධ්‍යක්ෂ |
| මර්වින් ගුණසේන | - | අධ්‍යක්ෂ |
| ලලිත් සේනානායක | - | අධ්‍යක්ෂ |
| එම්.ආර්.ආර්. අබේවික්‍රම | - | අධ්‍යක්ෂ - මුදල් අමාත්‍යාංශයේ නියෝජිත |

## ගිණුම් ප්‍රතිපත්ති

සංස්ථාව උපයෝගී කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 25 සිට 32 දක්වා පිටුවල ඇත.

## පරිසර සංරක්ෂණය

සිය ක්‍රියාකාරීත්වය තුළින් පරිසරයට අහිතකර ප්‍රතිඵලයක් ඇති නොවන පරිදි කටයුතු කිරීම සහ ඉහළම ගුණාත්මක භාවයෙන් යුතු නිෂ්පාදන අපගේ පාරිභෝගිකයන්ට සහ ප්‍රජාවට ලබා දීමෙන් ඔවුන්ට වාසිදායක ප්‍රතිඵලයක් ඇති කිරීම සංස්ථාවේ වගකීම වේ.

## ව්‍යවස්ථානුකූල ගෙවීම්

ශේෂ පත්‍ර දිනට රජයට හා සේවකයන්ට අදාල සියලුම ව්‍යවස්ථානුකූල ගෙවීම් කර තිබේ.

## ශේෂ පත්‍රයේ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශයන් හි සැකසීමට හෝ හෙළිදරව් කිරීමට අවශ්‍ය සිදුවීම් කිසිවක් ශේෂ පත්‍ර දිනයේ සිට සිදුවී නොමැත.

## අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශයන් මූලිකවම පිළියෙල කරන ලද්දේ අඛණ්ඩ පැවැත්ම යන සංකල්පයට අනුකූලවය. සංස්ථාව සතුව ප්‍රමාණවත් සම්පත් පවත්න බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය එහි අනාගත මෙහෙයුම් පිළිබඳව සෑහීමකට පත් වේ .

## විගණකවරුන් පත් කිරීම

1971 මූල්‍ය පනතේ ප්‍රකාරව විගණකාධිපතිවරයා සංස්ථාවේ විගණක වන අතර, ඔහු 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව වාර්ෂික විගණනය විගණකාධිපතිවරයා විසින් කරන ලදී.

**මහාචාර්ය එස්.ඩී.ජයරත්න**

**සභාපති**

**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**

# විගණන කමිටු වාර්තාව

2010/12/14 දිනැති අංක පීඊඩී 55 දරණ පොදු ව්‍යාපාර චක්‍ර ලේඛය අනුව විගණන කමිටුව පිහිටුවා ඇත.

අදාළ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත හා අනිකුත් නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි මූල්‍ය වාර්තාකරණය සාක්ෂාත් කර ගැනිම සඳහා සහය වීමට, රජය විසින් නිකුත් කරන ලද අදාළ නීති, රෙගුලාසි සහ චක්‍රලේඛයන්ට ඇති අනුකූලතාවය විමර්ශණය කිරිම හා අනුකූල නොවන අවස්ථාවල අධ්‍යක්ෂක මණ්ඩලයට නිර්දේශයන් ඉදිරිපත් කිරීමට, අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා කළමණාකරණ ලිපි, පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභාවේ (COPE) නිර්දේශයන් විමර්ෂණය කිරීමට, ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධති හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීමට විගණන කමිටුව විසින් අධ්‍යක්ෂක මණ්ඩලයට සහය විය යුතු වේ.

සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුවෙහි සභාපතිත්වය දරනුයේ මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා වේ.

උක්ත චක්‍රලේඛය අනුව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙක් නිරීක්ෂකයෙකු ලෙස මෙම රැස්වීම්වලට සහභාගි වී ඇති අතර සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පත්කළ නියෝජිතයෙකු ලෙස ඊට සහභාගි වී ඇත.

2013 මූල්‍ය වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් හතරක් (04) පවත්වා ඇත.

2013 වසර තුළ කමිටුව විසින්,

- 2012 වසරට අදාළ වාර්ෂික වාර්තාව නිකුත් කරලීම සඳහා අවධානය යොමු කර ඇත.
- අභ්‍යන්තර විගණන වාර්තාවල සඳහන් කර ඇති අඩුපාඩු සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ පිළිතුරු අවධානයට යොමු කර ඒවා නිවැරදි කිරිම සඳහා ගෙන ඇති පියවරයන් සැලකිල්ලට ලක් කර ඇත.
- සංස්ථාවේ කාර්යයන් කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා තොග හා භාණ්ඩ ලේඛන, විකුණුම්, මිලදී ගැනීම්, නිෂ්පාදනය, මූල්‍ය හා මානව සම්පත් යන ක්ෂේත්‍රයන්හි අන්තර් දෙපාර්තමේන්තුමය ගණුදෙනු වැනි අභ්‍යන්තර පාලන පද්ධති කිහිපයක් පිළිබඳව විමර්ශනය කර සුදුසු නිර්දේශ ඉදිරිපත් කර ඇත.
- අදාළ කළමනාකරුවන්/නිලධාරීන් විසින් ගෙන ඇති පසුවිපරම් කටයුතු පිළිබඳව කමිටු නිර්දේශ සැළකිල්ලට ගෙන විමර්ශන සිදු කර ඇත.
- නව සංශෝධිත ව්‍යාවසාය සම්පත් සැලසුම් කිරිමේ පද්ධතිය (ERP) පවත්වා ගෙන යාම හා ඉන් ලබා ගන්නා තොරතුරු නිසි ලෙස අධීක්ෂණය කර ඇත.
- මාසික මූල්‍ය වාර්තා සමාලෝචනය කර ඒවාට අවශ්‍ය කරන සංශෝධන හා වැඩිදියුණු කිරිම් සඳහා නිර්දේශ ලබා දී ඇත.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ අවශ්‍යතාවයන්ට අනුව වර්ෂ 2012 සඳහා මූල්‍ය වාර්තාකරණය සඳහා ශ්‍රී ලංකා ගිණුම් වාර්තා කරන ප්‍රමිත (SLFR) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) යොදා ගැනීම හා ක්‍රියාවට නැංවීම සඳහා අවධානය යොමු කර ඇත.
- විගණකාධිපතිවරයා විසින් පෙන්වා දුන් කරුනු පිළිබඳව සංස්ථාවේ කළමනාකාරිත්වය විසින් ලබා දුන් අදහස් සැලකිල්ලට ගෙන ඇත.
- පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා 2013 වාර්තාවේ සඳහන් (COPE) නිර්දේශයන් සැලකිල්ලට ගෙන ඇත.
- 2013 සංශෝධිත අය වැය හා සංශෝධිත ප්‍රාග්ධන අය වැය වාර්තා විමර්ශනය කර ඇත.
- 2014 අය වැය හා ප්‍රාග්ධන අය වැය වාර්තා විමර්ශනය කර ඇත.
- ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය (SLAASMB) විසින් ලබා දූන් නිර්දේශයන් විමර්ශනය කර ඇත.

විගණන කමිටුවේ කාර්යය පැවරුම් නියමයන් සියලු ප්‍රමාණාත්මක කරුණු සම්බන්ධයෙන් අනුකූල බව කමිටුවේ මතයයි.

**විගණක කමිටු සාමාජිකයන්**

| | | | |
|---|---|---|---|
| එම් ආර් ආර් අභයවික්‍රම | - සභාපතිනී | - අධ්‍යක්ෂක | - රාඖනිසං/භාණ්ඩාගාර නියෝජිත |
| ලලිත් සේනානායක | - සාමාජික | - අධ්‍යක්ෂක | - රාඖනිසං |
| මර්වින් ගුණසේන | - සාමාජික | - අධ්‍යක්ෂක | - රාඖනිසං (2013.07.11 දක්වා) |
| මියුරු භාෂිත ලියනගේ | - සාමාජික | - අධ්‍යක්ෂක | - රාඖනිසං (2013.07.12 සිට) |
| සිසිර ජිනේන්ද්‍ර පරණගම | - සාමාජික | - අධ්‍යක්ෂක | - රාඖනිසං (2013.07.12 සිට) |

**එම්. ආර්. ආර්. අභයවික්‍රම**
**විගණක කමිටුවේ සභාපතිනී**
**04.03.2014**

# ආයතනික පාලන වාර්තාව

ආයතනික පාලනය යනු ඉහළ විනිවිදභාවය, නිරවද්‍ය හා කාලීන මූල්‍ය වාර්තාකරණය සාක්ෂාත් කිරීම මගින් ආයතනයට සම්බන්ධ පාර්ශවයන්ගේ (ආයෝජකයින්, සේවකයින්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයින්, රජය සහ ප්‍රජාව) අභිමතාර්ථ සාධනය උදෙසා කළමනාකරණය විසින් ආයතන අධ්‍යක්ෂණය සහ පාලනය කරන ක්‍රම පිළිවෙලයි.

සංස්ථාපිත පාලන සම්බන්ධ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලැබේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය, ඉන්ජිනේරු, කළමනාකරණ, ඖෂධවේද, වෛද්‍ය විද්‍යාව, නීතිය, අලෙවිකරණය මූල්‍ය හා පරිපාලනය යන ක්ෂේත්‍රයන්හි වෘත්තීමය සහ අත්දැකීම් බහුල පුද්ගලයන්ගෙන් සැදුම් ලබයි.

සභාපතිවරයා, කළමනාකාර අධ්‍යක්ෂ වන අතර විධායක නොවන අධ්‍යක්ෂවරු හය දෙනෙකු ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ.

පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අවස්ථාවකදී හෝ ගරු ඇමතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර නොමැති විටකදී හැර අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්වේ. අවශ්‍ය විටෙකදී විශේෂ රැස්වීමක් පැවැත් වීමටද කටයුතු කරනු ලැබේ.

සමාලෝචනයට ලක් වු කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දොළහක් පැවැත්වුණි.

## කළමනාකරණ කමිටුව

සංස්ථාපිත කළමනාකරණ කමිටුවේ සභාපති තනතුර සංස්ථාවේ සභාපතිවරයා විසින් හොබවනු ලැබේ. අනෙකුත් කමිටු නිළධාරීන් වන්නේ සංස්ථාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ය.

සංස්ථාවේ එදිනෙදා කටයුතු සම්බන්ධ තීරණ ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ සහ උපාය මාර්ගික අරමුණු ක්‍රියාත්මක කිරීම මෙන්ම අවශ්‍ය විටෙක ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සුදුසු නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ආදී කටයුතු කළමනාකරණ කමිටුව මගින් සිදුකෙරේ.

කළමනාකරණ කමිටුව මාසිකව රැස්වේ.

## විගණන කමිටුව

"යහපත් පාලනය සහ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ" සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ වලට අනුකූලව විගණන කමිටු පිහිටුවා ඇත.

විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කෙරෙන අතර සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනකුගෙන් සමන්විතවේ. මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධක්ෂවරයා කමිටුවේ සභාපතිවේ.

සංස්ථාවේ කාර්යයන් පරීක්ෂා කිරීම සහ ඇගයිම් විගණන කමිටුව විසින් ස්වාධිනව කරනු ලැබේ. අභ්‍යන්තර විගණන කාර්යයන්, විගණන කමිටුවේ අනුමැතිය මත පිළියෙල කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කෙරෙන අතර එය විගණකාධිපතිවරයාගේ දැනුවත් වීමට ද යොමු කෙරේ.

අදාල කාල පරිච්ඡේදය තුළදී විගණන කමිටු රැස්වීම් හතරක් පැවැත්වුණි. විගණන කමිටුවේ වාර්තාව පිටු අංක 16 දක්වා ඇත.

## වේතන ප්‍රතිපත්තිය

සංස්ථාවේ වේතන ප්‍රතිපත්තිය මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් මත පිහිටුවා සකසා ඇත.

අධ්‍යක්ෂ වේතන සහ අනෙතුත් දීමනා මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කරන රාජ්‍ය සංස්ථා වලට අදාල වේතන හා දීමනා සඳහා වන චක්‍රලේඛ මත පදනම්ව ගෙවනු ලැබේ.

සේවක වේතන රාජ්‍ය පරිපාලන වැටුප් තලයන් පාදක කර ගනිමින් සංස්ථාව විසින් පිළියෙල කරන ලද වැටුප් තලයන් අනුව මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව ගෙවනු ලැබේ.

## අභ්‍යන්තර පාලනය

ආයතනය විසින් එළඹෙන සියලු ගනුදෙනු සඳහා නියමිත අධිකාරිය ලැබුන බවටත්, සටහන් ගත කිරීම, වාර්තා කිරීම යන කරුණු සම්බන්ධයෙන් සාධාරණ තහවුරු කිරීමක් ඇතිවන පරිදි අභ්‍යන්තර පාලනය සැලසුම් කොට ඇති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

කාර්යයන් මත පදනම් වූ ආයතනික සැලැස්මක් ක්‍රියාත්මක වේ. නියමිත කාර්යයන් අනුව දෙපාර්තමේන්තු සැලසුම් කර ඇති අතර ඒවා නිෂ්පාදන, තත්ව පාලන, නඩත්තු, මූල්‍ය සැලසුම්, වට්ටෝරු පර්යේෂණ හා සංවර්ධන, අලෙවිකරණ ආදී වශයෙන් වෙති.

සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ නිලධාරී වන සාමාන්‍යාධිකාරී වෙත එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානියා සෘජුවම වාර්තා කරයි.

සාමාන්‍යාධිකාරී, සභාපති/කළමණාකාර අධ්‍යක්ෂවරයාට හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි.

අභ්‍යන්තර විගණන කාර්යය මගින් අභ්‍යන්තර පාලනය තව දුරටත් ශක්තිමත් කෙරේ. අභ්‍යන්තර විගණක සෘජුවම සභාපතිවරයාට සහ විගණන කමිටුවට වාර්තා කිරීම මගින් අභ්‍යන්තර විගණකගේ ස්වාධිනත්වය තවදුරටත් තහවුරු කෙරේ.

මිලදී ගැනීමේ ක්‍රියාවලිය තරගකාරී ටෙන්ඩර් පටිපාටිය මගින් සිදු කෙරෙන අතර ගණුදෙනු වල විනිවිදභාවය රැකීම තුලින් සැපයුම්කරුවන්ට මෙ මගින් සමාන අවස්ථා ද ලැබේ.

ප්‍රාග්ධන අයවැය ඇතුළත් වාර්ෂික අයවැය ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට සෞඛ්‍ය අමාත්‍යාංශයට හා මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ.

## අපගේ නිපැයුම් වර්ග

අපගේ එක් එක් නිපැයුම් වර්ග අනුව නිෂ්පාදිත පෙති හා කරල් සංඛ්‍යාව

| නිපැයුම් වර්ග | ප්‍රමාණය මිලියන වලින් | නිපැයුම් වර්ග | ප්‍රමාණය මිලියන වලින් |
|---|---|---|---|
| ඇලුමිනියම් හයිඩ්‍රොක්සයිඩ් පෙති BP මි.ග්‍රෑ 500. | 1.140 | ෆෝලික් අම්ලය පෙති BP මි.ග්‍රෑ 1. | 265.500 |
| ඇමොක්සිසිලින් පෙති USP මි.ග්‍රෑ 125. | 7.000 | ෆැමොටිඩීන් පෙති BP මි.ග්‍රෑ 20. | 71.550 |
| ඇමොක්සිසිලින් කරල් BP මි.ග්‍රෑ 250. | 235.234 | ෆෘසෙමයිඩ් පෙති BP මි.ග්‍රෑ 40. | 42.000 |
| ඇමොක්සිසිලින් කරල් BP මි.ග්‍රෑ 500. | 34.125 | ග්ලික්ලසයිඩ් පෙති BP මි.ග්‍රෑ 80. | 4.227 |
| ඇස්කොබික් අම්ලය පෙති BP මි.ග්‍රෑ 100. | 31.050 | ඉන්ඩොමෙතසීන් කරල් BP මි.ග්‍රෑ 25. | 30.500 |
| ඇටනොලොල් පෙති BP මි.ග්‍රෑ 50. | 11.312 | ලොසාටන් පොටැසියම් පෙති මි.ග්‍රෑ 50. | 0.800 |
| බෙන්සෙක්සෝල් පෙති BP මි.ග්‍රෑ 2. | 36.000 | මෙබන්ඩසෝල් පෙති USP මි.ග්‍රෑ 500. | 0.640 |
| කාබමෙසපීන් පෙති BP මි.ග්‍රෑ 200. | 42.000 | මෙබන්ඩසෝල් පෙති USP මි.ග්‍රෑ 100. | 45.000 |
| ක්ලෝරම්ෆෙනිකෝල් කරල් BP මි.ග්‍රෑ 250. | 0.302 | මෙට්ෆෝමින් පෙති BP මි.ග්‍රෑ 500. | 85.990 |
| ක්ලෝරොක්වින් ෆොස්පෙට් පෙති BP මි.ග්‍රෑ 250. | 2.200 | පැරසිටමෝල් පෙති BP මි.ග්‍රෑ 500. | 206.400 |
| සිමෙටිඩීන් පෙති BP මි.ග්‍රෑ 200. | 4.160 | ෆිනොක්සිමෙතිල් පෙනිසිලින් පෙති BP මි.ග්‍රෑ 250. | 29.740 |
| ක්ලොක්සසිලීන් කරල් BP මි.ග්‍රෑ 250. | 103.600 | ෆිනොක්සිමෙතිල් පෙනිසිලින් පෙති BP මි.ග්‍රෑ 125. | 4.800 |
| ක්ලොක්සසිලීන් කරල් BP මි.ග්‍රෑ 500. | 5.600 | ප්‍රෙඩ්නිසෙලෝන් පෙති BP මි.ග්‍රෑ 5. | 224.000 |
| කෝට්‍රිමොක්සසෝල් පෙති BP මි.ග්‍රෑ 480. (වැඩිහිටි) | 9.750 | ප්‍රොප්‍රනලෝල් පෙති BP මි.ග්‍රෑ 40. | 16.000 |
| ක්ලැරිත්රොමයිසීන් පෙති BP මි.ග්‍රෑ 50 | 0.139 | සැල්බියුටමෝල් පෙති BP මි.ග්‍රෑ 2. | 91.200 |
| ඩයික්ලෝෆෙනැක් සෝඩියම් පෙති UPS මි.ග්‍රෑ 50 | 88.400 | තියෝෆිලීන් පෙති ER USP මි.ග්‍රෑ 125. | 37.433 |
| ඩයිර්තයිල් කාබමෙසපීන් පෙති UPS මි.ග්‍රෑ 50 | 16.200 | ට්‍රයිප්ලොපෙරසීන් පෙති BP මි.ග්‍රෑ 5. | 4.500 |
| ඩිල්ටියසෙම් (HCL) පෙති UPS මි.ග්‍රෑ 60 | 36.000 | වෙරපමිල් පෙති BP මි.ග්‍රෑ 40. | 19.800 |
| එනැලප්‍රිල් මැලියේට් පෙති USP මි.ග්‍රෑ 5. | 61.200 | විටමින් බී පෙති CHF | 61.600 |
| එරිත්‍රෝමයිසීන් ස්ටියරේට් පෙති BP මි.ග්‍රෑ 250. | 20.800 | විටමින් බී කම්ප්ලෙක්ස් ස්ට්‍රෝං පෙති BPC | 14.000 |

**ඉදිරියේදී නිපදවීමට අදහස්කර ඇති ඖෂධ - 2014**

- ලෙවතයිරොක්සීන් පෙති BP මයික්‍රෝ.ග්‍රෑ 50.
- ලොසාටන් පොටැසියම් පෙති මි.ග්‍රෑ 50.
- එසොමෙප්‍රොසෝල් පෙති මි.ග්‍රෑ 50.
- ක්ලැරිත්රොමයිසීන් පෙති USP මි.ග්‍රෑ 250.
- මෙට්‍රොනිඩසෝල් පෙති USP මි.ග්‍රෑ 200.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වාර්තාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්, පිටු අංක 47-56 හි ඇතුලත් විගණකාධිපති වාර්තාවේ සඳහන් විගණකවරයාගේ වගකීම තුලින් වෙනස් වේ.

1971 අංක 38 දරණ මුදල් පනතට අනුකූලව රාජ්‍ය සංස්ථා විසින් ආදායම්, වියදම්,වත්කම් හා වගකීම් සහ සංස්ථාවේ අනෙකුත් සියළුම ගනු දෙනු පිළිබඳ ගිණුම් වාර්තා සුදුසු පරිදි තබා ගත යුතුය. රාජ්‍ය සංස්ථා විසින් ගිණුම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් සහ සංස්ථාවේ ක්‍රියාකාරකම් හා සම්බන්ධ වු සංඛ්‍යානමය කරුණු, එකී ස්වරුපයන් හා එකී කරුණු ඇතුලත්ව පිළියෙල කළ යුතුය.

රජය සහ ආයතනයට සම්බන්ධ පාර්ශවයන් නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයට, ආයතනයේ භාරකාරීත්වය සම්බන්ධයෙන් ව්‍යවස්ථානුකූලව වගකීමක් හිමිව තිබෙන අතර සංස්ථාවේ මූල්‍ය තත්වය පිළිබඳ සාධාරණ නිවැරදි තාවයකින් යුක්තව හෙළිදරවු කිරීම සඳහා ප්‍රමාණවත් ගිණුම් වාර්තා සංස්ථාව තුළ තබා ගැනීමට ඔවුන් වගකීමෙන් බැඳේ. එසේම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සිදු කොට ඇති බවට සහ 1971 අංක 38 දරණ මුදල් පනතට අනුකූලව අවශ්‍ය තොරතුරු සපයා ඇති බවට සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම සංකල්පය අධ්‍යක්ෂවරුන් විසින් අනුගමනය කර ඇති බව සහතික කළ යුතුය.

සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා සාධාරණ පියවරයන් ගැනිමට අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීමක් ඇති අතර, මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන, අභ්‍යන්තර සෝදිසි කිරීම්,මූල්‍යමය සමාලෝචනය සහ වංචා හා අක්‍රමිකතා අනාවරණය කර ගැනීම ඇතුළත් වු ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමස්ථාපනය කිරීම සඳහා සුදුසු සලකා බැලීම් කිරීමේ වගකීමද ඔවුන් සතුය.

1971 අංක 38 දරණ මුදල් පනතට අනුකූලව විගණකාධිපති,අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කළ සියලුම මූල්‍ය වාර්තා හා සම්බන්ධිත දත්ත සමග මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කර ඇති මතය මෙම වාර්තාවේ පිටු අංක 47-56 හි සඳහන්ව ඇත.

# රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
2013.12.31 දිනට
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | | 31.12.2013 දිනට | 31.12.2012 දිනට |
|---|---|---|---|
| **වත්කම්** | **සටහන** | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 01 | 762,641,198 | 804,305,166 |
| අස්පෘශ්‍ය වත්කම් | 02 | 1,078,000 | 398,947 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 03 | 376,105 | 1,171,882 |
| නොනිමි වැඩ | | 935,067 | 33,827,229 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 04 | 561,248,472 | 647,559,566 |
| වෙළඳ හා වෙනත් අයවිය යුතු දේ | 05 | 493,222,377 | 293,373,713 |
| පූර්ව ගෙවීම් | 06 | 36,045,173 | 5,980,156 |
| වෙනත් මූල්‍ය වත්කම් | 07 | 429,896,526 | 210,691,094 |
| බැංකු සහ අතැති මුදල් | 08 | 8,670,818 | 5,950,745 |
| | | 1,529,083,367 | 1,163,555,275 |
| **මුළු වත්කම්** | | 2,294,113,736 | 2,003,258,498 |
| **කාරක ප්‍රාග්ධනය හා බැරකම්** | | | |
| අනුදත් ප්‍රාග්ධනය | | 850,000,000 | 850,000,000 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 09 | 690,079,000 | 690,079,000 |
| රඳවා ගත් ඉපැයීම් | | 1,247,527,043 | 1,059,925,592 |
| **මුළු කාරක ප්‍රාග්ධනය** | | 1,937,606,043 | 1,750,004,592 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| සේවක ප්‍රතිලාභ බැරකම් | | 22,414,958 | 17,989,961 |
| විලම්බිත බදු බැරකම් | 10 | 140,956,542 | 158,766,584 |
| විලම්බිත බැරකම් | | - | 14,263 |
| | | 163,371,500 | 176,770,807 |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දේ | 11 | 79,693,150 | 81,327,558 |
| ගෙවිය යුතු බදු | | 113,443,043 | (4,844,459) |
| | | 193,136,193 | 76,483,099 |
| අසම්භාව්‍ය බැරකම් | 12 | - | - |
| **මුළු කාරක ප්‍රාග්ධනය හා බැරකම්** | | 2,294,113,736 | 2,003,258,498 |

මෙම මූල්‍ය ප්‍රකාශයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ඔක්තෝබර් 2 වැනි දින අනුමත කරන ලද අතර ඒ වෙනුවෙන් අත්සන් කළේ,

සභාපති : .................................... අධ්‍යක්ෂ : ....................................

දිනය : 2014.10.03

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී - මූල්‍ය : ....................................

# රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව
## ආදායම් ප්‍රකාශය
2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | සටහන | 2013 වර්ෂය සඳහා | 2012 වර්ෂය සඳහා යලි ප්‍රකාශිත | 2012 වර්ෂය සඳහා |
|---|---|---|---|---|
| **ආදායම** | 13 | 1,941,182,950 | 1,414,546,985 | 1,414,546,985 |
| විකුණුම් පිරිවැය | 14 | (1,513,899,412) | (1,196,065,869) | (1,220,523,214) |
| **දළ ලාභය** | | 427,283,538 | 218,481,116 | 194,023,771 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 15 | 5,983,263 | 6,876,100 | 6,876,100 |
| පරිපාලන වියදම් | 16 | (106,096,193) | (106,847,406) | (82,390,062) |
| විකුණුම් සහ බෙදාහැරීමේ වියදම් | 17 | (21,308,804) | (24,073,920) | (24,073,920) |
| අනිකුත් මෙහෙයුම් වියදම් | 18 | (1,685,541) | (9,143,696) | (9,143,696) |
| **මෙහෙයුම් ලාභය** | | 304,176,264 | 85,292,193 | 85,292,193 |
| මූල්‍ය පිරිවැය | 19 | (2,266,464) | (2,407,144) | (2,407,144) |
| මූල්‍ය ආදායම | 20 | 28,059,081 | 34,251,670 | 34,251,670 |
| **බදු පෙර ලාභය** | | 329,968,881 | 117,136,719 | 117,136,719 |
| බදු වියදම | 21 | (120,814,029) | (18,575,538) | (18,575,538) |
| **වර්ෂය සඳහා ලාභය** | | 209,154,852 | 98,561,181 | 98,561,181 |

| **විස්තීරණ ආදායම් ප්‍රකාශය** | 2013 වර්ෂය සඳහා | 2012 වර්ෂය සඳහා යලි ප්‍රකාශිත | 2012 වර්ෂය සඳහා |
|---|---|---|---|
| වර්ෂය සඳහා ලාභය | 209,154,852 | 98,561,181 | 98,561,181 |
| (-) සංක්‍රමික වගකීම් | (486,083) | - | - |
| (-) උපකල්පන වෙනස්වීම් නිසා වූ අලාභ | (1,067,318) | - | - |
| බදු ගැලපීමෙන් පසු වෙනත් විස්තීරණ ආදයම | (1,553,401) | - | - |
| බදු ගැලපීමෙන් පසු මුළු වෙනත් විස්තීරණ ආදයම | 207,601,451 | 98,561,181 | 98,561,181 |

# රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව
# ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ලාභය (/අලාභය) | එකතුව |
|---|---|---|---|
| 2012.01.01 දිනට ශේෂය | 690,079,000 | 668,600,896 | 1,358,679,896 |
| වර්ෂය සඳහා ලාභය | - | 98,561,181 | 98,561,181 |
| අනෙකුත් විස්තීරණ ආදායම් | - | - | - |
| මුළු විස්තීරණ ආදායම් | 690,079,000 | 767,162,077 | 1,457,241,077 |
| ශ්‍රී.ල.මූ.වා.ප්‍ර ගැලපුම | - | 312,763,516 | 312,763,516 |
| මහා භාණ්ඩාගාරය වෙත දායකත්වය | - | (20,000,000) | (20,000,000) |
| **2012.12. 31 දිනට ශේෂය** | 690,079,000 | 1,059,925,592 | 1,750,004,592 |
| 2013.01.01 දිනට ශේෂය | 690,079,000 | 1,059,925,592 | 1,750,004,592 |
| වර්ෂය සඳහා ලාභය | - | 209,154,852 | 209,154,852 |
| අනෙකුත් විස්තීරණ ආදායම් | - | (1,553,401) | (1,553,401) |
| මුළු විස්තීරණ ආදායම් | - | 207,601,451 | 207,601,451 |
| මහා භාණ්ඩාගාරය වෙත දායකත්වය | - | (20,000,000) | (20,000,000) |
| **2013.12.31 දිනට ශේෂය** | 690,079,000 | 1,247,527,043 | 1,937,606,043 |

# රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව
## මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය
2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | 2013 | 2012 |
|---|---|---|
| **බදු සහ අති විශේෂ අයිතමයන්ට පෙර ශුද්ධ ලාභය / (අලාභය)** | 329,968,881 | 117,136,719 |
| **ගැලපුම් :-** | | |
| ස්ථාවර වත්කම් මත ක්ෂය | 117,542,273 | 121,234,122 |
| වර්තමාන පාරිතෝෂික පිරිවැය | 1,339,232 | (668,654) |
| අඩමාන ණය අධි වෙන්කිරීම් | - | (189,797) |
| වාහනය විකිණීමෙන් ලද ලාභය | - | (1,025,000) |
| ස්ථාවර වත්කම් විකිණීම මත ලාභ / (අලාභ) | 87,463 | - |
| මෙවලම් ලියා හැරීමේ අලාභය | 68,468 | - |
| හානි වූ හා අභාවිත ද්‍රව්‍ය පිරිවැය | 332,154 | 7,628,787 |
| විලම්බිත ආදායම | (14,263) | (14,263) |
| පොළී ආදායම | (25,314,785) | (31,843,823) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | 424,009,423 | 212,258,091 |
| **කාරක ප්‍රාග්ධන අයිතමයන්හි වෙනස් වීම්** | | |
| තොග අඩු /(වැඩි) වීම | 86,311,094 | (162,626,615) |
| ණයගැතියන්ගේ හා අයවිය යුතුදේහි අඩු / (වැඩි) වීම | (199,848,664) | (93,362,234) |
| තැන්පතු වල සහ පෙර ගෙවීම්වල අඩු වීම/ (වැඩි) වීම | (30,065,017) | 676,835 |
| බැරකම් වල (අඩු) /වැඩි වීම | (1,634,409) | 23,591,194 |
| **මෙහෙයුම් වලින් ජනනය වූ මුදල්** | 278,772,427 | (19,462,729) |
| පාරිතෝෂිත ගෙවීම් | (315,240) | (501,605) |
| ආදායම් බදු ගෙවීම් | (20,336,569) | (44,928,135) |
| **මෙහෙයුම් වලින් ජනනය වූ ශුද්ධ මුදල්** | 258,120,618 | (64,892,469) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්** | | |
| කෙටිකාලීන ආයෝජන (සටහන - අ ) | (218,013,466) | 123,546,348 |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | (44,156,578) | (70,787,470) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ආදයම | 3,300 | 1,400,000 |
| ලැබුණු පොලිය | 24,122,819 | 34,836,309 |
| සේවක පොළී පිරිවැය | 1,847,603 | 1,869,526 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 795,777 | (348,552) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල්** | (235,400,545) | 90,516,161 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මහා භාණ්ඩාගාර දායකත්වය | (20,000,000) | (20,000,000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල්** | (20,000,000) | (20,000,000) |
| **මුදල් සහ ආසන්න මුදල්වල ශුද්ධ වැඩි/ (අඩු) වීම.** | 2,720,073 | 5,623,692 |
| **වර්ෂය ආරම්භක මුදල් සහ ආසන්න මුදල්** | 5,950,745 | 327,053 |
| **වර්ෂය අවසාන මුදල් හා ආසන්න මුදල් (සටහන ආ)** | 8,670,818 | 5,950,745 |

**සටහන (අ) -**
**ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය**

| | 2013 | 2012 |
|---|---|---|
| වර්ෂය තුළ මුදල් ගලා ඒම | 4,208,107,601 | 6,316,481,578 |
| වර්ෂය තුළ මුදල් ගලා යැම | (4,426,121,067) | (6,192,935,229) |
| ශුද්ධ මුදල් ප්‍රවාහය | (218,013,466) | 123,546,348 |

**සටහන (ආ)**

**මුදල් සහ ආසන්න**

| | | |
|---|---|---|
| ලංකා බැංකුව - රත්මලාන ශාඛාව | 299,207 | 1,012,942 |
| ලංකා බැංකුව - ආයතනික ශාඛාව | 7,869,329 | 4,812,740 |
| මහජන බැංකුව - රත්මලාන ශාඛාව | 167,870 | 85,469 |
| මහජන බැංකුව - ආයතනික ශාඛාව | 297,572 | 35,858 |
| මුදල් ශේෂය | 26,840 | 3,385 |
| සුළු මුදල් ශේෂය | 10,000 | 351 |
| | 8,670,818 | 5,950,745 |

# රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

# ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. ආයතනික තොරතුරු

### පොදු තොරතුරු

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 1957 අංක 49 දරණ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාපිත කර ඇත. මෙය රත්මලාන ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවතේ අංක 11 දරණ ස්ථානයේ පිහිටා ඇති රාජ්‍ය සංස්ථාවකි.

2013 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරන අතර, මෙම මූල්‍ය ප්‍රකාශ වලට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

### ප්‍රධාන ක්‍රියාකාරකම්

### ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ:

(අ) ඖෂධ නිෂ්පාදනය, සැකසීම, ගබඩා කිරීම, ඇසිරීම හා නැවත ඇසිරීම

(ආ) ඖෂධ නිෂ්පාදනයට හා සැකසීමට අවශ්‍ය තාක්ෂණික සහාය සැපයීම

(ඇ) ඖෂධ විද්‍යා සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ සහ ඖෂධ ප්‍රමිතිකරණය සහ

(ඈ) ඖෂධ අලෙවි කිරීම.

## 2. පිළියෙළ කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශයන් පිළියෙළ කොට ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් නිකුත් කල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS/LKAS) වලට අනුකූලවය.

### 2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ වී ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම මතය. සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ වල අගයන් ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

## 3. මූලික ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

### 3.1 මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

5.1.5 දක්වා ඇති පොදු කාර්ය වියදම් වෙන් කිරීම හැර ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේදී භාවිතා කරන ලද ඒවා සමග අනුකූල වේ.

### 3.1.1 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සටහන් කර ඇත්තේ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ වීම් ඇත්නම් ඒවා ද අන්තර්ග්‍රහණය කොට ගණනය කළ ශුද්ධ පිරිවැය ලෙසය. එම පිරිවැයට දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණවලට අළුතින් කොටස් මාරු කිරීමේදී දැරීමට සිදුවන පිරිවැය සහ පිරිවැය නිර්ණායක වලට අනුකූල වන්නේ නම්, දීර්ඝ කාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණයට ගැනීමේ පිරිවැය ද ඇතුළත් වේ. යම් නියමිත කාලයකට වරක් දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වල වැදගත් කොටස් වෙනුවට අලුත් ඒවා යෙදීම අවශ්‍ය වන්නේ නම්, එම ඉවත් කරනු ලබන කොටසට අදළ පිරිවැය මුළු පිරිවැයෙන් ඉවත්කරන අතර නව කොටසෙහි පිරිවැය ඇතුළත් කරන අතර ක්ෂය එහි ප්‍රයෝජනවත් ආයු කාලය මත ගණනය කරනු ලබයි. එලෙසම, ප්‍රධාන පෙළේ පිරික්සීමක් සිදු කරනු ලබන අවස්ථාවේදී එහි පිරිවැය, පිරිවැය නිර්ණායක සපුරා ලන්නේ නම්, දේපළ හා පිරියතෙහි ලියාපදිංචි අගයට ඇතුළත් කරනු ලබයි. දේපළ හා පිරියතෙහි අනිකුත් අලුත්වැඩියා කිරීම් හා නඩත්තු වියදම්, ආදයම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ.

### 3.1.2 ක්ෂය

සරල මාර්ග ක්‍රම පදනම අනුව, මිල දී ගන්නා වර්ෂයේදී මුළු වර්ෂය සඳහාම ක්ෂය කරන අතර, විකුණන වර්ෂයේදී කිසිදු ක්ෂය කිරීමක් සිදු කරනු නොලැබේ. දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වල ප්‍රයෝජනවත් ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| බදු ඉඩම් | 99 අවුරුදු බදු කාලය සඳහා |
| භූමි අලංකරණ වියදම් | 99 අවුරුදු බදු කාලය සඳහා |
| ගොඩනැගිලි | අවුරුදු 4 සිට 30 දක්වා |
| වාහන නවතන ගොඩනැගිල්ල | අවුරුදු 4 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | අවුරුදු 1 සිට 17 දක්වා |
| මෝටර් වාහන | අවුරුදු 3 සිට 14 දක්වා |
| යතුරු පැදි | අවුරුදු 5 |
| උපකරණ | අවුරුදු 2 සිට 10 දක්වා |
| පරිගණක උපාංග | අවුරුදු 1 සිට 5 දක්වා |
| පරිගණක මෘදුකාංග | අවුරුදු 1 සිට 5 දක්වා |
| ලී බඩු හා සවිකිරීම් | අවුරුදු 3 සිට 10 දක්වා |
| මෙවලම් | අවුරුදු 1 සිට 11 දක්වා |
| පුස්තකාල ග්‍රන්ථ | අවුරුදු 5 |

### 3.1.3 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කර ගන්නා අස්පෘශ්‍ය වත්කම් වල මූලික පිරිවැය වන්නේ අත්පත් කරගැනීමේ පිරිවැයයි. මූලික පිරිවැය හඳුනා ගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙන යනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත අපචය අඩු කරමිනි. ප්‍රාග්ධනීකරණය කරන ලද සංවර්ධන පිරිවැය අගයන් හැර අභ්‍යන්තරිකව ජනනය කරන ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනීකරණය කරනු නොලබන අතර වියදම ඇති වූ වර්ෂයේ ආදායම් ප්‍රකාශය තුළ අදාළ වියදම පිළිබිඹු කෙරේ.

### 3.1.4 දේපළ, පිරියත හා යන්ත්‍රසූත්‍ර වල හානිකරණය

දේපළ, පිරියත හා යන්ත්‍රසූත්‍ර වල ධාරණ වටිනාකමේ හානිකරණය සමාලෝචනය කරනු ලබන්නේ වාර්ෂිකව හෝ වෙනස්කම් සිදුවීම් මගින් හෝ දේපළ, පිරියත හා යන්ත්‍රසූත්‍රවල ධාරණ වටිනාකම අය කර ගත නොහැකි වීමට ඉඩ ඇති බව හඳුනා ගත් අවස්ථාවකදීය. එබඳු තත්ත්වයක් පවතින්නේ නම් සහ ධාරණ වටිනාකම ඇස්තමේන්තුගත අය කර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන්නේ නම්, වත්කම් ඒවායේ අය කර ගත හැකි වටිනාකමට සටහන් කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයෙහි ප්‍රත්‍යාගණන අතිරික්තයන් සටහන් කිරීමට ප්‍රතිවිරුද්ධ සටහනක් ලෙස වත්කම් හානිකරණ අලාභ සටහන් කරනු ලැබේ.

### 3.1.5 මූල්‍ය නොවන වත්කම් වල හානිකරණය

වත්කමක් හානි විය හැකි බව දක්වන සංඥාවක් ඇතිදැයි සංස්ථාව එක් එක් වාර්තා කරන දිනයේදී තක්සේරු කරයි. කවර හෝ සංඥාවක් පවතී නම්, එසේත් නැති නම් වත්කමක් සඳහා වාර්ෂික හානි පිරික්සුමක් අවශ්‍ය වූ විට, සංස්ථාව අදාළ වත්කමේ අය කර ගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කරයි. වත්කමක අය කර ගත හැකි ප්‍රමාණය වනාහි වත්කමේ හෝ මුදල්-උත්පාදන ඒකකයේ (CGU) සාධාරණ වටිනාකමෙන්, විකිණීමේ වියදම් අඩු කිරීමෙන් ලැබෙන අගය හා භාවිතයේදී එහි වටිනාකම අඩු කළ විට ලැබෙන අගය යන අගයන් දෙකෙන් වඩා විශාල අගයයි. එය තනි වත්කම් සඳහා නිර්ණය කරනු ලබන්නේ වෙනත් වත්කම් වලින් හෝ වත්කම් සමූහ වලින් ආයතනය තුලට එන මුදල් ප්‍රවාහ වලින් ස්වායත්තව අදාළ තනි වත්කම ආයතනය තුලට මුදල් උත්පාදනය කරන්නේ නම් පමණි. වත්කමක හෝ මුදල්-උත්පාදන ඒකකයක ධාරණ අගය එහි අය කර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන විට, වත්කම හානිකරණය වී ඇතැයි සැලකෙන අතර, එය එහි අය කර ගත හැකි ප්‍රමාණය ලෙස සටහන් කරනු ලැබේ. භාවිතයේදී වටිනාකම තක්සේරු කිරීමේදී, මුදලේ වර්තමාන අගය සහ වත්කමට ආවේණික අවදානම් පිළිබඳ වත්මන් වෙළඳපල තක්සේරු අගයන් පිළිබිඹු කරන බදු-පූර්ව වට්ටම් අනුපාතිකය භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වත්මන් වටිනාකමට වට්ටම් කරනු ලැබේ. සාධාරණ වටිනාකමෙන් විකිණීමේ පිරිවැය අඩු කොට අගය නිර්ණය කිරීමේදී, මෑත කාලීන වෙළඳපල ගනුදෙනු (තිබේ නම්) සැලකිල්ලට ගනු ලැබේ. එබඳු ගනුදෙනු හඳුනා ගත නොහැකි නම්, උචිත තක්සේරු ක්‍රමයක් භාවිතා කරනු ලැබේ.

### 3.1.6 බදුකරණය

#### 3.1.6.1 වර්තමාන බදුකරණය

වර්තමාන සහ පෙර වර්ෂවල දී මෙන් බදු ආයතන වලට,ආයතනයේ බදු වත්කම් සහ බැරකම් මත බදු ගෙවීමක් සිදු කරයි. එම බදු ප්‍රමාණයන් ගණනය කිරීමට යොදා ගන්නා ලද බදු අනුපාතික හා බදු නීති වනාහි ශේෂ පත්‍ර දින වන විට පනවා තිබූ ඒවා වේ.

ඒ අනුව, 2000 අංක 38 දරණ දේශීය ආදායම් පනතේ හා එයට කරන ලද සංශෝධන හා විධිවිධාන වලට අනුකූලව පනතේ නියම කර ඇති අනුපාතිකයන්ට අනුව බදු ගෙවීමේ කාර්යය සඳහා ගලපන ලද වර්ෂයේ ලාභය පදනම් කරගනිමින් බදු ප්‍රතිපාදනය කරනු ලැබේ. සමාලෝචිත වර්ෂයේ බදු සඳහා ප්‍රතිපාදන සලසා ඇත්තේ පනතේ නියම කර ඇති අනුපාතික වලට යටත්ව ගිණුම්ගත ලාභය පදනම් කරගෙනය.

### 3.1.6.2 විලම්බිත බදුකරණය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ හඳුනා ගෙන ඇති වත්කම් සහ වගකීම් වලට අදාල තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු බැරකම් හා වත්කම් සඳහා ප්‍රතිපාදන කර ඇත. අපගේ මූල්‍ය ප්‍රකාශයන් තුළ ප්‍රධාන වශයෙන් ස්ථාවර වත්කම් වල ලියාහල පොත් අගය හා ලියාහල බදු වට්නාකම සඳහා විලම්බිත බදු බැරකමක්ද, විශ්‍රාම පාරිතෝෂිකය වෙනුවෙන් වූ ප්‍රතිපාදනය සඳහා විලම්බිත බදු වත්කමක්ද හඳුනා ගත්තෙමු. විලම්බිත බදු වත්කම් සහ බැරකම් මනිනු ලබන්නේ ආදායම් බදු අනුපාත අනුවය.

### 3.2. භාණ්ඩ තොග

'ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කල පදනමින් අගය තක්සේරු කෙරෙන අභාවිත හෝ මන්දගාමී චලනයක් සහිත භාණ්ඩ සඳහා නිසි වෙන් කිරීම් කළ පසුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත භාණ්ඩ තොග අගය කරනු ලැබේ.

### 3.2.1 තොග අගය කිරීම

**තොග පිරිවැය**

**අමුද්‍රව්‍ය**

කවර හෝ පසු වියදම්ද ඇතුළුව මිලට ගැනීමේ පිරිවැය

**නොනිමි වැඩ**

අමුද්‍රව්‍ය පිරිවැය සහ සම්පූර්ණ විචල්‍ය නිෂ්පාදන පිරිවැය

**නිමි භාණ්ඩ**

අමුද්‍රව්‍ය පිරිවැය සහ සම්පූර්ණ විචල්‍ය නිෂ්පාදන පිරිවැය

**වෙනත් තොග**

පිරිවැය නිශ්චය කර ඇත්තේ බර තැබූ සාමාන්‍යය පදනමිනි.

### 3.2.2 වෙළඳ සහ අනිකුත් අය විය යුතු දේ

වෙළඳ සහ අනිකුත් අය විය යුතු දේ ප්‍රථමයෙන් සාධාරණ වට්නාකම මත හඳුනා ගෙන පසු වර්ෂයන්හිදී හානිකරණය සඳහා ප්‍රතිපාදන වලට යටත්ව සඵල පොළී අනුපාතිකය ආධාරයෙන් ගණනය කරනු ලබන ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය. 2013.12.31 දිනට දීර්ඝ කාලයක් හිඟ හිටි මුදලක් නොතිබූ බැවින් මෙම සංස්ථාව වෙළඳ ණයගැතියන් සඳහා කිසිදු හානිකරණයට අදාල ප්‍රතිපාදනයක් කොට නැත.

### 3.2.3 මුදල් හා මුදල්වලට සමාන දේ

මුදල් හා මුදල්වලට සමාන දේ යන්නට අත ඇති මුදල්, බැංකු ශේෂය හා කෙටි කාලීන ආයෝජන ඇතුළත්ය.

### 3.2.4 සබැඳි පාර්ශවයන් සමග ගනුදෙනු

### 3.2.4.1 අධ්‍යක්ෂ මණ්ඩල වන්දි

**රාජ්‍ය හා රාජ්‍ය පාලනය සහිත ආයතන සමග ගනුදෙනු**

සංස්ථාව සිය සාමාන්‍ය මෙහෙයුම් වලදී සබැඳි පාර්ශවයන් සමග ගනුදෙනු වලට එළඹෙයි. සබැඳි පාර්ශවයන්ට ශ්‍රී ලංකා රජය (රාජ්‍යඃ සංස්ථාවේ හිමිකරු වශයෙන්), විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන ඇතුළත්ය. රජය සහ රජය විසින් පාලනය කරනු ලබන හා තනි තනිව වැදගත් වන්නාවූ හෝ අන් සමහර ගනුදෙනු සම්බන්ධයෙන් තනි තනිව නොව, සාමූහිකව වැදගත් වන්නා වූ ආයතන සමග සංස්ථාව එළඹුනු ගනුදෙනු හා විධිවිධාන පිළිබඳ විස්තර පහත දැක්වෙන පරිදි වේ.

| ගනුදෙනුවේ ස්වභාවය | 2013 | 2012 |
|---|---|---|
| **ගනුදෙනු** | | |
| සංස්ථාව සතු ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වල ආයෝජන | 429,896,526 | 210,691,094 |
| වර්ෂය තුළ රජය වෙත කල ගෙවීම් | 20,000,000 | 20,000,000 |
| විකුණුම් | 529,050,518 | 412,413,224 |
| **හිඟ හිටි ශේෂය** | | |
| රා. ඖ. සං. වෙතින් අය විය යුතු දේ | 1,296,680 | 54,405,818 |
| සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙතින් අය විය යුතු දේ | 404,315,959 | 217,151,210 |

### 3.2.5 ප්‍රාග්ධනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අනුදත් ප්‍රාග්ධනයෙහි වෙනසක් වී නොමැත.

### 3.2.6 මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට පසු සිදුවීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට පසු සිදු වූ සියලුම වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනයෙහි අවශ්‍ය අවස්ථාවන්හිදී යෝග්‍ය වෙනස්කම් සිදු කර ඇති අතර, අවශ්‍ය තැන්හිදී මූල්‍ය ප්‍රකාශයට අනාවරණයන් සිදු කර ඇත.

### 3.2.7 පර්යේෂණ පිරිවැය

නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබා ගැනීමේ අරමුණින් සිදු කරන ලද පර්යේෂණ කටයුතු සඳහා වියදම් ඇති වූ අවස්ථාවේදී ඒවා ලාභාලාභ ගිණුම තුළ පෙන්වා ඇත.

## 4. බැරකම් සහ ප්‍රතිපාදන

### 4.1 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

### 4.1.1 නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට සංස්ථාව බැඳී සිටී. සේවකයකුට ගෙවිය යුතු පාරිතෝෂිකය සඳහා බැරකම පැන නගින්නේ සේවකයකු සංස්ථාව සමග අවුරුදු 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන අවස්ථාවේදීය. මෙම වගකීම සපුරාලනු පිණිස මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ප්‍රතිපාදනයක් ඉදිරියට ගෙන යනු ලැබේ. වර්ෂය මුලදී ඉදිරියට ගෙනා ප්‍රතිපාදනය සහ වර්ෂය අවසානයේදී ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදනය අතර ඇති වන වෙනස ආදායම් ප්‍රකාශය තුළ දක්වා ඇත.

ගණනය කිරීම්වලදී භාවිතා කෙරෙන ප්‍රධාන උපකල්පනයන් පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| අපේක්ෂිත සාමාන්‍ය වාර්ෂික වැටුප් වර්ධන අනුපාතිකය | - | 03.80% |
| වට්ටම්/පොලී අනුපාතිකය | - | 10.90% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය | - | 03.13% |

මෙම බැරකම සම්බන්ධයෙන් බාහිරව අරමුදල් සැපයීම සිදු නොකෙරේ. මෙය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ජංගම නොවන බැරකම් යටතේ කාණ්ඩගත කෙරේ.

### 4.1.2 නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයට හා සේවක භාරකාරත්ව අරමුදල් දායකත්වයට සුදුසුකම් ඇති සියලුම සේවකයන් අදාල රෙගුලාසි වලට අනුකූලව අදාළ දායකත්ව අරමුදල් මගින් ආවරණය කරනු ලැබේ. සේවකයන් ආවරණය කරමින් අර්ථසාධක අරමුදලට හා භාරකාර අරමුදලට සැපයෙන දායකත්වයන් පිළිබඳ වගකීම් භාරයන් ආදායම් ප්‍රකාශය තුළ වියදම් වශයෙන් හඳුනා ගනු ලැබේ.

### 4.1.3 වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දේ

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දේ ඒවායේ පිරිවැය අනුව සඳහන් කර ඇත. වෙළඳ සහ අනිකුත් ගෙවිය යුතු දේ ප්‍රථමයෙන් සාධාරණ වටිනාකම මත අගය කර පසුව සඵල පොළී අනුපාතිකය ආධාරයෙන් ගණනය කරනු ලබන ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට හානිකරණ සඳහා ප්‍රතිපාදනයන් අඩුකරයි. 2013.12.31 දිනට සැලකිය යුතු අවදානමක් නොමැති බැවින් පසු වර්ෂයන් හිදි ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂිත පිරිවැයක් සඳහා සංස්ථාව කිසිදු ප්‍රතිපාදනයක් සිදු කොට නැත.

### 4.1.4 ප්‍රතිපාදන

**පොදු**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන (නෛතික හෝ අර්ථවිග්‍රහ කළ) වගකීම් භාරයක් සංස්ථාවට ඇති විට ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. අදාළ වගකීම පියවනු පිණිස ආර්ථික ප්‍රතිලාභයක් ඇති වත්කම් වලින් මුදල් ප්‍රවාහයක් ගලා යන්නේ නම් සහ වගකීම් භාරයේ ප්‍රමාණය පිළිබඳව විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් කළ හැකි වීමේ හැකියාව තිබිය හැකිය. සංස්ථාව ප්‍රතිපාදනයෙන් කොටසක් හෝ සමස්තයම ප්‍රතිපූරණය කෙරෙනු ඇතැයි අපේක්ෂා කරන තැන්හිදී (නිදසුනක් ලෙස රක්ෂණ ගිවිසුමක් යටතේ) වුවද ප්‍රතිපූරණය වෙනම වත්කමක් ලෙස හඳුනා ගනු ලබන්නේ ප්‍රතිපූරණය නිශ්චිතම හඳුනාගත් විටය. කවර හෝ ප්‍රතිපාදනයක් සම්බන්ධයෙන් වූ වියදමක් ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලබන්නේ ඊට අදාල ප්‍රතිපූරණයන් අඩු කොටය.

මුදලේ වර්තමාන අගයේ වෙනස්වීම වැදගත් නම්, උචිත තැන්හිදී බැරකමට වන විශේෂිත අවදානම් සඳහා පිළිඹිබු කරන වත්මන් බදු-පූර්ව අනුපාතිකයක් භාවිතා කරමින් ප්‍රතිපාදන වට්ටම් කෙරේ. වට්ටම්කරණය භාවිතා කරන තැන්හිදී කාලය ගත වීමත් සමගම ප්‍රතිපාදනයේ ඇති වන වෙනස මූල්‍ය පිරිවැයක් ලෙස හඳුනා ගැනේ.

## 5. ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා වියදම් ශ්‍රිත ක්‍රමය යොදා ගෙන ඇත්තේ එමගින් සංස්ථාවේ කාර්යසාධනයෙහි සංරචකයන් සාධාරණව නිරූපනය වන නිසාය.

### 5.1.1 පිරිවැටුම

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවම හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ බෙද හරින්නන් වෙත කෙරෙන අලෙවියෙන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පිරිවැටුම සමන්විත වේ.

### 5.1.2 ආදායම් හඳුනා ගැනීම

ගෙවන අවස්ථාව කවරක් වුවද, ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ගලා ඒමේ හැකියාව ඇති හා ආදායම හා ඊට සම්බන්ධ පිරිවැය විශ්වාසය තැබිය හැකි අයුරින් මැනිය හැකි මට්ටමට ආදායම හඳුනා ගනු ලැබේ. ගිවිසුම්ගතව නිර්වචනය කරන ලද ගෙවීමේ නියමයන් සැලකිල්ලට ගනිමින් හා බදු හෝ තීරු ගාස්තු බැහැර කරමින්, ලැබුණු හෝ අය විය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලැබේ. සංස්ථාව සිය ආදායම් සැලසුම් වල විධිවිධානයන් දෙනු ලබන ප්‍රධානියා වේ. ආදායමක් වශයෙන් හඳුනාගැනීමේදී පහත සඳහන් විශේෂ පිළිගත් මිනුම් දඬු සපුරාලිය යුතුය.

**භාණ්ඩ අලෙවිය**

භාණ්ඩ අලෙවි ආදායම හඳුනා ගනු ලබන්නේ භාණ්ඩ හිමිකරුගේ අවදානම් හා ප්‍රතිලාභ ගැනුම්කරුට හිමි වූ අවස්ථාවේදි, සාමාන්‍යයෙන් භාණ්ඩ භාර දුන් විටය.

### 5.1.3 වියදම්

වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී, ව්‍යාපාරය පවත්වා ගෙන යාමෙන් ඇති වූ සියලුම වියදම් ආදායමෙන් අඩු කර ඇත.

අළුත්වැඩියාවන් හා අළුත් කිරීම් එම වියදම ඇති වූ වර්ෂයේ ලාභ අලාභවලට අය කරනු ලැබේ.

### 5.1.4 මූල්‍ය වියදම්

මූල්‍ය වියදම් සමන්විත වන්නේ බැංකු අයිරා මත පොළිය, ණයවර ලිපි විවෘත කිරීමේ වියදම්, සහ ණය පහසුකම් ගිවිසුම් ගාස්තු යන මේවායින්ය.

### 5.1.5 පොදුකාර්ය වියදම් ප්‍රතිපාදනය

මූල්‍ය ප්‍රකාශ තුළ පොදුකාර්ය ප්‍රතිපාදන ක්‍රමය පහත සඳහන් පරිදි වේ.

**වියදම්**

(අ) වරිපනම් බදු, විදුලිය, ජල ගාස්තු

(ආ) රක්ෂණ, උපකරණ නඩත්තු, පොදු නඩත්තු, ගොඩනැගිලි නඩත්තු, ක්ෂය

(ආ) සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයේ වාරිකය, කාර්ය මණ්ඩල සුභසාධනය, නිල ඇඳුම් හා පාවහන්, සහ ප්‍රවාහන ගාස්තු

(ඇ) අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු, වෙනත් දිරිදීමනා, මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තු, වාහන සඳහා ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය, තැපැල් හා ෆැක්ස් ගාස්තු, දුරකථන ගාස්තු, ආරක්ෂක ගාස්තු, වාහන හා ඖෂධ බලපත්‍ර ගාස්තු, මුද්‍රණ කටයුතු හා ලිපිද්‍රව්‍ය, කාර්යාල වියදම්, විගණන ගාස්තු, කුලී ගාස්තු, ප්‍රචාරක දැන්වීම්, වෙළඳ දායකත්වයන් හා වාර සඟරා, නීති හා පරීක්ෂණ වියදම්, වෘත්තීයවේදී ගාස්තු, සංග්‍රහ, වාර්ෂික දායකත්වයන්, වාර්ෂික සමුළු හා රැස්වීම්, මුද්දර ගාස්තු, ලිපිද්‍රව්‍ය තොග සත්‍යාපන ගැලපුම්.

(ඈ) කාර්ය මණ්ඩල ප්‍රතිලාභ සහ වෙනත් වියදම්

**ප්‍රතිපාදන ක්‍රමය**

(අ) නිෂ්පාදන හා පරිපාලන අතර 70% හා 30% පදනමින් බෙදී යන සේ පොදු තථ්‍ය පිරිවැය බෙදනු ලැබේ.

(ආ) අදාල පිරිවැය සෘජුවම නිෂ්පාදන හෝ පරිපාලන වියදම් ලෙස හඳුනා ගනු ලබන අවස්ථා වලදී ඒ ඒ පිරිවැය යටතේද පොදු පිරිවැයක් වන්නේ නම් එයද 70% හා 30% වශයෙන් පිලිවෙලින් නිෂ්පාදන හා පරිපාලන වශයෙන් වෙන් කරනු ලැබේ.

(ඇ) එක් එක් අංශයේ සිටින සේවක සංඛ්‍යාව පදනම් කර ගෙන පිරිවැය බෙදනු ලැබේ.

(ඈ) තථ්‍ය පිරිවැය ක්‍රමය භාවිතා කෙරේ.

(ඉ) තථ්‍ය පිරිවැය ක්‍රමය භාවිතා කෙරේ.

**6. මූල්‍යකරණ මෙවලම් - ප්‍රථම සහ පසු වර්ෂ සඳහා තක්සේරු කිරීම**

**6.1 මූල්‍ය වත්කම**

**6.1.1 මුල් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම**

ශ්‍රී.ල.මු.වා.ප්‍ර අංක 39 හි විෂයපථය තුළ මූල්‍ය වත්කම් වර්ගීකරණය වී ඇත්තේ ලාභ අලාභ ගිණුම හරහා මූල්‍ය වත්කම්, ණය හා අය විය යුතු දේ, කල් පිරීම දක්වා කරනු ලබන ආයෝජන හා විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙසයි. ඒ අනුව වටිනාකම ආයතන වලට යෝග්‍ය ආකාරයට තම මූල්‍ය වත්කම් වර්ගීකරණය නිර්ණය කළ යුතුය.

සියලුම මූල්‍ය වත්කම් වෙළඳපල වටිනාකමට අගය කලයුතු අතර වෙළඳපල අගය තීරණය කල නොහැකි අවස්ථා වල එම මූල්‍ය වත්කම් ගනුදෙනු අගය කල පිරිවැයට අගය කල යුතුය.

සංස්ථාවේ මූල්‍ය වත්කම් වලට මුදල් හා කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් ආයෝජන, වෙළඳ හා වෙනත් අයවිය යුතු දේ, කාර්ය මණ්ඩල ණය, සහ වෙනත් අය විය යුතු දේ ඇතුළත් වේ.

**6.1.2 පසු තක්සේරුව**

මූල්‍ය වත්කම් වල පසු වර්ෂ වල තක්සේරුව පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

**6.1.3 ලාභාලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය තක්සේරු කරන මූල්‍ය වත්කම්**

ලාභාලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය තක්සේරු කරන මූල්‍ය වත්කම් වලට අන්තර්ගත වනුයේ විකිණීම සඳහා වෙන් කරන ලද මූල්‍ය වත්කම් හා මුල් හඳුනාගැනීමේදී මෙම වර්ගීකරණයට අයත් යැයි නිර්ණය කරන ලද මූල්‍ය වත්කම්ය. මූල්‍ය වත්කම් නුදුරු කාලයේදී විකිණීමේ හෝ යළි මිලට ගැනීමේ කාර්යය සඳහා අත්කර ගෙන ඇති නම් ඒවා විකිණීම සඳහා වෙන්කරන ලද මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ.

**6.1.4 ණය සහ ලැබිය යුතු දේ**

ණය සහ අය විය යුතු දේ වනාහි ක්‍රියාශීලී වෙළඳපලක තක්සේරු නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්වෘත වෙළඳපලේ විකුණා ඉපයීමක් නොකරන මූල්‍ය වත්කම්ය. මුල් හඳුනා ගැනීමෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් පසු වර්ෂයන් හි තක්සේරු කරනු ලබන්නේ හානිවීම අඩු කර සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය ගාස්තු හා පිරිවැය සහ අත්කර ගැනීමේදී වූ වට්ටම් හෝ විශේෂ දීමනා සැලකිල්ලට ගනිමින් ගණනය කල සඵල පොළී අනුපාතිකය භාවිතා කර ක්‍රමක්ෂය කරන ලද පිරිවැය ගණනය කරනු ලැබේ. ආදයම් ප්‍රකාශයේ මූල්‍ය ආදයම තුළ සඵලපොළී අනුපාතික ක්‍රමක්ෂය ඇතුළත් කරනු ලැබේ. හානිවීම් නිසා පැන නගින අලාභයන් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ හඳුනා ගනු ලැබේ .

**6.1.5 කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන**

ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්වෘත වෙළඳපලේ විකිණීමක් නොකරන සංස්ථාවට කල්පිරීම දක්වා දැරීමේ හැකියාව හා සාධනීය චේතනාව තිබේ නම් ඒවා කල්පිරීම තෙක් රදවනු ලබන ආයෝජන ලෙස වර්ගිකරණය කෙරේ. මූලික හඳුනාගැනීමෙන් පසුව කල් පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන තක්සේරු කරනු ලබන්නේ හානිවීම් අඩු කර සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) භාවිතා කර ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය.ගාස්තු හා පිරිවැය සහ අත්කර ගැනීමේදි වූ වට්ටම් හෝ විශේෂ දීමනා සැලකිල්ලට ගනිමින් ගණනය කරනු ලබන පොළී අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම තුළ සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය ඇතුළත් කරනු ලැබේ. හානිවීම් තුලින් පැන නගින අලාභයන් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ හඳුනා ගනු ලැබේ. 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන නොතිබුණි.

### 6.1.6 විකිණීමට ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන වලට කාරක ප්‍රාග්ධනය හා ණය සුරැකුම් ඇතුළත්ය. විකිණීමට ඇති මූල්‍ය ආයෝජන ලෙස වර්ගීකරණය කර ඇති කාරක ප්‍රාග්ධන ආයෝජන විකිණීම සඳහා රඳවා ගනු ලබන ලෙස වර්ගීකරණය කරනු ලැබූ ,ලාභ හෝ අලාභ ගිණුම හරහා වෙළඳපළ වටිනාකමට අගය කර නොමැති ඒවාය. මෙම ප්‍රභේදය තුල ඇති ණය සුරැකුම් වනාහි ද්‍රවශීලතාව සඳහා වූ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළඳපල තත්ත්වයන්ගේ වෙනස්කම් වලට ප්‍රතිචාර වශයෙන් අලෙවි කරනු ලැබිය හැකි අවිනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා රඳවනු ලැබීමට අපේක්ෂා කෙරෙන ඒවාය.

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන මූලික හඳුනාගැනීමෙන් පසුව, සමුච්චිත අලාභය, ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ යළි වර්ගීකරණය කොට විකිණීමට ඇති සංචිතයෙන් ඉවත් කෙරෙන අතර, සමුච්චිත අලාභය වෙනත් මෙහෙයුම් ආදායම තුළ හඳුනා ගන්නා හෝ හානි වූ ලෙස නිර්ණය කරනු ලබන අවස්ථාවක, ආයෝජන ලෙස හඳුනා නොගැනිමක් කෙරෙන තෙක්, විකිණීමට ඇති සංචිතය තුළ අනෙකුත් අංග සම්පූර්ණ ආදායම ලෙස හඳුනා ගනු ලැබූ අනු උපලබ්ධි ලාභ හෝ අලාභ සමග වෙළඳපල වටිනාකමට තක්සේරු කරනු ලැබේ.විකිණීමට ඇති ණය සුරැකුම් මත පොළී ආදායම සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර, ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනු ලැබේ.

සංස්ථාව සිය විකිණීමට ඇති මූල්‍ය වත්කම් තක්සේරු කරනුයේ නුදුරු කාලයේදී මෙම මූල්‍ය වත්කම් විකිණීමට ඇති හැකියාව හා අභිප්‍රාය තවමත් උචිතද යන්න නිශ්චය කරනු පිණිසය. වෙළඳපලේ අක්‍රීය බව නිසා මෙම මූල්‍ය වත්කම් ගනුදෙනු කිරීමට සංස්ථාවට නොහැකි වන විට සහ එසේ කිරීමට කළමනාකාරිත්වයට ඇති අභිප්‍රාය සාදෘශ්‍ය අනාගතයේදී සැලකිය යුතු ලෙස වෙනස් වන විට, සංස්ථාව ඉතා කලාතුරකින් මෙම මූල්‍ය වත්කම් යළි වර්ගීකරණය කිරීමට තීරණය කිරීමට ඉඩ ඇත. මූල්‍ය වත්කම් ණය හා අයවිය යුතු දේවල නිර්වචනය සපුරාලයි නම් සහ සාදෘශ්‍ය අනාගතය තුළ හෝ කල්පිරෙන තෙක් මෙම වත්කම් රඳවා ගැනිමට ඇති හැකියාව හා අභිප්‍රාය බැංකුවට ඇති විට ඒවා ණය හා අයවිය යුතු දේ ලෙස යළි වර්ගීකරණය කිරීමට අවසර ලැබේ. කල්පිරෙන තෙක් රඳවනු ලබන ආයෝජන ලෙස යළි වර්ගීකරණය කිරීමට අවසර ලැබෙනුයේ ආයතනයට අදාළ මූල්‍ය වත්කම එලෙස රැඳවීමට හැකියාව හා අභිප්‍රාය තිබේ නම් පමණි.

'විකිණීමට ඇති' ප්‍රභේදයෙන් ඉවත්ව යළි වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන්, කාරක ප්‍රාග්ධනය තුළ හඳුනා ගෙන ඇති එම වත්කමේ කවර හෝ පෙර ලාභයක් හෝ අලාභයක් සඵල පොළී අනුපාතික භාවිතා කරමින් ආයෝජනයේ ඉතිරිව ඇති ආයුකාලය මුළුල්ලේ ලාභය හෝ අලාභයට ක්‍රමක්ෂය කරනු ලැබේ. නව ක්‍රමක්ෂය කරන ලද පිරිවැය සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර ඇති වන කවර හෝ වෙනසක් වුවද සඵල පොළී අනුපාතික භාවිතා කරමින් වත්කමෙහි ඉතිරිව ඇති ආයුකාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලැබේ. අදාළ වත්කම් පසුව හානි වී ඇතැයි නිර්ණය කරනු ලබන්නේ නම්, එවිට කාරක ප්‍රාග්ධනය තුළ සටහන් කරන ලද ප්‍රමාණය ආදායම් ප්‍රකාශය වෙත යළි වර්ගීකරණය කරනු ලැබේ. 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව කිසිදු විකිණීමට ඇති මූල්‍ය ආයෝජන නොතිබුණි.

### 6.1.7 හඳුනා නොගැනීම්

මූල්‍ය වත්කමක් (එසේත් නැත හොත්, අදාළ අවස්ථාව අනුව, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) හඳුනා නොගැනීමක් කරනු ලබන්නේ පහත අවස්ථාවන්හිදීය:

i). වත්කම වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය ඉකුත් වීම

ii). සංස්ථාව එම වත්කම වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමේ සිය අයිතිවාසිකම් පවරා තිබීම හෝ 'විනිවිද යන' විධිවිධානයක් යටතේ තුන්වන පාර්ශවයකට බලවත් ප්‍රමාදයකින් තොරව ලැබුණු මුදල් ප්‍රවාහයන් පූර්ණ වශයෙන් ගෙවීමේ වගකීමක් භාර ගෙන තිබීම සහ

අ) සංස්ථාව වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත්ව පවරා තිබීම හෝ

ආ) සංස්ථාව, වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත්ව පැවරීමකින් හෝ රඳවා ගැනීමකින් තොරව වත්කමේ පාලනය පවරා තිබීම.

### 6.1.8 මූල්‍ය වත්කම් හානිකරණය

යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී තිබෙන බවට පිළිගත හැකි සාක්ෂි කිසිවක් තිබේදැයි සංස්ථාව එක් එක් වාර්තාකරණ දිනයේදී තක්සේරු කර බලයි. යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී ඇතැයි සලකනු ලබන්නේ වත්කමේ මූලික හඳුනා ගැනීමට පසුව සිදු වූ සිදුවීමක හෝ කීපයක ප්‍රතිඵලය වශයෙන් හානි වීමක් පිළිබඳව පිළිගත හැකි සාක්ෂි ඇති නම් සහ මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් මත විශ්වාසය තැබිය හැකි අයුරින් ඇස්තමේන්තු කළ හැකි බලපෑමක් මගින් අලාභ ගෙන දෙන සිදුවීමක් හෝ සිදුවීම් ඇති නම් පමණි.

හානිකරණයේ සාක්ෂි ලෙස ණයගැතියන්ගේ හෝ ණයගැති සමූහයේ සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, පොළී හෝ මුල් මුදල් ගෙවීම් පැහැර හැරීම, බුන්වත්භාවය හෝ වෙනත් මූල්‍ය සංවිධානය වීම්වලට අවතීර්ණ වීම අත්විඳිමින් සිටින බව දක්වන සංඥා සහ පැහැර හැරීම්වලට සහසම්බන්ධ හිඟ වාරික හෝ ආර්ථික තත්ත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි මැනිය හැකි අඩු වීමක් තිබෙන බව හඟවන නිරීක්ෂණය කළ හැකි දත්ත ඇතුළත් වේ.

### 6.1.9 ක්‍රමක්ෂිත පිරිවැයට අගය කරනු ලබන මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂිත පිරිවැයට අගය කරනු ලබන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, සංස්ථාව මුලින්ම, තනිව වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනිව හානිවීමේ සහ තනිව වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමූහික වශයෙන් හානිවීමේ වාස්තවික සාක්ෂි තිබේද යන්න තක්සේරු කරයි. තනිව තක්සේරු කරනු ලබන මූල්‍ය වත්කම් සඳහා හානිවීමේ වාස්තවික සාක්ෂි නොමැති බවට සංස්ථාව තක්සේරු කරන්නේ නම් එම වත්කම සැලකිය යුතු එකක් වූවද, නොවූවද, සංස්ථාව එම වත්කම එයට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කණ්ඩායමකට ඇතුළත් කොට, හානිවීම සම්බන්ධයෙන් අදාළ වත්කම් කණ්ඩායමම සාමූහිකව තක්සේරු කරයි. හානිවීමක් ඇතිදැයි තනි තනිව තක්සේරු කරනු ලබන හා අපව අලාභයක් ඇති හෝ අඛණ්ඩව පවතිනු ඇති ලෙස හඳුනා ගනු ලබන වත්කම් සාමූහික අපව තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ.

හානිවීමේ අලාභයක් සිදු වී ඇති බවට වාස්තවික සාක්ෂි පවතී නම්, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමෙහි ධාරණ අගය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි (තවමත් ඇති වී නොමැති අනාගතයේ අපේක්ෂිත ණය අලාභයන් ඇතුළත් නොවන) වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස ය. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතිකයට වට්ටම් කරනු ලැබේ. සංස්ථාව එක් එක් ණයගැති ප්‍රභේදය සඳහා විශේෂිත හානිවීම තක්සේරු කිරීම සිදු කර ඇත.

# 2013.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

01 සටහන

## දේපළ, පිරියත හා උපකරණ - ක්ෂය වන වත්කම්

### 2013

පිරිවැය

| විස්තරය | 2013.01.01දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම | වර්ෂය තුළ විකිණීම | 2013.12.31 දිනට ශේෂය | හානි වූ හා අභාවිත ගැලපුම් | හානි වූ හා අභාවිත ගැලපූ පසු 2013.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| ක්ෂය වන වත්කම් | | | | | | |
| බදු ඉඩම් | 4,920,845 | - | - | 4,920,845 | - | 4,920,845 |
| භූමි අලංකරණ වියදම් | 6,113,388 | - | - | 6,113,388 | - | 6,113,388 |
| ගොඩනැගිලි | 343,915,599 | 41,928,531 | - | 385,844,130 | - | 385,844,130 |
| වාහන නවතන ගොඩනැගිල්ල | 1,170,063 | - | - | 1,170,063 | - | 1,170,063 |
| පිරියත හා යන්ත්‍ර | 647,702,109 | 19,865,660 | (1,231,000) | 666,336,769 | (16,205,633) | 650,131,136 |
| මෝටර් වාහන | 44,046,800 | 8,150,000 | - | 52,196,800 | - | 52,196,800 |
| යතුරු පැදි | 100,000 | - | - | 100,000 | - | 100,000 |
| උපකරණ | 120,892,137 | 3,292,505 | (8,750) | 124,175,892 | (1,796,329) | 122,379,563 |
| පරිගණක උපාංග | 8,316,310 | 512,030 | (112,920) | 8,715,420 | (276,025) | 8,439,395 |
| ලී බඩු හා සවිකිරීම් | 18,507,862 | 2,316,598 | (3,025) | 20,821,435 | (177,925) | 20,643,510 |
| පාපැදි හා කරත්ත | 31,987 | - | - | 31,987 | - | 31,987 |
| මෙවලම් | 7,971,054 | - | (174,574) | 7,796,480 | (70,850) | 7,725,630 |
| පුස්තකාල ග්‍රන්ථ | 63,069 | - | - | 63,069 | - | 63,069 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | | | | | | |
| පුස්තකාල ග්‍රන්ථ | 2,435,973 | - | - | 2,435,973 | - | 2,435,973 |
| වත්කම්වල මුළු වටිනාකම | 1,206,187,197 | 76,065,324 | (1,530,269) | 1,280,722,252 | (18,526,762) | 1,262,195,490 |

ක්ෂය

| විස්තරය | 2013 .01.01 දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | විකිණීම්වලට අදාල සමුච්චිත ක්ෂය | හානිවූ හා අභාවිත ගැලපුම් | 2013 .01.01 දිනට ක්ෂය |
|---|---|---|---|---|---|
| ක්ෂය වන වත්කම් | | | | | |
| බදු ඉඩම් | 1,292,814 | 49,706 | - | - | 1,342,520 |
| භූමි අලංකරණ වියදම් | 1,611,220 | 61,751 | - | - | 1,672,971 |
| ගොඩනැගිලි | 74,781,051 | 32,319,735 | - | - | 107,100,786 |
| වාහන නවතන ගොඩනැගිල්ල | 472,047 | 277,555 | - | - | 749,602 |
| පිරියත හා යන්ත්‍ර | 195,565,153 | 54,463,311 | (45,316) | (139,299) | 249,843,849 |
| මෝටර් වාහන | 18,702,852 | 6,027,676 | - | - | 24,730,528 |
| යතුරු පැදි | 56,666 | 3,333 | - | - | 59,999 |
| උපකරණ | 70,816,308 | 20,381,013 | (3,000) | (217,592) | 90,976,729 |
| පරිගණක උපාංග | 5,965,077 | 879,842 | (26,146) | ( 71,160) | 6,747,613 |
| ලී බඩු හා සවිකිරීම් | 6,514,916 | 2,117,122 | (1,170) | ( 10,035) | 8,620,833 |
| පාපැදි හා කරත්ත | 9,596 | 4,798 | - | - | 14,394 |
| මෙවලම් | 4,682,984 | 643,596 | (104,806) | (18,600) | 5,203,174 |
| පුස්තකාල ග්‍රන්ථ | 46,849 | 8,473 | - | - | 55,322 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | | | | | |
| පුස්තකාල ග්‍රන්ථ | 2,435,973 | - | - | - | 2,435,973 |
| එකතුව | 382,953,506 | 117,237,910 | (180,438) | (456,686) | 499,554,292 |

ලියාපදිංචි අගය

| විස්තරය | 2013.12.31 දිනට ශේෂය |
|---|---|
| ක්ෂය වන වත්කම් | |
| බදු ඉඩම් | 3,578,325 |
| භූමි අලංකරණ වියදම් | 4,440,417 |
| ගොඩනැගිලි | 278,743,345 |
| වාහන නවතන ගොඩනැගිල් | 420,461 |
| පිරියත හා යන්ත්‍ර | 400,287,287 |
| මෝටර් වාහන | 27,466,272 |
| යතුරු පැදි | 40,001 |
| උපකරණ | 31,402,834 |
| පරිගණක උපාංග | 1,691,782 |
| ලී බඩු හා සවිකිරීම් | 12,022,677 |
| පාපැදි හා කරත්ත | 17,593 |
| මෙවලම් | 2,522,456 |
| පුස්තකාල ග්‍රන්ථ | 7,748 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | |
| පුස්තකාල ග්‍රන්ථ | - |
| එකතුව | 762,641,198 |

### 2012

පිරිවැය

| විස්තරය | 2012.01.01දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම | වර්ෂය තුළ විකිණීම | 2012.12.31 දිනට ශේෂය | හානි වූ හා අභාවිත ගැලපුම් | හානි වූ හා අභාවිත ගැලපූ පසු 2012.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| ක්ෂය වන වත්කම් | | | | | | |
| බදු ඉඩම් | 4,920,845 | - | - | 4,920,845 | | 4,920,845 |
| භූමි අලංකරණ වියදම් | 6,113,388 | - | - | 6,113,388 | | 6,113,388 |
| ගොඩනැගිලි | 340,956,701 | 2,958,898 | - | 343,915,599 | | 343,915,599 |
| වාහන නවතන ගොඩනැගිල්ල | 598,433 | 571,630 | - | 1,170,063 | | 1,170,063 |
| පිරියත හා යන්ත්‍ර | 598,838,071 | 48,864,038 | - | 647,702,108 | (16,929,633) | 630,772,475 |
| මෝටර් වාහන | 39,196,800 | 5,600,000 | (750,000) | 44,046,800 | | 44,046,800 |
| යතුරු පැදි | 100,000 | - | - | 100,000 | | 100,000 |
| උපකරණ | 115,347,221 | 5,544,916 | - | 120,892,137 | (1,529,339) | 119,362,797 |
| පරිගණක උපාංග | 6,580,579 | 1,735,731 | - | 8,316,310 | (266,275) | 8,050,035 |
| ලී බඩු හා සවිකිරීම් | 15,614,894 | 2,892,968 | - | 18,507,862 | (154,375) | 18,353,487 |
| පාපැදි හා කරත්ත | 31,987 | - | - | 31,987 | | 31,987 |
| මෙවලම් | 7,963,554 | 7,500 | - | 7,971,054 | (48,900) | 7,922,154 |
| පුස්තකාල ග්‍රන්ථ | 63,069 | - | - | 63,069 | | 63,069 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | | | | | | |
| පුස්තකාල ග්‍රන්ථ | 2,435,973 | - | - | 2,435,973 | | 2,435,973 |
| වත්කම්වල මුළු වටිනාකම | 1,138,761,515 | 68,175,681 | (750,000) | 1,206,187,196 | (18,928,522) | 1,187,258,674 |

ක්ෂය

| විස්තරය | 2012 .01.01 දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | විකිණීම්වලට අදාල සමුච්චිත ක්ෂය | හානිවූ හා අභාවිත ගැලපුම් | 2012 .01.01 දිනට ක්ෂය |
|---|---|---|---|---|---|
| ක්ෂය වන වත්කම් | | | | | |
| බදු ඉඩම් | 1,243,108 | 49,706 | - | - | 1,292,814 |
| භූමි අලංකරණ වියදම් | 1,549,469 | 61,751 | - | - | 1,611,220 |
| ගොඩනැගිලි | 43,952,982 | 30,828,069 | - | - | 74,781,051 |
| වාහන නවතන ගොඩනැගිල්ල | 194,492 | 277,555 | - | - | 472,047 |
| පිරියත හා යන්ත්‍ර | 146,449,228 | 51,605,243 | - | (2,489,318) | 195,565,153 |
| මෝටර් වාහන | 15,087,676 | 3,990,176 | (375,000) | - | 18,702,852 |
| යතුරු පැදි | 53,333 | 3,333 | - | - | 56,666 |
| උපකරණ | 51,706,955 | 19,963,647 | - | (854,295) | 70,816,308 |
| පරිගණක උපාංග | 3,633,407 | 2,465,380 | - | (133,710) | 5,965,077 |
| ලී බඩු හා සවිකිරීම් | 4,683,423 | 1,867,050 | - | (35,558) | 6,514,916 |
| පාපැදි හා කරත්ත | 4,798 | 4,798 | - | - | 9,596 |
| මෙවලම් | 3,934,264 | 776,201 | - | (27,480) | 4,682,984 |
| පුස්තකාල ග්‍රන්ථ | 37,280 | 9,569 | - | - | 46,849 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | | | | | |
| පුස්තකාල ග්‍රන්ථ | 2,435,973 | - | - | - | 2,435,973 |
| එකතුව | 274,966,389 | 111,902,478 | (375,000) | (3,540,360) | 382,953,507 |

ලියාපදිංචි අගය

| විස්තරය | 2012.12.31 දිනට ශේෂය |
|---|---|
| ක්ෂය වන වත්කම් | |
| බදු ඉඩම් | 3,628,031 |
| භූමි අලංකරණ වියදම් | 4,502,168 |
| ගොඩනැගිලි | 269,134,548 |
| වාහන නවතන ගොඩනැගිල් | 698,016 |
| පිරියත හා යන්ත්‍ර | 435,207,322 |
| මෝටර් වාහන | 25,343,948 |
| යතුරු පැදි | 43,334 |
| උපකරණ | 48,546,489 |
| පරිගණක උපාංග | 2,084,957 |
| ලී බඩු හා සවිකිරීම් | 11,838,572 |
| පාපැදි හා කරත්ත | 22,391 |
| මෙවලම් | 3,239,170 |
| පුස්තකාල ග්‍රන්ථ | 16,220 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | |
| පුස්තකාල ග්‍රන්ථ | - |
| එකතුව | 804,305,166 |

## 02 සටහන
## අස්පෘශ්‍ය වත්කම්

### 2013

පිරිවැය

| විස්තරය | 2013.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | වර්ෂය තුළ විකිණීම් | 2013.12.31 දිනට ශේෂය | හානිවූ හා අභාවිත ගැලපුම් | හානි වූ හා අභාවිත ගැලපුම් වලට පසු 2013.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 14,450,726 | 983,416 | - | 15,434,142 | (50,000) | 15,384,142 |
| | | | | | | |
| වත්කම්වල මුළු වටිනාකම | 14,450,726 | 983,416 | - | 15,434,142 | (50,000) | 15,384,142 |

ක්ෂය

| විස්තරය | 2013.01.01 සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | විකුණුම්වලට අදාල ක්ෂය | හානිවූ හා අභාවිත ගැලපුම් | 2013.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 14,001,779 | 304,363 | - | - | 14,306,142 |
| | | | | | |
| එකතුව | 14,001,779 | 304,363 | - | - | 14,306,142 |

ලියාහල අගය

| විස්තරය | 2013.12.31 දිනට ශේෂය |
|---|---|
| පරිගණක මෘදුකාංග | 1,078,000 |
| එකතුව | 1,078,000 |

### 2012

පිරිවැය

| විස්තරය | 2012.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | වර්ෂය තුළ විකිණීම් | 2012.12.31 දිනට ශේෂය | හානිවූ හා අභාවිත ගැලපුම් | හානි වූ හා අභාවිත ගැලපුම් වලට පසු 2012.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 13,912,326 | 538,400 | - | 14,450,726 | (50,000) | 14,400,726 |
| | | | | | | |
| වත්කම්වල මුළු වටිනාකම | 13,912,326 | 538,400 | - | 14,450,726 | (50,000) | 14,400,726 |

ක්ෂය

| විස්තරය | 2012.01.01 සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | විකුණුම්වලට අදාල ක්ෂය | හානිවූ හා අභාවිත ගැලපුම් | 2012.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 5,638,119 | 5,649,289 | - | 2,714,371 | 14,001,779 |
| | | | | | |
| එකතුව | 5,638,119 | 5,649,289 | - | 2,714,371 | 14,001,779 |

ලියාහල අගය

| විස්තරය | 2012.12.31 දිනට ශේෂය |
|---|---|
| පරිගණක මෘදුකාංග | 398,947 |
| එකතුව | 398,947 |

**03 සටහන**

| වෙනත් ජංගම නොවන වත්කම් | 2013.12.31 දිනට | 2012.12.31 දිනට |
|---|---|---|
| තැන්පතු (සටහන) | 114,840 | 923,330 |
| ආරක්ෂක තැන්පතු | 261,265 | 248,552 |
| | 376,105 | 1,171,882 |

**සටහන**

| තැන්පතුවල විස්තර | | |
|---|---|---|
| මහාධිකරණයේ නඩුව - 32/RM/04/2010 | 9,840 | 743,330 |
| ඉන්ධන තැන්පතුව | 85,000 | 160,000 |
| ශ්‍රී ලංකා ටෙලිකොම් ජාත්‍ය. සෘජු ඇමතුම් පහසුකම | 20,000 | 20,000 |
| | 114,840 | 923,330 |

**04 සටහන**

| තොග | 2013.12.31 දිනට | 2012.12.31 දිනට |
|---|---|---|
| අමුද්‍රව්‍ය | 245,457,246 | 317,474,081 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 22,717,688 | 26,097,773 |
| නිමි භාණ්ඩ | 134,839,374 | 123,249,293 |
| නොනිමි වැඩ | 61,357,267 | 73,818,634 |
| මාර්ගස්ථ තොග - අමුද්‍රව්‍ය | 12,296,168 | 28,802,547 |
| පිරියත හා යන්ත්‍ර අමතර කොටස් | 82,674,541 | 76,382,804 |
| ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය | 1,222,083 | 1,025,186 |
| ලිපිද්‍රව්‍ය තොග | 684,106 | 709,247 |
| | 561,248,472 | 647,559,566 |

**05 සටහන**

| වෙළඳ ණයගැතියෝ සහ අයවිය යුතු දේ | 2013.12.31 දිනට | 2012.12.31 දිනට |
|---|---|---|
| ණයගැතියෝ - රාජ්‍ය ඖෂධ සංස්ථාව | 1,296,680 | 54,405,818 |
| ණයගැතියෝ - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 404,315,959 | 217,151,210 |
| ණයගැතියෝ - බෙදාහරින්නෝ | 66,498,813 | 570,257 |
| (-) අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය | (570,257) | (570,257) |
| ණයගැති පාලන ගිණුම - පොදු | 3,360 | - |
| ආපදා ණය | 20,854,961 | 20,379,312 |
| පාපැදි ණය | 104,562 | 102,959 |
| කාර්ය මණ්ඩල ණය | 95,334 | 63,333 |
| උත්සව අත්තිකාරම් | 340,600 | 256,000 |
| ආනයන තැන්පතු ප්‍රතිපූරණ | 245,000 | 313,506 |
| ලැබියයුතු රක්ෂණ වන්දි - හානි වූ අමුද්‍රව්‍ය | 20,041 | 55,712 |
| වැඩියෙන් ගෙවන ලද ලැබිය යුතු වැටුප් | 14,480 | 627,287 |
| භාණ්ඩ තොග - දෙන ලද ණය, ණය පදනම මත දුන් අමුද්‍රව්‍ය තොග | 2,845 | 18,576 |
| | 493,222,377 | 293,373,713 |

**06 සටහන**

| පූර්ව ගෙවීම් | 2013.12.31 දිනට | 2012.12.31 දිනට |
|---|---|---|
| අත්තිකාරම් ගෙවීම් | 1,695,305 | 709,995 |
| අත්තිකාරම් ගෙවීම් - යන්ත්‍ර සූත්‍ර සහ අමතර කොටස් | 26,473,484 | - |
| පූර්ව ගෙවීම් | 3,674,090 | 3,576,924 |
| කාර්යමණ්ඩලයට කළ පූර්ව ගෙවීම්වල පිරිවැය | 4,202,295 | 1,693,238 |
| | 36,045,173 | 5,980,156 |

07 සටහන

| වෙනත් මූල්‍ය වත්කම් | 2013.12.31 දිනට | 2012.12.31 දිනට |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | 404,981,262 | 187,205,975 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් | 8,622,394 | 7,746,052 |
| භාරකාරත්ව අරමුදල තුළ ආයෝජන | 16,292,870 | 15,739,068 |
| | 429,896,526 | 210,691,094 |

08 සටහන

| අත ඇති හා බැංකුවේ ඇති මුදල් | 2013.12.31 දිනට | 2012.12.31 දිනට |
|---|---|---|
| ලංකා බැංකුව රත්මලාන ශාඛාව | 299,207 | 1,012,942 |
| ලංකා බැංකුව ආයතනික ශාඛාව | 7,869,329 | 4,812,740 |
| මහජන බැංකුව රත්මලාන ශාඛාව | 167,870 | 85,469 |
| මහජන බැංකුව ආයතනික ශාඛාව | 297,572 | 35,858 |
| අතැති මුදල් | 26,840 | 3,385 |
| සුළු මුදල් | 10,000 | 351 |
| | 8,670,818 | 5,950,745 |

09 සටහන

**ප්‍රකාශිත ප්‍රාග්ධනය**

ප්‍රකාශිත ප්‍රාග්ධනය සෑදී ඇත්තේ රුපියල් 476,904,000.00 ක් වටිනා රුපියල් 0.186 බැගින් පරිවර්තනය කරන ලද ජපන් යෙන් මිලියන 2564 ක ප්‍රදානයකින්, මහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් රුපියල් 208,375,000.00 ක මුදලකින් සහ රාජ්‍ය ඖෂධ සංස්ථාව විසින් පවරන ලද ඉඩම් වල වටිනාකම වූ රුපියල් 4,800,000.00 කින්ය.

10 සටහන

| විලම්බිත බදු බැරකම | 2013.12.31 දිනට | 2012.12.31 දිනට |
|---|---|---|
| වර්ෂයේ ආරම්භක ශේෂය | 158,766,584 | 231,073,453 |
| ශ්‍රී.ල.මූ.වා.ප්‍ර ගැලපුම් කිරීම්වලින් ආරම්භක ශේෂයට බලපෑම | - | (59,556,341) |
| වර්ෂය තුල විලම්බිත බදු බැරකම - හඳුනාගත්/(ලියාහල) අගය | (17,810,042) | (12,750,528) |
| | 140,956,542 | 158,766,584 |

11 සටහන

| වෙළඳ ණයහිමියෝ හා අනෙකුත් ගෙවීම් | 2013.12.31 දිනට | 2012.12.31 දිනට |
|---|---|---|
| මිලට ගැනීම් ප්‍රතිපාදනය - ආනයනිත අමුද්‍රව්‍ය | (962,378) | (800,662) |
| මිලට ගැනීම් ප්‍රතිපාදනය - ඇසුරුම් ද්‍රව්‍ය | (23,007) | - |
| ණයහිමි පාලනය - ඇසුරුම් ද්‍රව්‍ය | 8,090,828 | 5,984,901 |
| ණයහිමි පාලනය - අමුද්‍රව්‍ය | 4,895,773 | 10,072,825 |
| ණයහිමි පාලනය - ලිපිද්‍රව්‍ය | 168,686 | 728,197 |
| ණයහිමි පාලනය - උපකරණ හා යන්ත්‍රසූත්‍ර | 5,728,347 | 8,668,352 |
| ණයහිමි පාලනය - රසායනික ද්‍රව්‍ය | 2,289,768 | 1,158,088 |
| ණයහිමි පාලනය - නිශ්කාශන | - | 30,162 |
| ණයහිමි පාලනය - සුභසාධන | 110,316 | 131,065 |
| ණයහිමි පාලනය - පොදු | 5,787,593 | 7,420,709 |
| ණයහිමි පාලනය - බැංකු | 18,408,466 | 16,232,155 |
| ණයහිමි පාලනය - සේවක | 106,388 | 1,390,056 |
| ණයහිමි පාලනය - සේවා | 4,355,276 | 3,561,383 |
| ණයහිමි පාලනය - අනෙකුත් ස්ථාවර වත්කම් | 24,637,178 | 20,955,949 |
| තැම්පත්කරුවන් වෙත ගෙවිය යුතු - අයකැමියෝ | 9,716 | 9,243 |
| තැම්පත්කරුවන් වෙත ගෙවිය යුතු - ගබඩා සහකාරවරු | 251,549 | 239,308 |
| ගෙවිය යුතු ටෙන්ඩර් බැඳුම්කර | 4,068,450 | 4,136,299 |
| ගෙවිය යුතු 1/3 එකතු කල අගය මත බදු | 633,049 | 633,048 |
| ගෙවිය යුතු මුද්දර බදු | (175) | (25) |
| ගෙවිය යුතු සේවක අර්ථසාධක හා භාර අරමුදල් දායකත්වය 25% | 107,457 | 106,790 |
| විවිධ අය කර ගැනීම් | - | (6,900) |
| වැටුප් පාලන ගිණුම | 1,029,867 | 676,613 |
| | 79,693,150 | 81,327,558 |

12 සටහන
අසම්භාව්‍ය බැරකම්

<u>කම්කරු විනිශ්චය සභා නඩුව - 32/ආර්.එම්./04/2010</u>

කම්කරු විනිශ්චය සභාවේ නඩු අංක 32/ආර්.එම්/04/2010 ජ්‍යෙෂ්ඨ නිෂ්පාදන සහකාරවරයෙක් වන්දියක් හෝ හිඟ වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභද සහිතව යලි සේවයේ පිහිටුවන ලෙස ඉල්ලමින් ගල්කිස්ස කම්කරු විනිශ්චය සභාවෙහි නඩුවක් පවරා ඇත. මෙය මූල්‍ය ප්‍රකාශය තුළ ජංගම බැරකම් යටතේ හිඟ වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ වෙනුවෙන් ප්‍රතිලාභ සලසා ඇත. කෙසේ වුවත් වන්දි ගෙවීමක් සඳහා කිසිදු බැරකමක් මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රතිපාදන කර නොමැත.

<u>13 සටහන</u>

| ආදායම | 2013 වර්ෂය සඳහා | 2012 වර්ෂය සඳහා |
|---|---|---|
| අලෙවිය - රාජ්‍ය ඖෂධ සංස්ථාව | 9,605,490 | 412,413,224 |
| අලෙවිය - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 1,412,132,433 | 1,000,705,824 |
| අලෙවිය - බෙදාහරින්නන් | 519,445,028 | - |
| අලෙවිය - අපනයන | - | 1,427,937 |
| | 1,941,182,950 | 1,414,546,985 |

14 සටහන

| විකුණුම් පිරිවැය | | 2013 වර්ෂය සඳහා | 2012 වර්ෂය සඳහා යලි ප්‍රකාශිත | 2012 වර්ෂය සඳහා |
|---|---|---|---|---|
| විකුණුම් පිරිවැය - රාජ්‍ය ඖෂධ සංස්ථාව - නව | සටහන (අ) | 7,836,919 | 299,874,051 | 299,874,051 |
| විකුණුම් පිරිවැය - රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව - නව | | 346,531,974 | - | - |
| විකුණුම් පිරිවැය - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - නව | | 1,009,279,551 | 745,836,307 | 745,836,307 |
| විකුණුම් පිරිවැය - අපනයන - නව | | - | 821,873 | 821,873 |
| විකුණුම් පිරිවැය - අමුද්‍රව්‍ය | | 47,381 | 181,302 | 181,302 |
| විකුණුම් පිරිවැය - ඉන්වොයිසි විචලනය | | (314,317) | 1,884,902 | 1,884,902 |
| තොග ගණන් ගැනීමේ ගැලපුම් - නිමි භාණ්ඩ | | (1,000,934) | (2,256) | (2,256) |
| නිෂ්පාදන වියදම් ( සටහන 22 ) | | 151,518,839 | 147,469,690 | 171,927,035 |
| | | 1,513,899,412 | 1,196,065,869 | 1,220,523,214 |

සටහන (අ)

| විකුණුම් පිරිවැය | අමුද්‍රව්‍ය පිරිවැය | ශ්‍රම පිරිවැය | පොදුකාර්ය පිරිවැය | එකතුව |
|---|---|---|---|---|
| විකුණුම් පිරිවැය - රාජ්‍ය ඖෂධ සංස්ථාව - නව | 7,498,068 | 94,753 | 244,098 | 7,836,919 |
| විකුණුම් පිරිවැය - රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව - නව | 327,673,398 | 5,396,527 | 13,462,050 | 346,531,974 |
| විකුණුම් පිරිවැය - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - නව | 972,099,735 | 10,530,099 | 26,649,717 | 1,009,279,551 |

15 සටහන

| වෙනත් මෙහෙයුම් ආදායම් | 2013 වර්ෂය සඳහා | 2012 වර්ෂය සඳහා |
|---|---|---|
| විවිධ ආදායම් | 4,711,151 | 3,754,275 |
| අමුද්‍රව්‍ය හා නිමිභාණ්ඩ විකුණුම් | 62,037 | 345,520 |
| විනිමය ලාභ | 1,297,539 | 347,108 |
| අඩමාන ණය සඳහා වූ අධි ප්‍රතිපාදනය | - | 181,148 |
| වත්කම් විකිණීමෙන් ලද ලාභය හෝ අලාභය | (87,464) | 1,025,000 |
| හානිවූ අමුද්‍රව්‍ය සඳහා රක්ෂණ වන්දි | - | 1,223,049 |
| | 5,983,263 | 6,876,100 |

16 සටහන

| පරිපාලන වියදම් | 2013 වර්ෂය සඳහා | 2012 වර්ෂය සඳහා යලි ප්‍රකාශිත | 2012 වර්ෂය සඳහා |
|---|---|---|---|
| වැටුප් හා වේතන | 15,384,253 | 15,228,079 | 15,228,079 |
| අනියම් සේවක වැටුප් | 174,875 | 162,750 | 162,750 |
| ජීවන වියදම් දීමනාව | 3,467,886 | 4,028,310 | 4,028,310 |
| ප්‍රවාහන දිරිදීමනා | 3,291,137 | 3,276,004 | 3,276,004 |
| සේවක අර්ථසාධක හා භාර අරමුදල් ගෙවීම් - 15% | 2,465,855 | 2,847,853 | 2,847,853 |
| අතිකාල | 2,322,909 | 1,873,478 | 1,873,478 |
| පැමිණීමේ දිරිදීමනාව | 2,556,952 | 2,346,685 | 2,346,685 |
| කාර්යසාධන දිරිදීමනාව | 5,459,563 | 5,214,784 | 5,214,784 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 506,055 | 390,000 | 390,000 |
| වර්තමාන පාරිතෝෂික පිරිවැය | 469,173 | (269,410) | (269,410) |
| සේවාමුර දිරිදීමනාව | 133,400 | 123,300 | 123,300 |
| කාර්ය මණ්ඩල පිරිවැය | 573,286 | 488,273 | 488,273 |
| සේවක මණ්ඩල වෛද්‍ය වියදම් | 837,495 | 925,703 | 925,703 |
| නිවාස ණය පොළී ප්‍රතිපූරණය | 541,863 | 507,140 | 507,140 |
| විශේෂ වැඩබැලීමේ දිරිදීමනාව | 84,000 | 84,000 | 84,000 |
| උපයන විට ගෙවීමේ බද්ද | 477,737 | 356,651 | 356,651 |
| දුරකථන බිල්පත් ප්‍රතිපූරණය | 211,414 | 160,183 | 160,183 |
| සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | 1,087,624 | 1,001,955 | 1,001,955 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | 4,539,689 | 4,365,227 | 4,365,227 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 1,035,162 | 1,753,340 | 1,753,340 |
| නිල ඇඳුම් හා පාවහන් | 346,166 | 252,637 | 252,637 |
| ගමන් බිමන් - විදේශ | 489,727 | 559,962 | 559,962 |
| අධ්‍යක්ෂ ගාස්තු | 796,397 | 619,070 | 619,070 |
| වෙනත් දිරිදීමනා | 1,349,025 | 1,379,965 | 1,379,965 |
| වරිපනම් හා බදු | 276,231 | 496,114 | 165,371 |
| විදුලිය | 11,731,003 | 10,101,028 | 3,367,009 |
| ජල ගාස්තු | 663,010 | 502,186 | 167,395 |
| රක්ෂණය | 1,128,822 | 971,014 | 793,276 |
| මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තුව | 2,597,090 | 2,479,825 | 2,479,825 |
| වාහන සඳහා ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය | 2,644,272 | 1,749,357 | 1,749,357 |
| උපකරණ නඩත්තුව | 1,126,024 | 899,119 | 718,122 |
| නඩත්තු - පරිපාලන | 1,305,067 | 1,227,732 | 758,123 |
| නඩත්තු වියදම් - ගොඩනැගිලි | - | 398,145 | 398,145 |
| ක්ෂය | 22,961,607 | 21,313,876 | 5,084,426 |
| ප්‍රවාහන ගාස්තු | 573,615 | 809,054 | 809,054 |
| තැපැල් හා ෆැක්ස් ගාස්තු | 181,721 | 156,150 | 156,150 |
| දුරකථන ගාස්තු | 825,123 | 797,109 | 797,109 |
| ආරක්ෂක ගාස්තු | 2,888,591 | 2,558,980 | 2,558,980 |
| පරිත්‍යාග | 1,234,772 | - | - |
| බලපත්‍ර ගාස්තු - මෝටර් වාහන | 94,335 | 39,563 | 39,563 |
| බලපත්‍ර ගාස්තු - ඖෂධ | 680,296 | 645,443 | 645,443 |
| බලපත්‍ර ගාස්තු - වෙනත් | 1,120 | 7,214 | 7,214 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 3,312,143 | 1,695,932 | 1,695,932 |
| කාර්යාල වියදම් | 78,432 | 18,641 | 18,641 |
| විගණන ගාස්තුව | 455,398 | 312,384 | 312,384 |

| | | | |
|---|---|---|---|
| කුළී ගාස්තු | 836,807 | 416,247 | 416,247 |
| ප්‍රචාරක දැන්වීම් | 874,048 | 2,027,783 | 2,027,784 |
| වෙළඳ දායකත්වයන් හා වාර සඟරා | 131,055 | 124,770 | 124,770 |
| නීති හා පරීක්ෂණ වියදම් | 218,912 | 153,572 | 153,572 |
| වෘත්තීයවේදී ගාස්තු | 129,054 | 1,510,734 | 1,510,734 |
| සංග්‍රහ වියදම් | 88,008 | 61,547 | 61,547 |
| වාර්ෂික දායකත්වයන් | 59,960 | 51,636 | 51,636 |
| වාර්ෂික සම්මන්ත්‍රණ හා රැස්වීම් | 31,000 | 14,300 | 14,300 |
| මුද්දර ගාස්තු | 38,550 | 3,325 | 3,325 |
| හානි වූ හා අභාවිත පිරිවැය | 332,154 | 7,628,787 | 7,628,787 |
| තොග ගනන් ගැනීමේ ගැලපුම්-ලිපි ද්‍රව්‍ය | (3,664) | (100) | (100) |
| | 106,096,193 | 106,847,406 | 82,390,062 |

| 17 සටහන | 2013 වර්ෂය සඳහා | 2012 වර්ෂය සඳහා |
|---|---|---|
| **අලෙවි හා බෙදාහැරීම් වියදම්** | | |
| ප්‍රවර්ධන වට්ටම් | 9,556,014 | - |
| විකුණුම් ප්‍රවර්ධන වියදම් | 11,752,789 | 11,111,731 |
| ආනයන වියදම් | - | 89,741 |
| ප්‍රතික්ෂේපිත නිමි භාණ්ඩ වල පිරිවැය | - | 22,414 |
| 25 වන සංවත්සර සැමරුම් වියදම් | - | 12,850,034 |
| | 21,308,804 | 24,073,920 |

| 18 සටහන | 2013 වර්ෂය සඳහා | 2012 වර්ෂය සඳහා |
|---|---|---|
| **වෙනත් මෙහෙයුම් වියදම්** | | |
| සංයෝජන, පර්යේෂණ හා සංවර්ධන වියදම් | 1,685,541 | 9,143,696 |
| | 1,685,541 | 9,143,696 |

| 19 සටහන | 2013 වර්ෂය සඳහා | 2012 වර්ෂය සඳහා |
|---|---|---|
| **මූල්‍ය වියදම්** | | |
| බැංකු ගාස්තු | 417,142 | 531,774 |
| අයිරා පොළිය | 1,718 | 5,845 |
| සේවක පොළී පිරිවැය | 1,847,604 | 1,869,526 |
| | 2,266,464 | 2,407,144 |

| 20 සටහන | 2013 වර්ෂය සඳහා | 2012 වර්ෂය සඳහා |
|---|---|---|
| **මූල්‍ය ආදායම** | | |
| කාර්ය මණ්ඩල ණය පොළිය | 695,662 | 634,675 |
| භාණ්ඩාගාර බිල්පත් පොළිය | 25,314,785 | 31,843,823 |
| විලම්බිත ආදායම | 14,263 | 14,263 |
| පොළී ආදායම - කාර්ය මණ්ඩල ණය | 2,034,370 | 1,758,909 |
| | 28,059,081 | 34,251,670 |

| 21 සටහන | | |
|---|---|---|
| **ආදායම් බදු වියදම** | 2013 වර්ෂය සඳහා | 2012 වර්ෂය සඳහා |
| වර්තමාන බදු වියදම - 21 'අ' සටහන | 101,327,815 | 31,326,066 |
| විලම්බිත බදු වියදම - 21 'ආ' සටහන | (17,810,042) | (12,750,528) |
| ලාභාංශ බදු | 37,296,256 | - |
| | 120,814,029 | 18,575,538 |

| 21 'අ' සටහන | | |
|---|---|---|
| **වර්තමාන බදු වියදම** | 2013 වර්ෂය සඳහා | 2012 වර්ෂය සඳහා |
| වර්ෂයේ ලාභය මත බදු - 21 'අ' (i) සටහන | 100,783,856 | 31,326,066 |
| ආදායම් බදු අධි/ඌණ ප්‍රතිපාදනය | 543,959 | - |
| | 101,327,815 | 31,326,066 |

21 'අ' සටහන (1)

| වර්ෂයේ ලාභය මත බද්ද | 2013 වර්ෂය සඳහා | 2012 වර්ෂය සඳහා |
|---|---|---|
| බදු පෙර ලාභය | 329,968,880 | 117,136,719 |
| ඉඩ නොදෙන වියදම් | 123,379,811 | 125,243,031 |
| ඉඩදෙන වියදම් | (84,938,782) | (121,331,515) |
| බදු නිදහස් ආදායම | (25,314,785) | (31,843,823) |
| භාණ්ඩාගාර බිල්පත් පොළිය මත ආදායම් බදු | 28,127,539 | 35,382,026 |
| තක්සේරු ආදායම | 371,222,663 | 124,586,437 |
| බදු අය කළ හැකි ආදායම | 371,222,663 | 124,586,437 |
| බදු අය කළ හැකි ආදායම මත බදු අනුපාතිකය | 28% | 28% |
| අපනයන අලෙවි ආදායම මත බදු අනුපාතිකය | 12% | 12% |
| අපනයන අලෙවි ආදායම මත බදු | - | 14,950 |
| බදු අය කළ හැකි ආදායම මත ආදායම් බදු | 103,596,610 | 34,849,319 |
| නාමමාත්‍ර බදු | (2,812,754) | (3,538,203) |
| මුළු ආදායම් බද්ද | 100,783,856 | 31,326,066 |

21 අ සටහන

| විලම්බිත බදු | 2013 වර්ෂය සඳහා | 2012 වර්ෂය සඳහා |
|---|---|---|
| **වර්ෂයට අදළ විලම්බිත බද්ද/(ලියාහැරීම)** | | |
| විලම්බිත බදු බැරකම මත විලම්බිත බදු | 147,232,730 | 163,803,773 |
| විලම්බිත බදු වත්කම් මත විලම්බිත බදු | (6,276,188) | (5,037,189) |
| වර්ෂය අවසානයේදී විලම්බිත බදු බැරකම | 140,956,542 | 158,766,584 |
| වර්ෂය ආරම්භයේදී විලම්බිත බදු බැරකම | 158,766,584 | 171,517,112 |
| වර්ෂයට අදළ විලම්බිත බද්ද/(ලියාහැරීම) | (17,810,042) | (12,750,528) |

22 සටහන

| නිෂ්පාදන පිරිවැය | 2013 වර්ෂය සඳහා | උප සටහන | 2012 වර්ෂය සඳහා යලි ප්‍රකාශිත | 2012 වර්ෂය සඳහා |
|---|---|---|---|---|
| **සෘජු ශ්‍රමය (නිෂ්පාදනය)** | | | | |
| වැටුප් හා වේතන | 337,495 | සටහන 22 අ | (329,020) | (329,020) |
| අනියම් සේවක වැටුප් | - | සටහන 22 අ | 208 | 208 |
| ජීවන වියදම් දීමනාව | 96,383 | සටහන 22 අ | 404,076 | 404,076 |
| ප්‍රවාහන දිරිදීමනා | 541,600 | සටහන 22 අ | 322,400 | 322,400 |
| සේවක අර්ථ සාධක හා භාර අරමුදල් ගෙවීම් - 15% | 394,912 | සටහන 22 අ | 359,691 | 359,691 |
| අතිකාල | 1,046,075 | සටහන 22 අ | 2,677,293 | 2,677,293 |
| පැමිණීමේ දිරිදීමනාව | 3,864,188 | සටහන 22 අ | 3,510,523 | 3,510,523 |
| කාර්යසාධන දිරිදීමනාව | 6,539,410 | සටහන 22 අ | 8,489,654 | 8,489,654 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 70,695 | සටහන 22 අ | 627,375 | 627,375 |
| වර්තමාන පාරිතෝෂික පිරිවැය | 496,982 | සටහන 22 අ | (350,038) | (350,038) |
| සේවාමුර දිරිදීමනාව | 1,498,750 | | 1,440,250 | 1,440,250 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම් | 446,624 | සටහන 22 අ | 1,229,132 | 1,229,132 |
| නිවාස ණය පොළී ප්‍රතිපූර්ණය | 941,801 | | 915,561 | 915,561 |
| කාර්ය මණ්ඩල පිරිවැය | 887,799 | | 757,386 | 757,386 |
| | 17,162,715 | | 20,054,491 | 20,054,491 |
| **වක්‍ර නිෂ්පාදන පිරිවැය (තත්ව පාලන/ පර්යේෂණ/ සැලසුම් /නඩත්තු)** | | | | |
| වැටුප් හා වේතන | 5,315,842 | සටහන 22 අ | 14,758,093 | 14,758,093 |
| අනියම් සේවක වැටුප් | 287,694 | සටහන 22 අ | 579,075 | 579,075 |
| ජීවන වියදම් දීමනාව | 2,003,711 | සටහන 22 අ | 3,983,460 | 3,983,460 |
| ප්‍රවාහන දිරිදීමනා | 1,259,253 | සටහන 22 අ | 2,357,300 | 2,357,300 |
| සේවක අර්ථසාධක හා භාර අරමුදල් ගෙවීම් - 15% | 2,050,397 | සටහන 22 අ | 2,886,363 | 2,886,363 |
| අතිකාල | 2,296,559 | සටහන 22 අ | 1,885,472 | 1,885,472 |
| පැමිණීමේ දිරිදීමනාව | 2,793,442 | | 2,420,146 | 2,420,146 |
| කාර්යසාධන දිරිදීමනාව | 6,708,083 | සටහන 22 අ | 5,596,077 | 5,596,077 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 601,180 | | 424,397 | 424,397 |
| වර්තමාන පාරිතෝෂික පිරිවැය | 373,077 | | (49,206) | (49,206) |
| සේවාමුර දිරිදීමනාව | 347,000 | | 319,000 | 319,000 |
| කාර්ය මණ්ඩල පිරිවැය | 573,286 | | 513,250 | 513,250 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම් | 990,542 | | 858,646 | 858,646 |
| නිවාස ණය පොළී ආපසු ගෙවීම් | 713,216 | | 549,924 | 549,924 |
| උපයන විට ගෙවීමේ බද්ද | 540,910 | | 367,823 | 367,823 |
| දුරකථන බිල්පත් ප්‍රතිපූරණය | 11,035 | | 10,059 | 10,059 |
| සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | 2,881,772 | | 2,679,139 | 2,679,139 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | 3,420,898 | සටහන 22 අ | 10,885,782 | 10,885,782 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 1,590,984 | සටහන 22 අ | 2,046,322 | 2,046,322 |
| නිල ඇඳුම් හා පාවහන් | 503,586 | සටහන 22 අ | 460,811 | 460,811 |
| ජල ගාස්තු | 150,178 | සටහන 22 අ | (334,791) | - |
| වරිපනම් හා බදු | (513,060) | සටහන 22 අ | 41,343 | 372,085 |
| විදුලිය | - | සටහන 22 අ | (6,734,019) | - |
| රක්ෂණය | - | සටහන 22 අ | 567,366 | 745,105 |

| | | | | |
|---|---|---|---|---|
| උපකරණ නඩත්තුව | 5,016 | සටහන 22 අ | 454,474 | 635,471 |
| නඩත්තු - නිෂ්පාදන | 284,279 | සටහන 22 අ | 4,055,757 | 4,525,366 |
| ගොඩනැගිලි නඩත්තුව | 171,521 | | 9,400 | 9,400 |
| ක්ෂය | 94,580,667 | | 75,367,053 | 91,596,503 |
| ප්‍රවාහන ගාස්තු | 792,276 | සටහන 22 අ | 1,507,135 | 1,507,135 |
| වන්දි | 400,000 | | - | - |
| අමතර කොටස් පරිභෝජනය | - | සටහන 22 අ | - | - |
| ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය පරිභෝජනය | - | සටහන 22 අ | - | - |
| යන්ත්‍ර සූත්‍ර නඩත්තුව හා අළුත්වැඩියාව | - | සටහන 22 අ | 69,271 | 69,271 |
| තත්ත්ව පාලන වියදම් | 135,506 | සටහන 22 අ | 2,048,213 | 2,048,213 |
| අමුද්‍රව්‍ය විනාශ කිරීමේ වියදම් | 606,606 | | | |
| ප්‍රතික්ෂේපිත අමුද්‍රව්‍යවල පිරිවැය | 525,269 | | 13,170 | 13,170 |
| ප්‍රතික්ෂේපිත ඇසුරුම් ද්‍රව්‍යවල පිරිවැය | 1,002,480 | | 90,170 | 90,170 |
| ප්‍රතික්ෂේපිත නොනිමි ද්‍රව්‍යවල පිරිවැය | 1,196,977 | | | |
| හානි වූ අමුද්‍රව්‍යවල පිරිවැය | (24,000) | | (24,000) | (24,000) |
| අමුද්‍රව්‍ය ගැලපුම - සාමාන්‍ය ඖෂධ | 131,168 | | 19,498 | 19,498 |
| අමුද්‍රව්‍ය ගැලපුම - පෙනිසිලින් ඖෂධ | (104,977) | | - | - |
| ඇසුරුම් ද්‍රව්‍ය ගැලපුම | 13 | | | |
| අමතර කොටස් ගැලපුම | - | | (443,441) | (443,441) |
| අමුද්‍රව්‍ය ගැලපුම - තොග සත්‍යාපනය | 216,897 | | (186,537) | (186,537) |
| ඇසුරුම් ද්‍රව්‍ය ගැලපුම- තොග සත්‍යාපනය | 4,634 | | (170,564) | (170,564) |
| තොග සත්‍යාපන ගැලපුම - නඩත්තු | (498,750) | | (2,535,276) | (2,535,276) |
| තොග සත්‍යාපන ගැලපුම - නොනිමි වැඩ | 30,958 | | 69,041 | 69,041 |
| විකුණුම් පිරිවැයට මාරුකරන ලද නිෂ්පාදන පිරිවැයට අවශෝෂණය කර නොගත් පිරිවැය | 151,518,838 | | 147,469,690 | 171,927,035 |

22 'අ' සටහන

| නිෂ්පාදන පිරිවැය | අවශෝෂණය නොකල පිරිවැය | විකුණුම් පිරිවැය සඳහා අවශෝෂණය කල පිරිවැය | එකතුව 2013 | 2012 වර්ෂය සඳහා යලි ප්‍රකාශිත | එකතුව 2012 |
|---|---|---|---|---|---|
| **සෘජු ශ්‍රමය (නිෂ්පාදන)** | | | | | |
| වැටුප් හා වේතන | 337,495 | 21,083,508 | 21,421,003 | 20,491,360 | 20,491,360 |
| අනියම් සේවක වැටුප් | - | 1,356,191 | 1,356,191 | 911,576 | 911,576 |
| ජීවන වියදම් දීමනාව | 96,383 | 6,688,831 | 6,785,214 | 5,970,900 | 5,970,900 |
| ප්‍රවාහන දිරිදීමනා | 541,600 | 2,749,685 | 3,291,285 | 3,284,429 | 3,284,429 |
| සේවක අර්ථසාධක හා භාර අරමුදල් ගෙවීම් - 15% | 394,912 | 4,029,362 | 4,424,275 | 4,155,658 | 4,155,658 |
| අතිකාල | 1,046,075 | 4,474,475 | 5,520,550 | 4,515,520 | 4,515,520 |
| පැමිණීමේ දිරිදීමනාව | 3,864,188 | 349,283 | 4,213,472 | 3,475,028 | 3,475,028 |
| කාර්යසාධන දිරිදීමනාව | 6,539,410 | 2,392,294 | 8,931,704 | 8,455,222 | 8,455,222 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 70,695 | 706,700 | 777,395 | 627,375 | 627,375 |
| වර්තමාන පාරිතෝෂික පිරිවැය | 496,982 | - | 496,982 | (350,038) | (350,038) |
| සේවාමුර දිරිදීමනාව | 1,498,750 | - | 1,498,750 | 1,438,700 | 1,438,700 |
| සේවක මණ්ඩල වෛද්‍ය වියදම් | 446,624 | 831,064 | 1,277,688 | 1,217,836 | 1,217,836 |
| නිවාස ණය පොළී ප්‍රතිපූරණය | 941,801 | - | 941,801 | 915,561 | 915,561 |
| සේවක මණ්ඩල පිරිවැය | 887,799 | - | 887,799 | - | - |
| | 17,162,715 | 44,661,394 | 61,824,109 | 55,109,126 | 55,109,126 |
| **වක්‍ර නිෂ්පාදන පිරිවැය (තත්ව පාලන/ පර්යේෂණ/ සැලසුම් /නඩත්තු)** | | | | | |
| වැටුප් හා වේතන | 5,315,842 | 11,721,718 | 17,037,560 | 14,651,323 | 14,651,323 |
| අනියම් සේවක වැටුප් | 287,694 | 239,009 | 526,703 | 579,075 | 579,075 |
| ජීවන වියදම් දීමනාව | 2,003,711 | 3,093,271 | 5,096,982 | 3,983,460 | 3,983,460 |
| ප්‍රවාහන දිරිදීමනා | 1,259,253 | 1,392,187 | 2,651,440 | 2,357,300 | 2,357,300 |
| සේවක අර්ථසාධක හා භාර අරමුදල් ගෙවීම් - 15% | 2,050,397 | 1,329,077 | 3,379,474 | 2,828,114 | 2,828,114 |
| අතිකාල | 2,296,559 | 220,318 | 2,516,876 | 1,885,472 | 1,885,472 |
| පැමිණීමේ දිරිදීමනාව | 2,793,442 | - | 2,793,442 | 2,440,790 | 2,440,790 |
| කාර්යසාධන දිරිදීමනාව | 6,708,083 | - | 6,708,083 | 5,928,743 | 5,928,743 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 601,180 | - | 601,180 | 424,397 | 424,397 |
| වර්තමාන පාරිතෝෂික පිරිවැය | 373,077 | - | 373,077 | (49,206) | (49,206) |
| සේවාමුර දිරිදීමනාව | 347,000 | - | 347,000 | 319,000 | 319,000 |
| සේවක මණ්ඩල පිරිවැය | 573,286 | - | 573,286 | - | - |
| සේවක මණ්ඩල වෛද්‍ය වියදම් | 990,542 | - | 990,542 | 858,646 | 858,646 |
| නිවාස ණය පොළී ප්‍රතිපූරණය | 713,216 | - | 713,216 | 549,924 | 549,924 |
| උපයන විට ගෙවීමේ බද්ද | 540,910 | - | 540,910 | 367,823 | 367,823 |
| දුරකථන බිල්පත් ප්‍රතිපූරණය | 11,035 | - | 11,035 | 10,059 | 10,059 |
| සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | 2,881,772 | - | 2,881,772 | 2,667,097 | 2,667,097 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | 3,420,898 | 8,271,116 | 11,692,014 | 11,205,998 | 11,205,998 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 1,590,984 | 116,940 | 1,707,924 | 2,029,832 | 2,029,832 |
| නිල ඇඳුම් හා පාවහන් | 503,586 | 151,511 | 655,096 | 460,811 | 460,811 |
| ජල ගාස්තු | 150,178 | 1,396,848 | 1,547,026 | 1,222,704 | 1,557,494 |

| | | | | | |
|---|---|---|---|---|---|
| වරිපනම් හා බදු | (513,060) | 1,157,599 | 644,539 | 1,157,599 | 1,488,341 |
| විදුලිය | - | 27,372,342 | 27,372,342 | 23,569,067 | 30,303,086 |
| රක්ෂණය | - | 563,063 | 563,063 | 1,177,098 | 1,354,836 |
| උපකරණ නඩත්තුව | 5,016 | 1,513,785 | 1,518,801 | 2,962,386 | 3,143,382 |
| නඩත්තු නිෂ්පාදන | 284,279 | 5,436,434 | 5,720,713 | 5,793,069 | 6,262,678 |
| ගොඩනැගිලි නඩත්තුව | 171,521 | - | 171,521 | 9,400 | 9,400 |
| ක්ෂය | 94,580,667 | - | 94,580,667 | 99,925,262 | 116,154,712 |
| ප්‍රවාහන ගාස්තු | 792,276 | 714,859 | 1,507,135 | 1,507,135 | 1,507,135 |
| වන්දි | 400,000 | - | 400,000 | - | - |
| අමතර කොටස් පරිභෝජනය | - | 14,375,326 | 14,375,326 | 15,668,389 | 15,668,389 |
| ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය පරිභෝජනය | - | 22,836,604 | 22,836,604 | 20,655,019 | 20,655,019 |
| යන්ත්‍ර සූත්‍ර නඩත්තුව හා අලුත්වැඩියාව | - | 1,845,047 | 1,845,047 | 2,232,914 | 2,232,914 |
| තත්ත්ව පාලන වියදම් | 135,506 | 273,481 | 408,986 | 5,174,387 | 5,174,387 |
| අමුද්‍රව්‍ය විනාශ කිරීමේ වියදම් | 606,606 | - | 606,606 | - | - |
| ප්‍රතික්ෂේපිත අමුද්‍රව්‍යවල පිරිවැය | 525,269 | - | 525,269 | (1,154,168) | (1,154,168) |
| ප්‍රතික්ෂේපිත ඇසුරුම් ද්‍රව්‍යවල පිරිවැය | 1,002,480 | - | 1,002,480 | 90,170 | 90,170 |
| ප්‍රතික්ෂේපිත නොනිම් ද්‍රව්‍යවල පිරිවැය | 1,196,977 | | 1,196,977 | - | - |
| හානිවූ අමුද්‍රව්‍ය පිරිවැය | (24,000) | - | (24,000) | (24,000) | (24,000) |
| අමුද්‍රව්‍ය ගැලපුම - සාමාන්‍ය ඖෂධ | 131,168 | - | 131,168 | 31,891 | 31,891 |
| අමුද්‍රව්‍ය ගැලපුම - පෙනිසිලින් ඖෂධ | (104,977) | - | (104,977) | - | - |
| ඇසුරුම් ද්‍රව්‍ය ගැලපුම | 13 | - | 13 | - | - |
| අමතර කොටස් ගැලපුම් | - | - | - | (443,441) | (443,441) |
| අමුද්‍රව්‍ය ගැලපුම් - තොග සත්‍යාපනය | 216,897 | - | 216,897 | (186,537) | (186,537) |
| ඇසුරුම් ද්‍රව්‍ය ගැලපුම් - තොග සත්‍යාපනය | 4,635 | - | 4,635 | (170,564) | (170,564) |
| තොග සත්‍යාපනය - නඩත්තු | (498,750) | 322,960 | (175,790) | (2,535,276) | (2,535,276) |
| නොනිම් ද්‍රව්‍ය ගැලපුම් - තොග සත්‍යාපනය | 30,958 | - | 30,958 | 69,041 | 69,041 |
| විකුණුම් පිරිවැයට මාරුකරන ලද නිෂ්පාදන පිරිවැයට අවශෝෂණය කර නොගත් පිරිවැය | 151,518,839 | 149,004,886 | 300,523,728 | 285,339,329 | 309,796,674 |

සටහන් අංක 23

**විශ්‍රාම ප්‍රතිලාභ වගකීම**

මූල්‍ය තත්ත්ව වාර්තාවෙහි හඳුනා ගනු ලැබූ මුදල් ප්‍රමාණයන් පහත පරිදි වේ:

| | 31.12.2013 | 31.12.2012 |
|---|---|---|
| වර්ෂය මුලදී ශුද්ධ බැරකම් | 17,989,961 | 17,290,694 |
| සංක්‍රාන්ති බැරකම | 486,083 | - |
| ජංගම සේවා පිරිවැය | 1,339,232 | (668,654) |
| පොළී පිරිවැය | 1,847,604 | 1,869,526 |
| බැරකම් අත්දැකීම් අලාභය | 1,067,318 | - |
| | 22,730,198 | 18,491,566 |
| අඩු කළා: | | |
| වර්ෂය තුළ කරන ලද ගෙවීම් | (315,240) | (501,605) |
| | 22,414,958 | 17,989,961 |

සංස්ථාවේ විශ්‍රාම ප්‍රතිලාභ බැරකම පියල් එස්. ගුණතිලක ඇසෝෂියේට්ස් විසින් කරන ලද ආයුගණක තක්සේරුව මත පදනම්ව ඇත. විශ්‍රාම ප්‍රතිලාභයේ පරිවැය නිර්ණය කිරීමෙහිලා භාවිතා කරන ලද ප්‍රධාන අනුමානයන් වූයේ:

| | | |
|---|---|---|
| අපේක්ෂිත අනාගත වැටුප් වැඩි වීම | 4% | 3.8% |
| වට්ටම් අනුපාතිකය | 10% | 10.9% |

ආදායම් ප්‍රකාශ තුළ හඳුනා ගෙන ඇති මුදල් ප්‍රමාණයන් පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| ජංගම සේවා පිරිවැය | 1,339,232 | (668,654) |
| පොළී පිරිවැය | 1,847,604 | 1,869,526 |

ඒවායේ හොඳම ඇස්තමේන්තු ගෙනෙනු පිණිස 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වයේ වත්මන් වටිණාකම තක්සේරු කරනු පිණිස ආයුගණක තක්සේරුවක් සිදු කෙරුණි.

සටහන් අංක 24

**ආශ්‍රිත පාර්ශ්ව අනාවරණයන්**

සැලකිය යුතු ආශ්‍රිත පාර්ශ්ව අනාවරණයන්හි විස්තර පහත පරිදි වේ:

| සංවිධානය | සබඳතාවය | ගනුදෙනුවේ ස්වභාවය | වර්ෂය තුළ විකිණීම් |
|---|---|---|---|
| වෛද්‍ය සැපයුම් අංශය | ගනුදෙනුකරු | භාණ්ඩ විකිණීම | 1,412,132,433 |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | ගනුදෙනුකරු | භාණ්ඩ විකිණීම | 9,605,490 |

සටහන් අංක 25

**අලෙවි කරන ලද අපවය වූ වත්කම්**

වර්ෂය තුළ විකුණන ලද හා කපා හරින ලද වත්කම් රුපියල් 1,530,269 ක් විය. ඉන් රුපියල් 1,190,600 ක් අපවය වූ වත්කම් 2013 වර්ෂයේදී විකුණන ලදී.

සටහන් අංක 26

**ක්ලෝරම්ෆෙනිකෝල් අමුද්‍රව්‍ය හා අර්ධ නිමි නිෂ්පාදන**

අමුද්‍රව්‍යවල ගැටළුවක් නිසා රුපියල් 8,403,294 ක් වූ ක්ලෝරැම්ෆෙනිකෝල් කරල් නිපදවීමට නොහැකි වී ඇති බව අනාවරණය විය. මේ සම්බන්ධයෙන් සංයෝග පිළියෙළ කිරීම හා පර්යේෂණ සිදු කෙරෙමින් පවතී.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්එම්/ඒ/එස්පීඑම්සී/1/13/06 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2015 ජනවාරි 30 දින.

සභාපති

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2014 ජූනි 06 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 2.2.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 10 වැනි වගන්තිය | එකතු කළ අගය මත බදු සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් යටතේ ලියාපදිංචි නොවූ සමාගම් සඳහා එම බදු නොගෙවිය යුතු වුවත් එලෙස ලියාපදිංචි නොවූ සමාගමකට 2013 වර්ෂය තුළදී රු. 64,680 ක එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි. |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ආ) 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී 57 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය.

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුල සංස්ථාව විසින් ප්‍රදානයන් හා අනුග්‍රාහකත්ව දීමනාවන් ලෙස රාජ්‍ය නොවන ආයතනයන්ට අවස්ථා 3 කදී රු.1,300,000ක් ලබාදී තිබුණි.

(ඇ) 2000 ජනවාරි 31 දිනැති අංක ජීඑෆ්/පීඊ/6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය.

චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව සමාලෝචිත වර්ෂය සඳහා සේවකයින් වෙනුවෙන් උපයන විට ගෙවීම් බදු රු.1,018,647 ක් සංස්ථාවේ අරමුදල් වලින් ගෙවා තිබුණි. මෙම මුදල් සේවකයින්ගෙන් අයකර ගැනීමට ක්‍රියා කර නොතිබූ නමුත් 2014 අගෝස්තු මාසයේ සිට බදු මුදල් සේවකයින්ගෙන් අයකරගැනීමට කටයුතු කර තිබුණි.

(ඈ) මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2006 මාර්තු 09 දිනැති අංක ඩීඑම්එස්/ඊ4/10/090/2 දරන සෞඛ්‍ය ලේකම් ඇමතු ලිපිය

(i ) ඡේද අංක 02-01

විධායක හා විධායක නොවන සෑම සේවකයෙකුටම දුර ප්‍රමාණය අනුව ගෙවිය යුතු මුදල තීරණය කර ප්‍රවාහන දීමනාව ගෙවිය යුතු නමුත් සෑම සේවකයකුටම 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා මාසිකව පිළිවෙලින් රු.4,700 ක හා රු.3,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි.

(ii) ඡේද අංක 02-01 (1)

ආයතනය විසින් ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා වාහන යොදවා ඇති මාර්ග සමීපයේ පදිංචි සේවකයින්ටත් ප්‍රවාහන දීමනාව ගෙවා තිබුණි.

(iii) ඡේද අංක 02-02

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2011 ජුලි 01 දින සිට සභාපති හැර සියලුම කාර්ය මණ්ඩලයට මාසිකව රු. 12,000 බැගින් නිෂ්පාදන දිරි දීමනාවක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ 218 ක්වූ සේවක සංඛ්‍යාවට ගෙවිය හැකි උපරිම නිෂ්පාදන දිරි දීමනාව රු. 10,464,000 ක් වුවද ගෙවා තිබූ මුදල රු.18,707,055කි. මේ අනුව ආසන්න වශයෙන් නිෂ්පාදන දිරි දීමනාව රු. 8,243,055 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය බදුවලට පෙර රු. 329,968,881 ක ශුද්ධ ලාභයක් වූ අතර, එය ඉකුත් වර්ෂය සඳහා බදුවලට පෙර ශුද්ධ ලාභය වූ රු. 117,136,719 සමඟ සැසඳීමේ දී රු. 212,832,162 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. කෙසේ වුවද භාණ්ඩාගාර බිල්පත් මත ලැබුණු රු. 25,314,785 ක පොලී ආදායම ද ඇතුළුව රු. 28,059,081 ක් වූ මෙහෙයුම් නොවන ආදායම ගණන් ගැනීමට පෙර සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ ශුද්ධ ලාභය රු. 301,909,800ක් විය. ඉකුත් වර්ෂය සඳහා මෙහෙයුම් නොවන ආදායම වූ රු. 34,251,670 ගණන් ගැනීමට පෙර ශුද්ධ ලාභය රු. 82,885,049 ක් විය. මේ අනුව මෙහෙයුම් නොවන ආදායම ගණන් ගැනීමට පෙර ශුද්ධ ලාභය ඉකුත් වර්ෂයේ මෙහෙයුම් නොවන ආදායම ගණන් ගැනීමට පෙර ශුද්ධ ලාභය සමඟ සැසඳීමේදී රු. 219,024,751 ක එනම් සියයට 264.3 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ දළ ලාභ අනුපාතය වූ සියයට 22.0, 2012 වර්ෂයේ දළ ලාභ අනුපාතය වූ සියයට 15.4 සමඟ සැසඳීමේදී සියයට 42.8 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

(ආ) 2013 වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය වූ සියයට 10.7, 2012 වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය වූ සියයට 7.0 සමඟ සැසඳීමේදී සියයට 52.9 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

(ඇ) 2013 වර්ෂයේ ජංගම අනුපාතය 7.9 ක් හා ක්ෂණික අනුපාතය 5.9 ක් ලෙස පැවතීමෙන් නිරීක්ෂණය වූයේ අතිරික්ත කාරක ප්‍රාග්ධනය ඵලදායී ලෙස යොදා ගෙන නොතිබූ බවය.

(ඈ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ණයගැති පිරිවැටුම් අනුපාතයේ පිරිහීම 1.1 ක් වූ අතර ණය එකතු කිරීමේ කාලය දින 19 කින් වැඩි වී තිබුණි. මේ අනුව ණය අයකර ගැනීම මනා කළමනාකරණයකින් පවත්වා නොතිබූ බව නිරීක්ෂණය කෙරේ.

3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවක නිවාස ණය පොලී මුදල් ප්‍රතිපූර්ණය කරන ලෙස ඉල්ලා ආයතනයේ සේවකයින් විසින් ආයතනයට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග වලට එළඹ තිබුණි.

(ආ) ආයතනයේ නිලධාරියෙකු විසින් වන්දි ඉල්ලා ගොනුකර තිබූ නඩුවක තීන්දුවට එරෙහිව ආයතනය විසින් අභියාචනාවක් ගොනුකර තිබුණි.

(ඇ) 2007 වර්ෂයේ සිට ණයගැතියෙකුගෙන් ආයතනයට ලැබිය යුතු රු. 570,257 ක මුදලක් අයකර ගැනීම සඳහා ආයතනය විසින් අධිකරණ ක්‍රියාමාර්ග වලට එළඹ තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---

4.1 කාර්ය සාධනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිෂ්පාදන කටයුතු

---

සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සහ පසුගිය වසර 04 ක් තුල නිපදවූ ඖෂධ සම්බන්ධ සංසන්දනාත්මක තොරතුරු පහත පරිදි විය.

| වර්ෂය | නිෂ්පාදිත ඖෂධ වර්ග ගණන | නිෂ්පාදනය ඒකක සංඛ්‍යාව (මිලියන) |
|---|---|---|
| 2009 | 38 | 1195.2 |
| 2010 | 38 | 1614.1 |
| 2011 | 37 | 1796.4 |
| 2012 | 40 | 1920.2 |
| 2013 | 40 | 2005.1 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඖෂධ ඒකක නිෂ්පාදනයේ වර්ධන අනුපාතය 2012 වර්ෂයේදී සියයට 6.8 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ එය සියයට 4.4 ක් වූයෙන් පසුගිය වසර සමඟ සැසඳීමේදී එම වර්ධන අනුපාතයේ සියයට 2.4 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

(ii) 2012 වර්ෂයේ නිෂ්පාදිත ඖෂධ වර්ග 40 හි එකතු නිෂ්පාදිතය ඒකක මිලියන 1920.2 සමඟ සමාලෝචිත වර්ෂයේ එම ඖෂධ වර්ග 40 හි එකතු නිෂ්පාදිතය ඒකක මිලියන 2005.1 ක සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී ඖෂධ නිෂ්පාදනය ඒකක මිලියන 84.9 කින් වැඩිවී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදිත ඖෂධ වර්ග 40 න් ඖෂධ වර්ග 4 ක මුළු නිෂ්පාදනය සඳහා දායකත්වය සියයට 0.09 ක් පමණක් වූ අතර මුළු නිෂ්පාදනයෙන් ඒකක මිලියන 1027.73 ක් එනම් සියයට 51.24 ක් ඖෂධ වර්ග 5 ක් මත තීරණය වී තිබුණි.

(iv) 2005 වර්ෂයේ සිට 2013 පෙබරවාරි දක්වා කාල පරිච්ඡේදය තුළදී පර්යේෂණ මට්ටමේ පැවති ඖෂධ අයිතම සංඛ්‍යාව 07 ක්වූ අතර එම පර්යේෂණ කටයුතු සඳහා වර්ෂ 03 සිට වර්ෂ 08 දක්වා කාලයක් ගතවී තිබුණද ඒ සඳහා රු.1,186,200 ක වියදමක් දරා තිබුණි. එහෙත් මෙම ඖෂධ වෙළඳපලට හඳුන්වා දීමට අපොහොසත්වී තිබුණි.

(ආ) අලෙවි කටයුතු හා මිල කිරීම

------------------------------

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ සංස්ථාවේ ඖෂධ අලෙවියට අදාල තොරතුරු පහත පරිදි වේ.

| | ඖෂධ අලෙවිය | | අලෙවි වටිනාකම | |
|---|---|---|---|---|
| | 2013 | 2012 | 2013 | 2012 |
| | ඒකක මිලියන | ඒකක මිලියන | රු. මිලියන | රු. මිලියන |
| රාජ්‍ය ඖෂධ සංස්ථාව | 13.5 | 492.4 | 9.6 | 412.4 |
| වෛද්‍ය සැපයීම් අංශය | 1,507.1 | 1,203.9 | 1,412.1 | 1,000.7 |
| අපනයන | - | 3.8 | - | 1.4 |
| වෙනත් බෙදා හරින්නන් | 478.5 | - | 519.4 | - |
| | 1,999.1 | 1,700.1 | 1,941.1 | 1,414.5 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සංස්ථාව සමාලෝචිත වර්ෂයේ දී සමස්ත අලෙවි ඒකක ප්‍රමාණයෙන් සියයට 75.39 ක් වෛද්‍ය සැපයීම් අංශය වෙත අලෙවිකර තිබූ අතර ඉන් උපයාගත් අලෙවි ආදායම සමස්ත අලෙවි ආදායමෙන් සියයට 72.7 ක් විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ii) සමාලෝචිත වර්ෂයේදී බෙදාහරින්නන් මාර්ගයෙන් ඖෂධ විකිණීම නැවත ආරම්භ කර ඖෂධ ඒකක මිලියන 478.5 ක් බෙදාහරින්නන් 45 දෙනෙකු වෙත රු. මිලියන 519.4 කට අලෙවි කර තිබුණේ රු. මිලියන 52.8 ක වට්ටමක් ලබාදීමෙනි.

(iii) මුළු ඖෂධ ඒකක අලෙවියෙන් හා අලෙවි වටිනාකමින් පිළිවෙලින් සියයට 45.9 හා සියයට 38.7 ක් ඖෂධ වර්ග 32 ක් මත රඳා පැවතුන අතර ඖෂධ ඒකක අලෙවියෙන් සියයට 54.1 ක් හා අලෙවි වටිනාකමින් සියයට 61.3 ක් ඖෂධ වර්ග 08 ක් මත රඳා පැවතුණි.

(iv) වෛද්‍ය සැපයීම් අංශය ඇනවුම් කළ රු. මිලියන 47.27 ක් වටිනා ඖෂධ වර්ග 5 ක ඒකක මිලියන 36.50 ක් එම නිෂ්පාදනයන්හි පැවති තාක්ෂණික දෝෂ හා නිසි ප්‍රමිතීන්ට අනුකූල වූ අමුද්‍රව්‍ය සපයාගැනීමට නොහැකි වීම යන හේතු නිසා සමාලෝචිත වර්ෂයේදී සැපයීමට නොහැකිවී තිබුණි.

(v) 2013 වර්ෂයේ දළ ලාභය 2012 වර්ෂය සමඟ සැසඳීමේදී රු. මිලියන 208.8 ක එනම් සියයට 95.56ක වැඩිවීමක් ද 2013 වර්ෂයේ දළ ලාභ ආන්තිකය 2012 වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 42.39 ක වැඩිවීමක් ද පෙන්නුම් කෙරුණි.

(vi) 2011 හා 2012 වර්ෂයන්හි සංස්ථාවේ නිත්‍ය බෙදාහරින්නා ලෙස කටයුතු කළ රාජ්‍ය ඖෂධ සංස්ථාව වෙනුවට රාජ්‍ය ඖෂධ සංස්ථාවද ඇතුළුව බෙදාහරින්නන් මඟින් ඖෂධ බෙදාහැරීම සංස්ථාව විසින් 2013 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණි. එම බෙදාහරින්නන්ට ඖෂධ වර්ග 23 ක් ලබාදීමේදී ඒවායේ අලෙවි මිල තීරණය කිරීම සඳහා සංස්ථාව විසින් කිසිදු වෙළඳපල අධ්‍යයනයක් හෝ මිල අධ්‍යයනයක් සිදුනොකර සියයට 15 ක් තරම් වූ අඩු ලාභාන්තිකයක් සහිතව රාජ්‍ය ඖෂධ සංස්ථාව සඳහා 2012 වර්ෂයේදී භාවිතා කළ මිල ගණන්ම කිසිදු වෙනස්වීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදීද යොදාගෙන තිබුණි.

(vii) පිරිවැය මත සියයට 15 කට අඩු ලාභාන්තිකයක් සහිතව මිල තීරණය කරන ලද Amoxicillin Tab 125mg, Paracitamol Tab. 500mg සහ Amoxicillin Cap. 500mg යන ඖෂධ වර්ග සඳහාද සංස්ථාව විසින් 2013 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලද ප්‍රසාද දීමනා (Bonus Issues) ක්‍රමය යොදා ගැනීම හේතුවෙන් එම ඖෂධයන්හි ලාභාන්තිකය සියයට 8 සිට සියයට 1 දක්වා පරාසයකට අඩුවී තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු. 2,307,359 ක් පිරිවැය වූ ඖෂධ, අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය ප්‍රතික්ෂේප වීම, හානිවීම හා නිකුත් නොවීම නිසා සමාලෝචිත වර්ෂයේදී විනාශ කර තිබුණි.

(ආ) ඖෂධ නිෂ්පාදනය සඳහා මිලදීගෙන තිබූ පිරිවැය රු.13,202,663 ක් වූ අමුද්‍රව්‍ය යන්ත්‍ර මඟින් ප්‍රතික්ෂේප වීම, වටටෝරු දෝෂ පැවතීම, පිරිවිතරයන්ට අනුකූල නොවීම, වර්ණය වෙනස්වීම හා කල් ඉකුත් වීම යනාදී හේතූන් මත නිෂ්පාදනයට යොදා ගෙන නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ඇ) Chloramphenical නමැති ඖෂධය නිෂ්පාදනයේදී පැවති තාක්ෂණික දූර්වලතාවයක් නිසා නිෂ්පාදනය 2011 වර්ෂයේදී නතර කළද, සමාලෝචිත වර්ෂය අවසානයට 2011 හා 2012 වර්ෂවල ගෙන්වූ රු. 6,107,917ක් වටිනා Chloramphenical BP 2010 අමුද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 1,102.7 ක් සංස්ථාවේ ගබඩාවල ඉතිරිව් තිබුණි. එයින් රු. 5,325,210 ක් වටිනා අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 984 ක් 2014 ජූලි මාසයේදී කල් ඉකුත්වූ අතර රු.78,287 ක් වටිනා අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 18.7ක් 2014 මාර්තු මාසයේදී කල් ඉකුත් වී තිබුණි. නිෂ්පාදනයේ පවතින තාක්ෂණික දූර්වලතාවය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර මේ නිසා ඉහත අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 1,002.7 න් සංස්ථාවට රු. 5,403,497ක මූල්‍ය පාඩුවක් සිදුවීමේ අවදානමක් පවතී.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රසායනාගාරය වැඩි දියුණු කිරීමේ කාර්යයට අවශ්‍ය වැඩ මේස 09 ක් සපයා සවි කිරීම සඳහා 2011 මාර්තු 25 දින එකතු කළ අගය මත බදු සහිතව රු. 1,365,969 ක අවම මිල ඉදිරිපත් කළ ටෙන්ඩර්කරුට භාර දී තිබුණු අතර 2012 හා 2013 වර්ෂ වලදී රු. 1,285,780 ක අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි. අදාල වැඩ මේස 2013 පෙබරවාරි 19 දින සපයා තිබුණද රසායනාගාරය ස්ථාපිත කිරීමට යෝජිතව ඇති ස්ථානයේ තිබුණු භාණ්ඩ 2014 අප්‍රේල් මාසය වන විටත් ඉවත් කර දීමට සංස්ථාව කටයුතු නොකිරීම නිසා වැඩ මේස, සැපයුම්කරු ලවා සවිකර ගැනීමට නොහැකිව, වියදම් කළ මුදලින් ප්‍රයෝජනයක්ද ලබා ගත නොහැකිව හා ගෙවූ අත්තිකාරම් මුදලද පියවීමට නොහැකිව තිබුණි.

(ආ) නව පෙති නිෂ්පාදන යන්ත්‍රය මිල දී ගැනීමට අදාල රු. 8,666,375 ක් වටිනා කාර්යසාධන සුරැකුම 2013 මාර්තු 26 දින කල් ඉකුත් වුවද එහි කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ප්‍රමාණවත් පාලන ක්‍රමයක් නොතිබීම නිසා එම කාර්යසාධන සුරැකුම අස්ථාන ගත වී තිබුණි.

4.4 මතභේදයට තුඩු දෙන ගණුදෙනු
-----------------------------------
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 මාර්තු 21 දිනැති අංක 35/13 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය හා 2013 පෙබරවාරි 22 දිනැති 18/13 හා 2013 ඔක්තෝබර් 23 දිනැති 116/13 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව නිෂ්පාදනය කෙරෙමින් පැවති අමුද්‍රව්‍ය හා ප්‍රතික්ෂේපිත / විනාශ වූ අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍යවල එකතුව රු. 2,724,726 ක් සමාලෝචිත වර්ෂයේදී ලාභයට එරෙහිව ලියා හැර තිබුණි.

(ආ) සංස්ථාවේ සහකාර කළමනාකාරිණියක් විසින් පිළියෙල කළ මානව සම්පත් හා පරිපාලන කාර්ය සංග්‍රහයේ නීතිමය අඩුපාඩු පරීක්ෂා කිරීමේ කාර්යයට මිල ගණන් කැඳවීමකින් තොරව සහකාර කම්කරු කොමසාරිස්වරයෙකුට රු. 25,000 ක් 2013 දෙසැම්බර් 17 දින ගෙවා තිබුණි.

4.5 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රයෝජනයට නොගන්නා රු. 1,000 ට වැඩි වටිනාකමක් සහිත වත්කම් සම්බන්ධයෙන් කළ නියැදි පරීක්ෂාවේදී 2013 දෙසැම්බර් 31 දිනට අලාභහානිවීම හා භාවිතයට නොගැනීම නිසා පිරිවැය රු. 18,606,953 ක් වූ නිෂ්පාදන යන්ත්‍ර, පරිඝණක හා උපාංග, ලී බඩු, වායු සමීකරණ හා ඇබිලි සලකුණු යන්ත්‍ර යනාදී වත්කම් අයිතම 62ක ඒකක 115 ක් 2009 වර්ෂයේ සිට 2014 මාර්තු දක්වා සංස්ථාවේ විවිධ අංශ තුල පවතින බව නිරීක්ෂණය විය.

(ආ) පිරිවැය රු. 5,000 ට වැඩි වත්කම් අයිතම 34 ක එකතු පිරිවැය රු. 11,501,315 ක් වූ අලාභහානි වූ වත්කම් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ එසේ භාවිතයට ගත නොහැකිනම් 2003 ජනවාරි 03 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 353(5) ප්‍රකාරව බැහැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේදී මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු 14 කට හා මාණ්ඩලික ශ්‍රේණියේ නොවන තනතුරු 22 කට අදාලව පුරප්පාඩු 36 ක් සම්පූර්ණ කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

අමුද්‍රව්‍ය මිලදී ගැනීම හා වත්කම් අලාභහානි වීම හෝ ප්‍රයෝජනයට නොගැනීම නිසා භාවිතයට ගත නොහැකිව පවතින වත්කම් සම්බන්ධව එම අංශයේ අවධානය යොමුවී නොතිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය.

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ 2013 වර්ෂයට අදාල අයවැය ලේඛනය සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 16 දින නැවත සංශෝධනය කර තිබුණි.

එසේ තිබියදිත් අයවැය ගත වියදම් ශීර්ෂ 03 කට අදාලව සත්‍ය වියදම් සියයට 25 සිට සියයට 87 දක්වා හා වත්කම් හා බැරකම් සියයට17 සිට සියයට 1780 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2014 අගෝස්තු මාසය අවසාන වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

06. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) අයවැය

(ආ) බදු

(ඇ) ඖෂධ නිෂ්පාදනය කිරීම හා මිල කිරීම

(ඈ) ණය ගැතියෝ

(ඉ) ස්ථාවර වත්කම් කළමනාකරණය

(ඊ) තොග

(උ) මානව සම්පත් කළමනාකරණය

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

# රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

## 2013 විගණකාධිපතිවරයාගේ වාර්තාව පිළිබඳ සභාපති තුමාගේ අදහස්

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.2.1 නීතිරීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

(අ) අදාල ආයතනය සමග මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර එම බදු මුදල් ප්‍රමාණය දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට උපදෙස් දී ඇත.

(ආ) කලමනාකරණ චක්‍රලේඛ අංක PED 57 අනුව මෙවන් අනුග්‍රහකත්වයන් ලබා දීමට පෙර අනුමැතිය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ගත යුතු වූවත් එයට යම් සැලකිය යුතු කාලසීමාවක් ගත වේ. එසේ නමුත් මෙවන් වූ අනුග්‍රහකත්ව ඉල්ලීම් සඳහා ඊට අවශ්‍ය අනුමැතිය ඉතාමත් කෙටි කාලයක් තුළ ලබාදිය යුතු වන බැවින් මූලිකව අප සංස්ථා සභාපතිතුමාගේ අනුමැතිය ලබා ගෙන ඒවායෙහි ඉදිරි කටයුතු කරගෙන යන අතර පසුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ද යොමු කරනු ලබයි. එසේම 2013 පැවති COPE රැස්වීමේදී ප්‍රවර්ධන කටයුතු කරන ලෙස උපදෙස් ලැබිණි.

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව උපයන විට බදු මුදල් සංස්ථාවේ අරමුදලෙන් ගෙවා ඇත. නමුත් (2014-අගෝස්තු මස සිට) එය සේවකයන්ගෙන් අය කිරීමට කටයුතු කර ඇත.

(ඈ) **(i) ඡේද අංක 02-01**

**(ii) ඡේද අංක 02-01 (1)**

රජයේ රෝහල් වල අත්‍යවශ්‍ය ඖෂධ අවශ්‍යතාවය සපුරාලීම සඳහා ආයතනය තුල උදෑසන 06 සිට රාත්‍රී 10 දක්වා සේවා මුර ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන අතර ආයතනය පොදු ප්‍රවාහන පහසුකම් නොමැති ස්ථානයක පිහිටා ඇත. මේ නිසා සේවකයන් අදාල සේවා මුර වලට නිසි වේලාවට ගෙන්වා ගැනිම අත්‍යවශ්‍ය කරුණක් වන සේම මෙම තත්වය තුල ආයතනයට ආසන්නව පදිංචිව සිටින සේවකයන් ඉතාමත් වැදගත් වේ. මෙවැනි තත්වයක් සලකා බලා සේවකයන්ගේ පදිංචි ස්ථාන වල දුර ප්‍රමාණයන් සලකා බැලීමකින් තොරව සියලුම සේවකයන්ට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව ප්‍රවාහන දීමනාව ගෙවීම් කරනු ලැබේ.

**(iii) ඡේද අංක 02-02**

නිෂ්පාදන දිරි දීමනාව වැඩිකල පසුව නිෂ්පාදනය සැලකිය යුතු ලෙස ඉහල ගොස් ඇත. 2011 සිට නිෂ්පාදනය වැඩි වී ඇත්තේ යන්ත්‍ර සූත්‍ර හඳුන්වා දීමකින් තොරවයි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.2. විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

(අ) සැලකිල්ලට ගන්නා ලදී.

(ආ) සැලකිල්ලට ගන්නා ලදී.

(ඇ) අතිරේක කාරක ප්‍රාග්ධනය ඵලදායි ලෙස යොදා ගැනිම සඳහා ආයෝජන සැලසුම් 2015 වර්ෂයේදි ක්‍රියාත්මක වනු ඇත.

(ඈ) වෛද්‍ය සැපයුම් අංශයෙන් ලැබිය යුතු මුදල් අප ආයතනයට ලැබෙන්නේ මහා භාණ්ඩාගාරය හරහාය. එම මුදල් හැකි ඉක්මනින් ලබා ගැනිමට අප විසින් නිතරම උත්සහ කරනු ලැබේ.

**3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

(අ) මෙම නඩුව දැනට කොළඹ අභියාචනාධිකරණයේ විභාග වන නඩුවකි. නමුත් පෙත්සම්කරුවන් විසින් එම නඩුව ඉදිරියට පවත්වාගෙන යනු ලබන බවක් දක්නට නැත.

(ආ) එම නඩුව 2014 වන විට ආයතනය ජය ලබන පරිදි අවසන් වී ඇත.

(ඇ) මෙම ලැබිය යුතු ණයගැති අවිනිශ්චිත බැවින් වෙන් කිරීමක් කර ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

**(අ) නිෂ්පාදන කටයුතු**

(i) කර්මාන්තශාලාවේ නිෂ්පාදන ධාරිතාවය උපරිම තලයකට පැමිණ ඇති බැවින් ක්‍රමයෙන් නිෂ්පාදන වර්ධන වේගය අඩුවෙමින් පවති. වර්ධන වේගය අඩු වූවත් පසුගිය වසරට සාපේක්ෂව නිෂ්පාදන ප්‍රමාණයේ වැඩි වීමක් ඇත.

(ii) වෙළඳපොලේ පවතින ඉල්ලුම පදනම් කර ගෙන ලැබෙන ඇණවුම් වලට පමණක් අප ඖෂධ නිෂ්පාදනය සිදු කෙරේ.

(iii) ඖෂධ නිෂ්පාදනය සිදුකරනු ලබන්නේ වෙළඳ පොලෙහි පවතින ඉල්ලුම් පදනම් කර ගනිමින් ලැබෙන ඇනවුම් මතය. සමහර ඖෂධ සඳහා වැඩි ඉල්ලුමක් පවතින අතර සමහර ඖෂධ සඳහා අඩු ඉල්ලුමක් පවති. ඒ මත පදනම් වී නිෂ්පාදන මිශ්‍රණය සකස් කරගනු ලැබේ.

(iv) නව ඖෂධ වට්ටෝරුවක් සකස් කිරිමේදි, එහි ක්‍රියාකාරි ඖෂධය සහ එයට අදාල අනිකුත් ද්‍රව්‍ය වල ක්‍රියාකාරිත්වය, ස්ථායිථාවය හා සුදුසු නිෂ්පාදන ක්‍රියාවලිය ආදි කරුණු ඉතාම සැලකිල්ලෙන් විශ්ලේෂණ කිරිමට සිදුවන බැවින් යටත් පිරිසෙන් වසර 05 ක් පමණ කාලයක්වත් මේ සඳහා ගත වේ. ක්‍රමවත් විශ්ලේෂණ ක්‍රියාමාර්ග නොමැති වූ විට මේ සඳහා ගත වන කාලය තවදුරටත් වැඩි වේ.

**(ආ) අලෙවි කටයුතු හා මිල කිරිම**

(i) වෛද්‍ය සැපයුම් අංශයට ඖෂධ සැපයිමට වඩා වෙනස් තරගකාරි වටපිටාවක් තුල විවෘත වෙළඳ පල අලෙවි කටයුතු සිදු කරන අතර ඒවායේ මිල ගණන් ද සාපේක්ෂව ඉහල අගයක් ගනී. එම නිසා විවෘත වෙළඳ පලේ අනිකුත් තරගකරුවන් සමඟ තරගකාරිව අපගේ බෙදාහරින්නන් මඟින් ඖෂධ අලෙවි කිරිමට අලෙවි ප්‍රවර්ධන උපක්‍රමයක් වශයෙන් වට්ටම් දීමේ ක්‍රමයක් භාවිතා කරන අතර, එසේ වුවත් මිල ඉහල මට්ටමක තබා ගැනිමට නිතරම අප කටයුතු කරනු ලැබේ.

(ii) 2013 වර්ෂය තුලදි ඉතා ඉහල මට්ටමක පැවති ඖෂධ (විශේෂයෙන් රාජ්‍ය ඉල්ලුම) පාදක කරගෙන නිෂ්පාදන කටයුතු සැලසුම් කරන ලදී.

(iii) අදාල නිෂ්පාදනයන් හි පැවති තාක්‍ෂණික දෝෂ නිසා සැපයිමට නොහැකි විය.

(iv) වෙළඳ මිල අධ්‍යනයක් කරන ලදි. ඒ අනුව වෙනස් කල හැකි නිෂ්පාදනයන්ගේ මිල සංශෝධනය කර බෙදා හරින ලදි.

(v) අලෙවි ප්‍රවර්ධන උපක්‍රමයක් ලෙස ප්‍රසාද දීමනා ලබා දෙන අතර සාධාරණ හේතු සාධක මත අයිතම කීපයක ලාභ ආන්තිකය  ඉතා සුළු ලෙස අඩු වී ඇත. එසේම මිල අඩු වීම මත ඉල්ලුම ඉහල යාමෙන් අපේක්ෂිත අලෙවි ආදායමට ළඟා වීමට හැකි වේ.

(vi) 2012 වර්ෂයේ රාජ්‍ය ඖෂධ සංස්ථාව (SPC) විසින් අප ආයතනය වෙත ප්‍රමාණවත් ඇනවුම් ලබා නොදිම මත 2013 වර්ෂයේදී නැවතත් අප ආයතනය විසින් බෙදාහරින්නන් හරහා අලෙවි කටයුතු කිරිම ආරම්භ කරන ලදී. ඒ අනුව වෙළඳපල මිල ගණන්  වල අධ්‍යනයක් සිදුකර එම මිල ගණන් වලට සරිලන පරිදි මිල තීරණය කරන ලද අතර සමහර නිෂ්පාදන වල මිල ගණන් සංශෝධන නොකර පවත්වා ගැනිමට සිදු වුයේ එම නිෂ්පාදනයේ වෙළඳපල කොටස අහිමි වීමේ සම්භාවිතයක් තිබු හෙයිනි.

(vii) අලෙවි ප්‍රවර්ධන උපක්‍රමයක් ලෙස තෝරාගත් නිෂ්පාදනයන් සඳහා ප්‍රසාද දීමනා ලබා දීම සිදු කරන අතර විමසුමේ දක්වා ඇති පරිදි නිෂ්පාදනයන්හි ලාභාන්තිකයන් අඩු වුවත් ඒ සඳහා හේතු වු සාධක විගණනය වෙත ලබා දී ඇත.

### 4.2 කළමණාකරණ අකාර්යක්‍ෂමතා

(අ) මෙම වර්ිනාකමට ප්‍රතික්ෂේපිත කල් ඉකුත් වූ සහ හානි වීම යන කරුණු මත තත්ව පාලන අංශයේ, වට්ටෝරු සංවර්ධන අංශයේ සහ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ පූර්ණ අනුමැතිය ඇතිව විනාශ කරන ලදී. මේවා පැරණි ලාංජන සහිත ලේබල, යන්ත්‍ර මඟින් ප්‍රතික්ෂිපිත කැප්සියුල හා හානි වූ අමුද්‍රව්‍ය ආදිය වේ.

(ආ) මිලදී ගෙන ඇති අමුද්‍රව්‍ය තොග අතරින් භාවිතයට නොගෙන ඇත්තේ වට්ටෝරුවේ පවතින තාක්‍ෂණික දෝෂ, කල් ඉකුත් වීම් සහ පරික්‍ෂණ සඳහා ස්වල්ප වශයෙන් භාවිතා කිරිම වැනි හේතුන් නිසාය.

(ඇ) පවතින තාක්ෂණික ගැටළු නිරාකරණය කර ගනිමින්, පවතින දෝෂයන්ට පිළියම් යොදමින් නිෂ්පාදනය කරගෙන යාමට කටයුතු කරනු ඇත.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) නව ගොඩනැගිල්ලේ වැඩ කටයුතු ප්‍රමාද වීම මත ඉහත කාර්යයන් ඇන සිටින ලදි. අවසානයේ නව ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ කටයුතු අප ආයතනය විසින් නිම කරන ලද අතර ඉන්පසු සභාපතිතුමාගේ, සාමාන්‍යාධිකාරිතුමියගේ සහ සම්මන්ත්‍රන ශාලාව යන ස්ථාන රාසායනාගාර ලෙස භාවිතා කිරිමට හැකි වේ.

(ආ) අදාල කාර්යසාධන සුරැකුම නියමිත පරිදි ලබාගත් අතර එම මිලදි ගැනිම සම්බන්ධයෙන් ආයතනයට කිසිම මූල්‍යම අලාභයක් නොවන පරිදි අදාල ආයතනය මගින් යම්කිසි පොලී ප්‍රමාණයක් සමග අදාල බැංකු ගාස්තු ද ලබා ගැනිමට කටයුතු කරන ලදී.

**4.4 මතභේදයට තුඩුදුන් ගණුදෙනු**

(අ) නිෂ්පාදනය කෙරෙමින් පවතින අමුද්‍රව්‍ය සහ ප්‍රතික්ෂේපිත වූ අමුද්‍රව්‍ය හා අසුරුම් ද්‍රව්‍යය භාවිතයට නුසුදුසු බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ලාභයෙන් කපා හරින ලදි.

(ආ) මෙවැනි කාර්යයන් ගුණාත්මකභාවයෙන් යුක්ත විය යුතු වීම මත වෘත්තීමය සුදුසුකම් ඇති අයෙකු ලවා එහි ගුණාත්මකභාවය පරික්ෂා කරගැනිමට මෙම සේවාව සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

**4.5 නිෂ්ක්‍රීය/ ඌණ උපයෝජිත වත්කම්**

(අ) අදාල වත්කම් සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලයෙන් පත් කර ඇති අතර එමගින් ලැබෙන උපදෙස් මත ක්‍රියා කිරිමට සැලසුම් කර ඇත.

(ආ) මෙම වත්කම් සම්බන්ධයෙන් ද රාජ්‍ය මුදල් චක්‍රලේඛ 353 (5) ප්‍රකාරව කටයුතු කරමින් සිටීඑනම් සමීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති අතර එමගින් ලැබෙන උපදෙස් මත කටයුතු කිරිමට සැලසුම් කර ඇත.

**4.6 කාර්ය මණඩල පරිපාලනය**

අදාල තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරිමට කටයුතු කරමින් සිටි.

**5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**5.1 අදාල කටයුතු සම්බන්ධයෙන් විගනන වාර්තා නිකුත් කර ඇත.**

**5.2 අයවැය ලේඛණමය පාලනය**

දක්වා ඇති කරුණු සැලකිල්ලට ගන්නා ලද අතර ඉදිරි වර්ෂ වලදි අයවැය ලේඛනය සකස් කිරිමේදි ඒ අනුව සකස් කිරිමට කටයුතු කරනු ලැබේ.


**5.3 වාර්ෂික වාර්තා සභාගත කිරිම.**

වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරිම කරනු ලබන්නේ සෞඛ්‍ය අමාත්‍යංශය විසිනි. 2012 වාර්ෂික වාර්තා අප ආයතනය මගින් 2014.03.03 දින සෞඛ්‍ය අමාත්‍යංශයට භාර දී ඇති අතර වාර්ෂික වාර්තා සභාගත කිරිම සඳහා අමාත්‍යංශය විසින් 2014.09.14 දින පාර්ලිමේන්තුවට යවා ඇත.

# ප්‍රස්ථාරාත්මක සමාලෝචනය


## මානව සම්පත්

| වර්ෂය | සේවක සංඛ්‍යාව |
|---|---|
| 2004 | 155 |
| 2005 | 148 |
| 2006 | 171 |
| 2007 | 189 |
| 2008 | 195 |
| 2009 | 209 |
| 2010 | 209 |
| 2011 | 208 |
| 2012 | 199 |
| 2013 | 211 |





## නිෂ්පාදනය

| වර්ෂය | පෙති/කරල් සංඛ්‍යාව |
|---|---|
| 2004 | 724 |
| 2005 | 837 |
| 2006 | 752 |
| 2007 | 1025 |
| 2008 | 1032 |
| 2009 | 1195 |
| 2010 | 1623 |
| 2011 | 1796 |
| 2012 | 1922 |
| 2013 | 2003 |




## 2013 වර්ෂයේ නිෂ්පාදනයේ ප්‍රධාන දායකත්වයන්


| | පෙති/කරල් සංඛ්‍යාව |
|---|---|
| ෆෝලික් අම්ලය පෙති බීපී මි.ග්‍රෑ 1 | 265.5 |
| ඇමොක්සිසිලින් කරල් බීපී මි.ග්‍රෑ 250 | 235.234 |
| ප්‍රෙඩ්නිසොලෝන් පෙති බීපී මි.ග්‍රෑ 5 | 224 |
| පැරසිටමෝල් පෙති බීපී මි.ග්‍රෑ 500 | 206.4 |
| ක්ලොක්සසිලීන් කරල් බීපී මි.ග්‍රෑ 250 | 103.6 |
| සැල්බියුටමෝල් පෙති බීපී මි.ග්‍රෑ 2 | 91.2 |
| ඩයික්ලෝෆෙනැක් සෝඩියම් පෙති යූඑස්පී මි.ග්‍රෑ 50 | 88.4 |
| මෙට්ෆෝමින් පෙති බීපී මි.ග්‍රෑ 500 | 85.99 |
| ෆැමොටිඩීන් පෙති බීපී මි.ග්‍රෑ 20 | 71.55 |
| විටමින් බී පෙති සීඑච්එෆ් | 61.6 |



## තත්ත්ව පාලනය

### 2013 වර්ෂයේ ප්‍රගති විශ්ලේෂණය


| ප්‍රගතිය | සංඛ්‍යාව |
|---|---|
| නිමි නිෂ්පාදන විශ්ලේෂණය | 2365 |
| නැවි ගත කිරීමට පෙර අමුද්‍රව්‍ය නියැදි විශ්ලේෂණය | 39 |
| අමුද්‍රව්‍ය නියැදි විශ්ලේෂණය | 462 |
| ටෙන්ඩර් නියැදි විශ්ලේෂණය | 183 |
| වට්ටෝරු පෙරහුරු විශ්ලේෂණය | 81 |
| ජල නියැදි විශ්ලේෂණය | 30 |
| ඇසුරුම් ද්‍රව්‍ය නියැදි විශ්ලේෂණය | 114 |
| ස්ථාවරභාවය පිළිබඳ නියැදි විශ්ලේෂණය | 49 |
| පරිසර පිරිසිදු තත්යව පිළිබඳ විශ්ලේෂණය | 12 |
| නිෂ්පාදන පෙරහුරු | 90 |
| පෙර ඇසුරුම් ද්‍රව්‍ය විශ්ලේෂණය | 101 |
| නිෂ්පාදන වල කාලය දීර්ඝ කිරීම | 14 |
| එකතුව | 3540 |




## නඩත්තු

### බලශක්ති පරිභෝජනය

| වර්ෂය | බලශක්ති පරිභෝජනය |
|---|---|
| 2004 | 1,108,150 |
| 2005 | 1,142,690 |
| 2006 | 1,069,013 |
| 2007 | 1,446,112 |
| 2008 | 1,550,285 |
| 2009 | 1,616,464 |
| 2010 | 1,775,660 |
| 2011 | 2,096,330 |
| 2012 | 2,159,566 |
| 2013 | 2,268,250 |






## අලෙවිකරණය

### පිරිවැටුම් බණ්ඩනය (රු. මිලියන)

| | 2012 | % |
|---|---|---|
| වෛ.සැ.අ | 1,000.20 | 70.73 |
| රා.ඖ.සං | 412.40 | 29.17 |
| බෙදාහැරීම් | - | - |
| අපනයනය | 1.42 | 0.10 |
| එකතුව | 1,414.02 | 100.00 |

| | 2013 | % |
|---|---|---|
| වෛ.සැ.අ | 1,412.13 | 72.75 |
| රා.ඖ.සං | 9.60 | 0.49 |
| බෙදාහැරීම් | 519.34 | 26.76 |
| අපනයනය | - | - |
| එකතුව | 1,941.07 | 100.00 |




## පිරිවැටුම (2004 - 2013)

| වර්ෂය | පිරිවැටුම (රු. මිලියන) |
|---|---|
| 2004 | 363.4 |
| 2005 | 387.69 |
| 2006 | 411.19 |
| 2007 | 599.03 |
| 2008 | 890.24 |
| 2009 | 1152.68 |
| 2010 | 1379.65 |
| 2011 | 1431.65 |
| 2012 | 1414.54 |
| 2013 | 1941.18 |
| එකතුව | **3540** |

පිරිවැටුම (2004 - 2013)





## මූල්‍ය

ශුද්ධ ලාභය/අලාභය (බදු පෙර)

| වර්ෂය | ශුද්ධ ලාභය/අලාභය (රු. මිලියන) |
|---|---|
| 2004 | 10.69 |
| 2005 | 14.71 |
| 2006 | 8.08 |
| 2007 | 77.33 |
| 2008 | 120.57 |
| 2009 | 151.82 |
| 2010 | 292.31 |
| 2011 | 244.79 |
| 2012 | 117.13 |
| 2013 | 329.96 |

ශුද්ධ ලාභය/අලාභය





## පසුගිය වර්ෂ 10 තුළ වැදගත් මූල්‍ය විස්තර


(රු. 000)

| | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැටුම | 363,402 | 387,696 | 411,194 | 599,035 | 890,244 | 1,152,684 | 1,379,652 | 1,431,655 | 1,414,546 | 1,941,182 |
| අලෙවි පිරිවැය | 321,990 | 328,536 | 371,315 | 500,444 | 765,247 | 932,212 | 1,030,545 | 1,127,409 | 1,220,523 | 1,513,899 |
| දළ ලාභය | 41,412 | 59,159 | 39,878 | 98,590 | 124,997 | 220,472 | 349,107 | 304,246 | 194,023 | 427,283 |
| මෙහෙයුම් ලාභය | (11,379) | (5,398) | (20,469) | 37,141 | 63,403 | 121,423 | 266,166 | 222,469 | 85,292 | 304,176 |
| පරිපාලන වියදම | 34,949 | 39,719 | 41,939 | 53,947 | 47,162 | 60,243 | 62,869 | 72,730 | 82,390 | 106,096 |
| පොළී ආදායම | 22,005 | 20,111 | 30,282 | 41,462 | 60,904 | 33,479 | 30,752 | 23,067 | 31,843 | 25,314 |
| ශුද්ධ ලාභය | 10,692 | 9,227 | 9,159 | 32,907 | 78,372 | 98,688 | 154,538 | 193,029 | 98,561 | 209,154 |
| ස්ථාවර වත්කම් | 461,945 | 547,919 | 429,144 | 421,085 | 408,129 | 815,342 | 914,716 | 864,779 | 804,305 | 762,641 |
| කෙටිකාලීන ආයෝජන | 228,236 | 250,812 | 296,905 | 281,107 | 265,893 | 201,529 | 243,264 | 331,779 | 210,691 | 429,896 |
| මුළු වත්කම් | 1,046,765 | 1,056,501 | 1,076,470 | 1,117,587 | 1,251,026 | 1,718,461 | 1,887,430 | 1,945,347 | 2,003,258 | 2,294,113 |
| සේවක සංඛ්‍යාව | 155 | 148 | 171 | 189 | 195 | 209 | 209 | 208 | 199 | 211 |

මුළු වත්කම් = මුළු ජංගම නොවන වත්කම්වල ශුද්ධ ගිණුම්ගත වටිනාකම + මුළු ජංගම වත්කම්



**ලියාපදිංචි කාර්යාලය**

11, සර් ජෝන් කොතලාවල මාවත,
කඳවල වත්ත,
රත්මලාන.

දුරː 2635353, 2637574, 2636967 (ADSL)
පැක්ස් ː 2634771, 2626621
වි - තැපැල ːspmclanka@sltnet.lk
වෙබ් අඩවිය ːwww.spmclanka.lk

**සභාපති**
දුර ː 2623238 (සෘජු)
2635353, 2637574 (පොදු)

**සාමාන්‍යාධිකාරී**
දුර ː 3153835 (සෘජු)
2635353, 2637574 (පොදු)

**නිෂ්පාදන දෙපාර්තමේන්තුව**
නිෂ්පාදන කළමනාකරු
දුර ː 2623521 (සෘජු)

**සැළසුම් හා ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව**
**සැළසුම් හා ප්‍රසම්පාදන කළමනාකරු**
දුරː 2623298 (සෘජු)

**අලෙවි දෙපාර්තමේන්තුව**
**සහකාර අලෙවි කළමනාකාරිණී**
දුර ː 3163308 (සෘජු)

**තත්ව පාලන දෙපාර්තමේන්තුව**
**තත්ව පාලන කළමනාකරු**
දුර ː 5512945 (සෘජු)

**වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව**
**වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන කළමනාකාරිණී**
දුර ː 5512950 (සෘජු)

**මූල්‍ය දෙපාර්තමේන්තුව**
**කළමනාකරන ගණකාධිකාරී**
දුර ː 2626630 (සෘජු)

**කර්මාන්තශාලා ගණකාධිකාරී**
දුර ː 2623276 (සෘජු)

**නඩත්තු දෙපාර්තමේන්තුව**
**නඩත්තු කළමනාකරු**
දුර ː 2623246 (සෘජු)

**සහකාර නඩත්තු කළමනාකරු**
දුර ː 2623239 (සෘජු)

**අභ්‍යන්තර විගණක දෙපාර්තමේන්තුව**
**අභ්‍යන්තර විගණක**

දුර ː 2626619 (සෘජු)

**මානව සම්පත් දෙපාර්තමේන්තුව**
**සහකාර මානව සම්පත් කළමනාකාරිණී**

දුර ː 2623553 (සාජු)

**பதிவு செய்யப்பட்ட அலுவலகம்**

11,சேர் ஜோன் கொத்தலாவல மாவத்தை,
கந்தவெல எஸ்ரேட்,
இரத்மலானை

தொ.பே.: 2635353, 2637574, 2636966, 2636967(யுனுளுடு)
தொலைநகல் : 2634771 இ2626621
மின்னஞ்சல் : spmclanka@sltnet.lk
வலையமைப்பு : www.spmclanka.lk

***தலைவர்***

தொ.பே. : 2623238 ( நேரடி )
2635353, 2637574 ( பொது )
0777–892525 ( கையடக்கத் தொலைபேசி )

***பொது முகாமையாளர்***
தொ.பே : 060 –2153853 ( நேரடி)
2635353, 2637574 ( பொது )

***உற்பத்தித் திணைக்களம்***

**உற்பத்தி முகாமையாளர்**
தொ.பே : 2623521 ( நேரடி)

***திட்டமிடல், கொள்வனவு, சந்தைப்படுத்தல்***

**திட்டமிடல், கொள்வனவு முகாமையாளர்**
தொ.பே : 2623298 ( நேரடி )

**உதவி சந்தைப்படுத்தல் முகாமையாளர்**
தொ.பே :3163308( நேரடி)

***தரக் கட்டுப்பாட்டுத் திணைக்களம்***

**தரக்கட்டுப்பாட்டு முகாமையாளர்**
தொ.பே : 5512945 ( நேரடி)

***உருவாக்கல், ஆய்வு, அபிவிருத்தித் திணைக்களம்***

**உருவாக்கல், ஆய்வு, அபிவிருத்தி முகாமையாளர்**
தொ.பே : 5512950 ( நேரடி)

***நிதித்திணைக்களம்***

**முகாமைத்துவக் கணக்காளர்**
தொ.பே : 2626630 ( நேரடி)

**தொழிற்சாலைக் கணக்காளர்**
தொ.பே : 2623276 ( நேரடி )

***பராமரிப்புத் திணைக்களம்.***

**பராமரிப்பு முகாமையாளர்**
தொ.பே : 2623246 ( நேரடி )

**உதவிப் பராமரிப்பு முகாமையாளர்**
தொ.பே : 2623239 ( நேரடி)

***உள்ளகக் கணக்காய்வுத் திணைக்களம்***

**உள்ளகக் கணக்காய்வாளர்**

தொ.பே : 2626619 ( நேரடி )

***நிர்வாகத் திணைக்களம்***

**நிர்வாக அலுவலர்**
தொ.பே : 2623553 ( நேரடி)

**Registered Office**

11,Sir John Kotelawala Mawatha,
Kandawala Estate,
Rathmalana.

Tel: 2635353 , 2637574 , 2636966 , 2636967(ADSL)
Fax : 2634771,2626621
email : spmclanka@sltnet.lk
Web : www.spmclanka.lk

**Chairman**
Tel : 2623238 ( Direct )
2635353, 2637574 (General)

**General Manager**
Tel : 3153835 (Direct)
2635353, 2637574 (General)

**Production Dept.**
**Production Manager**
Tel : 2623521 (Direct)

**Planning & Procurement Dept.**
**Planning & Procurement Manager**
Tel : 2623298 (Direct)

**Marketing Dept.**
**Assistant Marketing Manager**
Tel : 3163308 (Direct)

**Quality Control Dept.**
**Quality Control Manager**
Tel : 5512945 (Direct)

**Formulation, Research & Development Dept.**
**Formulation, Research & Development Manager**
Tel : 5512950 (Direct)

**Finance Dept.**
**Management Accountant**
Tel : 2626630 (Direct)

**Factory Accountant**
Tel : 2623276 (Direct)

**Maintenance Dept.**
**Maintenance Manager**
Tel : 2623246 (Direct)

**Assistant Maintenance Manager**
Tel : 2623239 (Direct)

**Internal Audit Dept.**
**Internal Auditor**
Tel : 2626619 (Direct)

**Human Resources Dept.**
**Assistant Human Resources Manager**
Tel : 2623553 (Direct)

SPMC

www.spmclanka.lk

Design and Printed by M.D.GUNASENA AND COMPANY PRINTERS (PRIVATE) LIMITED